# සටහන

2026 ජූලි - සැප්තැම්බර්
45 වෙළුම 7 - 9 කලාපය

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය සහ විදේශ විනිමය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

මහ බැංකුව විසින් සිදු කරන වෙළඳපොළ මෙහෙයුම් කටයුතු පිළිබඳව දැනගනිමු

මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය, වෙළඳපොළ පොලී අනුපාතික සහ මහ බැංකුවේ ද්‍රවශීලතා මෙහෙයුම්

ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා රාමුවේ විකාසනය සහ එහි කාර්යභාරය

දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි කාර්යභාරය සහ එහි වත්මන් ක්‍රියාකාරීත්වය

සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් සහ මුදල් ප්‍රතිපත්තිය

ගෙවීම් හා පියවීම් පද්ධතිය තුළ බැංකුකරුවෙකු ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය




රු. 150/-

ISSN 1391-3697

ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව



# ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය සහ විදේශ විනිමය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

**එම්. ඒ. ලක්මාලි**
**ජ්‍යේෂ්ඨ සහකාර අධ්‍යක්ෂ**
**ආයෝජන කළමනාකරණ දෙපාර්තමේන්තුව**

## හැඳින්වීම

රටක සාර්ව ආර්ථික ස්ථායිතාව පවත්වාගෙන යෑමේ දී උද්ධමනය, පොලී අනුපාතික, විනිමය අනුපාතික, මුදල් සැපයුම, බැංකු පද්ධතියේ ද්‍රවශීලතාව සහ මූල්‍ය වෙළඳපොළෙහි ස්ථායිතාව වැනි සාධක ඉතා වැදගත් වේ. මෙම සාධක ජනතාවගේ දෛනික ජීවිතයට මෙන්ම සමස්ත ආර්ථික ක්‍රියාකාරිත්වයට ද සෘජු හා වක්‍ර බලපෑම් ඇති කරයි. විශේෂයෙන්, පොලී අනුපාතිකවල වෙනස්වීම් ණය ලබා ගැනීමේ පිරිවැය, ඉතිරිකිරීම්, ව්‍යාපාරික ආයෝජන සහ පාරිභෝගික වියදම් කෙරෙහි බලපාන අතර, විනිමය අනුපාතිකයේ වෙනස්වීම් ආනයන හා අපනයන, ජාත්‍යන්තර ගෙවීම් සහ ආර්ථිකයේ මිල මට්ටම් කෙරෙහි බලපෑම් ඇති කරයි.

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණ වන්නේ දේශීය මිල ස්ථායිතාව පවත්වාගෙන යෑම වන අතර, අනෙක් අරමුණ වන්නේ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව ආරක්ෂා කිරීමයි. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති තීරණ කාර්යක්ෂමව ක්‍රියාත්මක කර මූල්‍ය වෙළඳපොළ හරහා සමස්ත ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය කිරීම අත්‍යවශ්‍ය වේ. මෙහිලා මහ බැංකුවේ වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ වගකීම උසුල යි.

## මුදල් ප්‍රතිපත්ති රාමුව සහ දේශීය වෙළඳපොළ මෙහෙයුම්

ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්තිය නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් (Flexible Inflation Targeting Framework) යටතේ ක්‍රියාත්මක කෙරේ. මෙම රාමුව යටතේ මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සන්නිවේදනය කිරීම සඳහා එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (Overnight Policy Rate – OPR) ප්‍රධාන ප්‍රතිපත්ති උපකරණය ලෙස භාවිත කරනු ලබයි. මුදල් ප්‍රතිපත්ති තීරණවල අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගැනීමට නම්, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මගින් ලබාදෙන ප්‍රතිපත්ති සංඥාව පළමුව කෙටිකාලීන මුදල් වෙළඳපොළ වෙතත්, අනතුරුව බැංකු තැන්පතු හා ණය පොලී අනුපාතික, ණය සැපයුම, ආයෝජන සහ පාරිභෝගික වියදම් හරහා සමස්ත ආර්ථිකය වෙතත් සම්ප්‍රේෂණය විය යුතුය.

මෙහිදී ප්‍රධාන මෙහෙයුම් අරමුණ වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් ඉලක්කය වන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (Average Weighted Call Money Rate – AWCMR), එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සමඟ අනුරූපව පවත්වා ගැනීමයි. ඒ සඳහා බැංකු පද්ධතියේ ද්‍රවශීලතාව අඛණ්ඩව අධීක්ෂණය කිරීම, ඉදිරි ද්‍රවශීලතා තත්ත්වය ඇස්තමේන්තු කිරීම සහ ඒ අනුව අදාළ මුදල් වෙළඳපොළ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සිදු කෙරේ.

කෙටි කාලීන පොලී අනුපාතික හැසිරවීම සඳහා බැංකු පද්ධතියේ ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමට භාවිත කරන ප්‍රධාන මෙවලමක් වන්නේ විවට වෙළඳපොළ කටයුතු (Open Market Operations – OMO) ය. බැංකු පද්ධතියේ අතිරික්ත ද්‍රවශීලතාවක් පවතින විට එම අතිරික්තය අවශෝෂණය කිරීමටත්, ද්‍රවශීලතා හිඟයක් පවතින විට අවශ්‍ය ද්‍රවශීලතාව සැපයීමටත් මෙම මෙහෙයුම් යොදා ගනු ලබයි.

මෙම ප්‍රධාන මෙහෙයුම්වලට අමතරව, මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ රාමුව තුළ නිත්‍ය තැන්පතු පහසුකම (Standing Deposit Facility – SDF) සහ නිත්‍ය ණය පහසුකම (Standing Lending Facility – SLF) ද වැදගත් වේ. මෙම පහසුකම් මගින් සුදුසුකම්ලත් සහභාගිවන්නන්ට ඔවුන්ගේ කෙටිකාලීන ද්‍රවශීලතා තත්ත්වයන් කළමනාකරණය කර ගැනීමට අවස්ථාව සැලසෙන අතර, කෙටිකාලීන මුදල් වෙළඳපොළ පොලී අනුපාතිකවල අධික උච්චාවචන සීමා කිරීමට ද දායක වේ.

එමෙන්ම, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව (Statutory Reserve Requirement – SRR) මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ තවත් වැදගත් මෙවලමකි. බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් තම තැන්පතු වගකීම්වලට අදාළව නියමිත සංචිත ප්‍රමාණයක් මහ බැංකුව සමඟ පවත්වාගෙන යා යුතු අතර, මෙය බැංකු පද්ධතියේ ද්‍රවශීලතාව, ණය මැවීමේ හැකියාව සහ මුදල් සැපයුම කෙරෙහි බලපෑම් ඇති කළ හැකි බැවින් ව්‍යුහාත්මක ද්‍රවශීලතා තත්ත්වයන් කළමනාකරණය කිරීමේ දී වැදගත් වේ. අතීතයේ දී මුදල් සැපයුම කෙරෙහි බලපෑම් ඇති කිරීම සඳහා ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව පුළුල් ලෙස භාවිත කරනු ලැබුව ද, වඩාත් වෙළඳපොළ නැඹුරු මුදල් ප්‍රතිපත්ති රාමුවක් වෙත මාරුවීමත් සමඟ එය නිරන්තරයෙන් භාවිත කිරීම ක්‍රමයෙන් අඩු වී ඇති අතර, වර්තමානයේ දී ප්‍රධාන වශයෙන් ව්‍යුහාත්මක ද්‍රවශීලතා තත්ත්වයන් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවල දී භාවිත කරනු ලැබේ.

## විනිමය අනුපාතික ප්‍රතිපත්තිය සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළ මෙහෙයුම්

නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ ශ්‍රී ලංකාව නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමයක් අනුගමනය කරයි. ඒ අනුව, විනිමය අනුපාතිකය ප්‍රධාන වශයෙන් වෙළඳපොළ ඉල්ලුම හා සැපයුම අනුව තීරණය වීමට ඉඩ සලසනු ලබයි. කෙසේ වෙතත්, විනිමය අනුපාතිකයේ අධික හා අක්‍රමවත් උච්චාවචන අවම කිරීම, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි විධිමත් ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීම සහ රටේ විදේශ සංචිත තත්ත්වය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවල දී මහ බැංකුව විදේශ විනිමය වෙළඳපොළට මැදිහත් වේ.

ඒ සඳහා විදේශ විනිමය සඳහා පවතින ඉල්ලුම හා සැපයුම, අන්තර් බැංකු විදේශ විනිමය ගනුදෙනු පරිමාව, විනිමය අනුපාතිකයේ චලනයන්, වෙළඳපොළ සහභාගිවන්නන්ගේ හැසිරීම් සහ දේශීය හා ජාත්‍යන්තර ආර්ථික තත්ත්වයන් අඛණ්ඩව නිරීක්ෂණය හා විශ්ලේෂණය කෙරේ. මීට අමතරව, බලපත්‍රලාභී බැංකුවල ශුද්ධ විදේශ විනිමය අනාවරණ තත්ත්වයන් නිරීක්ෂණය කිරීම, අවශ්‍ය අවස්ථාවල දී විදේශ විනිමය මිලදී ගැනීම් හා අලෙවිය සිදු කිරීම සහ විදේශ විනිමය හුවමාරු ගනුදෙනු (FX Swaps) ක්‍රියාත්මක කිරීම ද සිදු කරනු ලබයි. විදේශ විනිමය මිලදී ගැනීම මගින් රටේ විදේශ සංචිත රැස්කර ගැනීමට ද හැකි වන අතර, විදේශ සංචිත බාහිර කම්පනවලට මුහුණ දීමේ දී සහ බාහිර අංශයේ ස්ථායිතාව පවත්වා ගැනීමේ දී වැදගත් ස්වාරක්ෂකයක් ලෙස ක්‍රියා කරයි.

විදේශ විනිමය වෙළඳපොළ මෙහෙයුම් සහ බැංකු පද්ධතියේ රුපියල් ද්‍රවශීලතාව අතර සමීප සම්බන්ධතාවක් පවතී. මහ බැංකුව විදේශ විනිමය මිලදී ගන්නා විට බැංකු පද්ධතියේ රුපියල් ද්‍රවශීලතාව ඉහළ යා හැකි අතර, විදේශ විනිමය අලෙවි කරන විට රුපියල් ද්‍රවශීලතාව අවශෝෂණය විය හැකිය. එබැවින්, විදේශ විනිමය වෙළඳපොළ මෙහෙයුම්වලින් ඇතිවන ද්‍රවශීලතා බලපෑම් අඛණ්ඩව තක්සේරු කර, අවශ්‍ය අවස්ථාවල දී ඒවාට අනුකූලව දේශීය ද්‍රවශීලතා කළමනාකරණ ක්‍රියාමාර්ග ගැනීම වැදගත් වේ. මේ අනුව, මුදල් වෙළඳපොළ සහ විදේශ විනිමය වෙළඳපොළ මෙහෙයුම් අතර නිසි සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම මුදල් ප්‍රතිපත්තිය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.

## ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය සහ ආර්ථිකයට ඇති වැදගත්කම

ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ අවසාන අරමුණ වන්නේ මහ බැංකුවේ ප්‍රතිපත්ති, විශේෂයෙන් මුදල් ප්‍රතිපත්ති තීරණවල බලපෑම මූල්‍ය වෙළඳපොළ හරහා සමස්ත ආර්ථිකය වෙත කාර්යක්ෂමව සම්ප්‍රේෂණය කිරීමයි. එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයෙහි වෙනස්වීමක බලපෑම පළමුව අන්තර් බැංකු මුදල් වෙළඳපොළ

කෙටිකාලීන පොලී අනුපාතික වෙතත්, අනතුරුව අනෙකුත් වෙළඳපොළ පොලී අනුපාතික, බැංකු තැන්පතු හා ණය පොලී අනුපාතික සහ ණය සැපයුම වෙතත් සම්ප්‍රේෂණය වේ. එමගින් කුටුම්බ සහ ව්‍යාපාරවල ණය ගැනීම්, ඉතිරිකිරීම්, ආයෝජන සහ පරිභෝජන තීරණ කෙරෙහි බලපෑම් ඇති වන අතර, අවසානයේ සමස්ත ඉල්ලුම සහ උද්ධමනය කෙරෙහි බලපෑම් ඇති වේ.

එමෙන්ම, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි විධිමත් ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීම ආනයන හා අපනයන වෙළඳාම, ජාත්‍යන්තර ගෙවීම් සහ වෙළඳපොළ විශ්වාසය සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට දායක වේ. විදේශ සංචිත ගොඩනැගීම ද බාහිර කම්පන සහ විදේශ විනිමය වෙළඳපොළෙහි අධික උච්චාවචනවලට මුහුණ දීමේ දී වැදගත් ස්වාරක්ෂකයක් ලෙස ක්‍රියා කරයි.

## සමෝධානය

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය සහ විදේශ විනිමය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම රටේ මිල ස්ථායිතාව සහ සාර්ව ආර්ථික ස්ථායිතාව පවත්වාගෙන යෑම සඳහා වැදගත් ක්‍රියාවලියකි. මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මගින් ලබාදෙන ප්‍රතිපත්ති සංඥාව මූල්‍ය වෙළඳපොළ වෙත කාර්යක්ෂමව සම්ප්‍රේෂණය කිරීම සඳහා බැංකු පද්ධතියේ ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම, විවට වෙළඳපොළ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම, නිත්‍ය පහසුකම් සැපයීම සහ මුදල් වෙළඳපොළ තත්ත්වයන් අඛණ්ඩව අධීක්ෂණය කිරීම වැදගත් වේ. ඒ සමඟම, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ඉල්ලුම හා සැපයුම සහ විනිමය අනුපාතික චලනයන් අධීක්ෂණය කිරීම, අවශ්‍ය අවස්ථාවල දී විදේශ විනිමය ගනුදෙනු සිදු කිරීම සහ විදේශ සංචිත ගොඩනැගීම ද වැදගත් වේ.

මුදල් හා විදේශ විනිමය වෙළඳපොළවල කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය, බැංකු පද්ධතියේ ද්‍රවශීලතාව නිසි ලෙස කළමනාකරණය කිරීම සහ ප්‍රතිපත්ති සංඥා මූල්‍ය වෙළඳපොළ හරහා ආර්ථිකය වෙත කාර්යක්ෂමව සම්ප්‍රේෂණය කිරීම, ශ්‍රී ලංකාවේ මිල ස්ථායිතාව සහ සාර්ව ආර්ථික ස්ථායිතාව සඳහා වැදගත් දායකත්වයක් සපයයි.

08 සංවාද සටහන

# මහ බැංකුව විසින් සිදු කරන වෙළඳපොළ මෙහෙයුම් කටයුතු පිළිබඳ ව දැනගනිමු

රටක ආර්ථික ප්‍රගතිය තීරණය කරන ඉතා වැදගත් සාධකයක් ලෙස රටේ ආර්ථික වාතාවරණය සහ එහි ක්‍රියාකාරීත්වය සැලකිය හැකිය. එහිදී අපේ රටේ ආර්ථික තීරණ ක්‍රියාත්මක කිරීමෙහි ලා විශාල වගකීමක් උසුලන ආයතනයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව හඳුනාගත හැකිය. විශේෂයෙන් එදිනෙදා ප්‍රතිපත්ති මෙහෙයුම් කටයුතුවල දී සිදු කරන ඉතා වැදගත් කාර්යභාරයක් සම්බන්ධව එනම් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, විවට වෙළඳපොළ කටයුතු පිළිබඳ ඔබ දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ආචාර්ය අනිල් පෙරේරා මහතා, එම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා ඇන්ටනට් ප්‍රනාන්දු මහත්මිය සමග සිදුකළ පළමු සාකච්ඡාව සහ ආචාර්ය අනිල් පෙරේරා මහතා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා නිලුපුලී ද සිල්වා මහත්මිය සමග සිදු කළ දෙවන සාකච්ඡාව මෙම ලිපියෙහි අන්තර්ගත වේ.

**ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණ වන්නේ ආර්ථිකයේ මිල ස්ථායිතාව අත්පත් කර ගැනීම සහ පවත්වා ගැනීමයි. මේ සඳහා අපි මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලබනවා. අධ්‍යක්ෂතුමනි, අපි දැනගන්න කැමතියි මේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම කියන්නේ මොකක් ද? ඒ වගේම මේ සඳහා භාවිත කරන ප්‍රධාන උපකරණ මොනවා ද?**

ඔබගේ ප්‍රශ්නය තුළ ප්‍රධාන කරුණු දෙකක් අන්තර්ගත වෙනවා. පළමුවැන්න අරමුණ. අනෙක් කරුණ ප්‍රතිපත්ති. සාමාන්‍යයෙන් රටකට ප්‍රධාන වශයෙන් ආර්ථික අරමුණු ගණනාවක් තිබෙනවා. ඒවා අපි සාර්ව ආර්ථික අරමුණු වශයෙන් හඳුන්වනවා. සාර්ව ආර්ථිකයක ප්‍රධාන අරමුණු ලෙස අපි හඳුනා ගන්නේ විශේෂයෙන් රටක ඉහළ ආර්ථික වෘද්ධියක් ළඟාකර ගැනීම, සංවර්ධනය අත්පත් කර ගැනීම ඒ වගේම උද්ධමන අනුපාතය, පොලී අනුපාතිකය, විනිමය අනුපාතිකය වැනි නාමික විචල්‍යයන් ස්ථාවරව තබා ගැනීම යනාදිය යි. එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රතිපත්ති අවශ්‍ය වෙනවා. ඒ වගේම සාර්ව ආර්ථික අරමුණු ක්‍රියාත්මක කර ඒවා ළඟාකර ගැනීම සඳහා රටක ප්‍රධාන ආයතන දෙකක් ක්‍රියාත්මක වෙනවා. එකක් රජය. අනෙක් ආයතනය රජයේ නියෝජිත ලෙස විශේෂයෙන් ජනතාවගේ සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීමේ නියෝජිත ලෙස මහ බැංකුව. මෙම සාර්ව ආර්ථික අරමුණු අතරින්, නූතන මහ බැංකු සියල්ලම පාහේ ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන්නේ අඩු ස්ථාවර උද්ධමන මට්ටමක් පවත්වා ගැනීමටයි. මෙය මිල ස්ථායිතාව පවත්වා ගැනීම ලෙස හඳුන්වන්න පුළුවන්. මිල ස්ථායිතාව පවත්වා ගන්න අවශ්‍ය කරන ප්‍රධානතම ප්‍රතිපත්තිය වන්නේ මුදල් ප්‍රතිපත්තියයි. මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම සාමාන්‍යයෙන් පැවරෙන්නේ ඕනෑම රටක මහ බැංකුව වෙතයි. නූතන මහ බැංකු සියල්ලම පාහේ ඔවුන්ගේ ප්‍රමුඛ අරමුණ බවට මිල ස්ථායිතාව නම් කර තිබෙනවා.

රටකට අඩු ස්ථාවර උද්ධමනයක් අවශ්‍ය වන්නේ ඇයි ද යන්න පිළිබඳව සලකා බැලුවහොත් රටක ආර්ථික වර්ධනයට අවශ්‍ය සහය ලබා දීමට වගේම රටේ ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීමට, සුබසාධනය ඉහළ නැංවීමට මිල ස්ථායිතාව අවශ්‍ය වෙනවා. ඒ සඳහා අඩු ස්ථාවර උද්ධමන පරිසරයක් අවශ්‍යයි. මහ බැංකුවක් කටයුතු කරන්නේ ඒ වෙනුවෙන්. ශ්‍රී ලංකා මහ බැංකුවේත් ප්‍රමුඛ අරමුණ වන්නේ දේශීය වශයෙන් මිල ස්ථායිතාව ළඟාකර ගැනීමයි. මිල ස්ථායිතාව ළඟාකර ගැනීම මැන බලන දර්ශකය ලෙස අපිට උද්ධමන ඉලක්කය ළඟාකර ගැනීම හඳුන්වන්න පුළුවන්. ශ්‍රී ලංකාවේ පවතින්නේ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ සියයට 5ක උද්ධමන ඉලක්කයක්. එම උද්ධමන ඉලක්කය ළඟාකර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් ප්‍රතිපත්තිය භාවිත කරනවා.

**සරලව මුදල් ප්‍රතිපත්තිය අප නිර්වචනය කරන්නේ ආර්ථිකයේ මුදලේ පිරිවැය සහ මුදල් මට්ටම, එසේත් නැතිනම් මුදල් ප්‍රමාණය හා මුදල් පිරිවැය කළමනාකරණය කිරීම, හෙවත් මෙහෙයවීමේ ක්‍රියාදාමය වශයෙන්. මෙම වගකීම මහ බැංකුවක් විසින් ඉටු කරනු ලබනවා.**

සරලව මුදල් ප්‍රතිපත්තිය අප නිර්වචනය කරන්නේ ආර්ථිකයේ මුදලේ පිරිවැය සහ මුදල් මට්ටම, එසේත් නැතිනම් මුදල් ප්‍රමාණය හා මුදල් පිරිවැය කළමනාකරණය කිරීම, හෙවත් මෙහෙයවීමේ ක්‍රියාදාමය වශයෙන්. මෙම වගකීම මහ බැංකුවක් විසින් ඉටු කරනු ලබනවා. ශ්‍රී ලංකා මහ බැංකුව ලෙස අපගේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් ආර්ථිකයේ සියලුම සාධක, පුරෝකථන වගේම උද්ධමනය ඉලක්කගත මට්ටමට අනුව හැසිරේ ද යන්න සලකා බැලීමෙන් අනතුරුව මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග තීරණය කරනු ලබනවා. මේ ක්‍රියාමාර්ග ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය වීම අවශ්‍යයයි. මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම (Monetary Policy implementation) ලෙස හඳුන්වනු ලබනවා. මෙම මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා මෙවලම් අවශ්‍ය වෙනවා. ඒවා හඳුන්වන්නේ මුදල් ප්‍රතිපත්ති උපකරණ ලෙසයි. ලෝකයේ මහ බැංකු අතරින් සෑම මහ බැංකුවකටම තිබෙන්නේ උපකරණ සීමිත ප්‍රමාණයක්. නමුත් ඒ උපකරණ ඉතාම ප්‍රබලයි. ඊට හේතුව වන්නේ මෙම උපකරණ මගින් ආර්ථිකය කෙරෙහි වැඩි බලපෑමක් කිරීමේ හැකියාවක් පැවතීමයි. සමස්තයක් ලෙස ගතහොත්, බොහෝ රටවල තිබෙන්නේ මිල පදනම් කරගත් එසේත් නැත්නම් ප්‍රමාණය පදනම් කරගත් උපකරණ. ශ්‍රී ලංකාව ගත්තොත් අපගේ මුදල් ප්‍රතිපත්ති උපකරණ කාණ්ඩ දෙකකට වෙන්කරන්න පුළුවන්. එකක් තමයි පොලී අනුපාතික, විවෘත වෙළඳපොළ කටයුතු, සංචිත අනුපාත වැනි උපකරණ වන ප්‍රතිපත්ති උපකරණ. මේවා අපි ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණ ලෙස හඳුන්වනවා. ඒ වගේම අපිට භාවිත කරන්න පුළුවන් තවත් උපකරණ වර්ගයක් ලෙස විදේශ විනිමය වෙළඳපොළ කටයුතු, ශිෂ්ට ප්‍රයෝග වගේම ණය මත පොලී අනුපාතික සීමා ආදිය හඳුන්වන්න පුළුවන්.

ඒ අනුව සරලව කිවහොත් මහ බැංකුවක අරමුණ වන මිල ස්ථායිතාව ළඟාකර ගැනීමට අවශ්‍ය කරන ප්‍රතිපත්ති ලෙස මුදල් ප්‍රතිපත්තිය හඳුනාගන්න පුළුවන්. ඒ තුළින් අප ළඟාකර ගන්නා වූ දර්ශකය තමයි අඩු සහ ස්ථාවර උද්ධමන අනුපාතිකය. ඒ සඳහා අවශ්‍ය කරන පොලී අනුපාතික ඇතුළු සියලු ප්‍රතිපත්ති ක්‍රියාවට යෙදවීම තමයි මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ලෙස හඳුනාගන්නේ.

**ද්‍රවශීලතාව යනු ආර්ථිකයේ ඉතා වැදගත් වූ සාධකයක්. මහ බැංකු ද්‍රවශීලතාව යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද? ඒ වගේම මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී මහ බැංකු ද්‍රවශීලතාව වැදගත් වන්නේ කෙසේ ද යන්න අපි ආචාර්ය ඇන්ටනට් මහත්මියගෙන් දැනගන්න කැමතියි.**

ඔව්. ද්‍රවශීලතාව කියන සංකල්පය මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී වැදගත් කාර්යභාරයක් ඉටු කරනවා. අපි ද්‍රවශීලතාව භාවිත කරන අවස්ථාව අනුව විවිධ අර්ථකථන ලබාදෙන්න පුළුවන්. සාමාන්‍යයෙන් ද්‍රවශීලතාව කියලා හඳුන්වන්නේ මූල්‍ය වත්කමක් ඉක්මනින් මුදල් බවට පත්කර ගැනීමට ඇති හැකියාවයි. නමුත් වෙළඳපොළ මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී ද්‍රවශීලතාව ඊට වෙනස් වූ සංකල්පයක්. ඔබ දන්නවා ලංකාවේ වාණිජ බැංකු 24ක් තිබෙනවා. ඒ සෑම වාණිජ බැංකුවක්ම ශ්‍රී ලංකා මහ බැංකුව තුළ ජංගම ගිණුමක් පවත්වාගෙන යනවා. එම වාණිජ බැංකු මහජනතාවගේ මුදල් රැස්කර ගත් විට එම මුදල්වලින් කොටසක් ඒ ජංගම ගිණුමේ තැන්පත් කිරීම අවශ්‍යයි. එය සංචිත අවශ්‍යතාව ලෙස හඳුන්වනවා. සමස්තයක් වශයෙන් ගත් විට එක් දිනක් ඇතුළත බැංකු 24ම මහ බැංකුවේ රඳවාගෙන ඇති මුදල්වල එකතුව අපි මහ බැංකු ද්‍රවශීලතාව ලෙස හඳුන්වනවා. නිදසුන් ලෙස සියලුම වාණිජ බැංකු විසින් මහ බැංකුවේ ජංගම ගිණුම්වල පවත්වාගෙන යනු ලබන ශේෂය රුපියල්

බිලියන 200ක් නම් ඒ දවසේ මහ බැංකු ද්‍රවශීලතාව අපි රුපියල් බිලියන 200ක් කියලා හඳුන්වනවා.

ඊළඟට අපි ද්‍රවශීලතා අතිරික්තය සහ හිඟය යන සංකල්ප දෙක පිළිබඳව අවධානය යොමු කරමු. යම්කිසි දිනක දී වාණිජ බැංකු 24ම මහ බැංකුවේ ජංගම ගිණුමේ පවත්වාගෙන යන මුදල්වල එකතුව මහ බැංකු ද්‍රවශීලතාව ලෙස හැඳින්වූවා. ඒ අනුව, එක් දිනක දී බැංකු 24ම මහ බැංකුවේ ජංගම ගිණුම්වල රුපියල් බිලියන 200ක් පවත්වාගෙන යා යුතුව තිබෙනවා කියලා හිතමු. ඇත්තටම එදින සියලු බැංකු විසින් රුපියල් බිලියන 250ක් සිය ජංගම ගිණුම්වල පවත්වාගෙන යනු ලැබුවොත්, එම අවස්ථාවේ දී අපි එය රුපියල් බිලියන 50ක ද්‍රවශීලතා අතිරික්තයක් ලෙස හඳුන්වනවා. එහි අනෙක් පැත්ත තමයි ද්‍රවශීලතා හිඟය. බැංකු විසින් එදින පවත්වා ගත යුතු සංචිත අරමුදල්වල එකතුව රුපියල් බිලියන 200ක් ව පැවතිය දී බැංකු විසින් සැබැවින්ම පවත්වාගෙන යනු ලබන්නේ රුපියල් බිලියන 150ක පමණ ශේෂයක් නම්, එම අවස්ථාවේ දී රුපියල් බිලියන 50ක ද්‍රවශීලතා හිඟයක් හඳුනාගත හැකියි.

ඊළඟට අපි බලමු මහ බැංකුව කිසිම මැදිහත් වීමකින් තොරව ද්‍රවශීලතා අතිරික්තයක් හෝ හිඟයක් පවත්වාගෙන යනවිට සිදු වන්නේ කුමක්ද කියලා. ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී මෙහෙයුම් ඉලක්කය ලෙස කටයුතු කරන්නේ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයයි. ද්‍රවශීලතා අතිරික්තයක් පවත්වාගෙන යෑම බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය මත සෘජු බලපෑම් ඇති කරන හෙයින් මහ බැංකුව විසින් සිය වෙළඳපොළ මෙහෙයුම් උපකරණ භාවිත කිරීමෙන් එම අතිරික්තය මහ බැංකුව වෙත අවශෝෂණය කරගත යුතුයි. ඒ වගේම ද්‍රවශීලතා හිඟයක් පවතින වේලාවක දී මහ බැංකුවෙන් වෙළඳපොළ වෙත ද්‍රවශීලතාව සැපයිය යුතුයි. එසේ නොකළහොත් බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය උච්චාවචනය විය හැකියි.

දැන්, මහ බැංකු ද්‍රවශීලතාව වෙනස් වන සාධක මොනවාද යන්න සලකා බලමු. මහ බැංකු ද්‍රවශීලතාව වෙනස්වන සාධක ප්‍රධාන වශයෙන් කොටස් දෙකක් යටතේ සාකච්ඡා කරන්න පුළුවන්. පළවෙනි කොටස තමයි ස්වායත්ත සාධක. ස්වායත්ත සාධක ලෙස හඳුන්වන්නේ වෙළඳපොළ මෙහෙයුම් කටයුත්තකින් තොරව මහ බැංකුවේ ශේෂ පත්‍රය වෙනස් වීම තුළින් බැංකු පද්ධතිය තුළ තිබෙන ද්‍රවශීලතාව වෙනස් වීමයි. උදාහරණ වශයෙන් ශුද්ධ විදේශ වත්කම්වල වෙනස්වීම, සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණය වෙනස් වීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යන රජයේ ගිණුම් ශේෂයන් වෙනස් වීම සලකා බලන්න පුළුවන්. උදාහරණයක් ලෙස මේ දිනවල ඔබ දන්නවා විදේශ විනිමය සංචිත ගොඩ නැංවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් විදේශ විනිමය මිලදී ගන්නවා. එවැනි මිලදී ගැනීමක දී එම ඩොලර් ප්‍රමාණයට නැත්නම් ඒ විදේශ විනිමය ප්‍රමාණයට සරිලන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රුපියල් ගෙවීමක් කළ යුතුයි. එසේ ගෙවීම් කරන්නේ අපි ඒ වාණිජ බැංකුවේ ජංගම ගිණුමට මුදල් බැර කිරීම හරහා. යම්කිසි අවස්ථාවක ශ්‍රී ලංකා මහ බැංකුවේ යම්කිසි ගනුදෙනුවක් මගින් වාණිජ බැංකුවේ ජංගම ගිණුමේ ශේෂය වැඩිවීමක් හෝ අඩු වීමක් වනවා නම් එවැනි අවස්ථාවක දී මහ බැංකු ද්‍රවශීලතාව වෙනස් වනවා. මීට අමතරව මහ බැංකුව වෙළඳපොළ මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීම තුළින් ද්‍රවශීලතාව වෙනස් වෙන්න පුළුවන්.

**නියෝජ්‍ය අධ්‍යක්ෂතුමියනි අපේ රටේ විවට වෙළඳපොළ කටයුතු සිදුවන්නේ කොහොම ද? අපි කැමතියි ඒ පිළිබඳව දැනගන්න.**

අධ්‍යක්ෂතුමා පැවසූ ආකාරයට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳපොළ මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී විවිධ මුදල් ප්‍රතිපත්ති උපකරණ උපයෝගී කර ගන්නවා. එම උපකරණ රාමුවෙහි අඩංගු එක් උපකරණයක් තමයි විවට වෙළඳපොළ කටයුතු කියන්නේ. ශ්‍රී ලංකා මහ බැංකුව, බැංකු පද්ධතියේ දෛනික ද්‍රවශීලතාව ඇස්තමේන්තුගත කරනවා. යම් අවස්ථාවක දී බැංකු පද්ධතිය තුළ ද්‍රවශීලතා අතිරික්තයක් පවතින බව දුටුවහොත් මහ බැංකුව කළ යුත්තේ මහ බැංකුව වෙත එම අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීමයි. එසේ නොමැති වුවහොත් මුදල් වෙළඳපොළ තුළ පොලී අනුපාතිකය පහළ යාමේ අවස්ථාවක් තිබෙනවා. අපි මහ බැංකුව වශයෙන් වෙළඳපොළ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම තුළින් බලාපොරොත්තු වන්නේ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සමගාමීව හෝ ඒ ආසන්න මට්ටමක තබා ගැනීමයි. ශ්‍රී ලංකා මහ බැංකුව විවට වෙළඳපොළ කටයුතු දෛනිකව ක්‍රියාත්මක නොකළහොත් ඒක්ෂණ මුදල් වෙළඳපොළ පොලී අනුපාතිකය අප ප්‍රතිපත්ති පොලී අනුපාතිකයෙන් විතැන් වනවා. එය වළක්වා ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති උපකරණයක් වන විවට වෙළඳපොළ කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලබනවා.

මීළඟට අපි බලමු විවට වෙළඳපොළ කටයුතු සඳහා සහභාගි විය හැකි ආයතන මොනවාද කියලා. ප්‍රධාන වශයෙන් වාණිජ බැංකු, සේවක අර්ථසාධක අරමුදල, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් සැලකිය හැකියි.

එමෙන්ම විවට වෙළඳපොළ කටයුතු ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව සලකා බලමු. යම් දිනක දී මහ බැංකු ද්‍රවශීලතා අතිරික්තයක් ඇති විට මහ බැංකුව විසින් තමා සතු භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර, සහභාගීත්ව ආයතන වෙත ප්‍රතිමිලදී ගැනීමේ අරමුණින් විකුණනු ලබනවා. එම ගනුදෙනු අප හඳුන්වන්නේ ප්‍රතිමිලදී ගැනීමේ වෙන්දේසියක් ලෙසයි. ප්‍රතිමිලදී ගැනීමේ/ ප්‍රතිවිකුණුම් වෙන්දේසි එක්දින, කෙටි කාලීන හෝ දිගු කාලීන පදනම මත සිදු කළ හැකියි. යම් අවස්ථාවක දී අප පද්ධතිය තුළ ද්‍රවශීලතා හිඟයක් දුටුවොත් එම අවස්ථාවේ දී, අපි ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වනවා. මීට අමතරව, පද්ධතියක් තුළ ද්‍රවශීලතා අතිරික්තයක් ස්ථිරව පවතිනවා නම් මහ බැංකුව ස්ථිර පදනම මත ද්‍රවශීලතා සපයන හෝ අවශෝෂණය කිරීමේ වෙන්දේසි සිදු කරනවා.

විවට වෙළඳපොළ කටයුතුවලට අමතරව මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට නිත්‍ය පහසුකම් උපයෝගී කරගන්නවා. දවස අවසානයේ යම් වාණිජ බැංකුවකට මුදල් අතිරික්තයක් ඇත්නම් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම යටතේ මුදල් තැන්පත් කළ හැකියි. එහි දී මහ බැංකුව විසින් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය යටතේ පොලී ගෙවීමක් සිදු කරනු ලබනවා. ඒ වගේම වාණිජ බැංකුවක් යම් අවස්ථාවක දී තම හිඟ ද්‍රවශීලතාව සඳහා නිත්‍ය ණය පහසුකම් යටතේ මහ බැංකුව වෙතින් ණය ලබාගතහොත් මහ බැංකුව විසින් එම නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යටතේ වාණිජ බැංකුවෙන් පොලී අය කිරීමක් සිදු කරනු ලබනවා.

**මහ බැංකුව අධික ලෙස මුදල් නිකුත් කර තිබේ ද යන්න තේරුම් ගැනීමට හොඳම දේ මහ බැංකුවේ මෙහෙයුම් කටයුතු දෙස බලන එක නොවේ. එම සමස්ත ක්‍රියාදාමය තුළින්ම සංචිත මුදල්වල අඩු වැඩිවීම් සිදු වුණ ආකාරය තේරුම් ගැනීමයි.**

මීට අමතරව මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී යොදාගන්නා තවත් උපකරණයක් ලෙස ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය හඳුනාගත හැකියි. මෑත කාලයේ දී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය ප්‍රසිද්ධ උපකරණයක් වශයෙන් භාවිත නොවුනත්, එමගින් ව්‍යුහාත්මක ද්‍රවශීලතාවයේ වෙනස් වීමක් තිබෙනවා නම් ශ්‍රී ලංකා මහ බැංකුවට තවමත් එම උපකරණය භාවිත කිරීමට අවස්ථාව පවතිනවා.

**සමාජය තුළ මුදල් හා මුදල් ප්‍රතිපත්ති සම්බන්ධයෙන් විවිධාකාර මත පවතිනවා. අධ්‍යක්ෂතුමනි, මේ මත පිළිබඳව ඔබේ අදහස අපි දැනගන්න කැමතියි. මීට අමතරව මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තුළින් ආර්ථිකයට සිදුවන බලපෑම මොන වගේ ද?**

සමාජයේ පවතින විවිධ මත අතරින්, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිමය කටයුතුවලට අදාළව ගත්තොත් ඇති ප්‍රධානම දුර්මතයක් වන්නේ මහ බැංකුව එදිනෙදා සල්ලි අච්චු ගහනවා නැත්නම් මුදල් නිකුත් කරනවා කියන එක. මහ බැංකුව මුදල් නිකුත් කරනවා. එසේ මුදල් නිකුත් කිරීම මැන බලන ප්‍රධාන නිර්ණායකය වන්නේ මුදල් පදනම වන සංචිත මුදල් නිකුතුවයි. එම සංචිත මුදල් අඩුවීම හෝ වැඩිවීම මත තමයි අපි වටහා ගන්නේ මහ බැංකුව විසින් ආර්ථිකයට අලුතෙන් මුදල් නිකුත් කරනවාද නැද්ද යන්න. ආචාර්ය ඇන්ටනට් මහත්මිය පැවසූ ආකාරයට, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයේ සිදුවන වෙනස්වීම් නිසා සංචිත මුදල්වල යම්කිසි වෙනස්වීමක් සිදු වනවා. ඒ වගේම සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් වෙනස් වීම නිසා සංචිත මුදල් වෙනස් වනවා. මෙම සංචිත මුදල් අඩු වැඩි වීම තුළින් ආර්ථිකයට අලුතෙන් මුදල් නිකුත් වුණාද නැද්ද යන්න අපට තේරුම් ගත හැකියි. ඇතැම් අවස්ථාවල දී මහ බැංකුව සිදුකරන මෙහෙයුම් දෙස බලා යම් ආකාරයේ වැරදි නිර්වචන ඉදිරිපත් වෙනවා අපි දකිනවා. සංචිත මුදල් වැඩි කළා ද අඩු කළා ද යන කාරණය සම්බන්ධයෙන් අපේ පාඨකයන්ට හා ප්‍රේක්ෂකයින්ට යම් අදහසක් අවශ්‍ය නම් සහ මහ බැංකුව අධික ලෙස මුදල් නිකුත් කර තිබේ ද යන්න තේරුම් ගැනීමට හොඳම දේ මහ බැංකුවේ මෙහෙයුම් කටයුතු දෙස බලන එක නොවේ. එම සමස්ත ක්‍රියාදාමය තුළින්ම සංචිත මුදල්වල අඩු වැඩිවීම් සිදු වුණ ආකාරය තේරුම් ගැනීමයි.

මුදල් ප්‍රතිපත්තිය ආර්ථිකයට බලපාන්නේ කෙසේ ද කියන කාරණය සලකා බලමු. අපි සාර්ව ආර්ථික අරමුණ වන මිල ස්ථායිතාව පවත්වා ගැනීමට මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලබනවා. ශ්‍රී ලංකාවේ නම් දේශීය මිල ස්ථායිතාව පවත්වා ගැනීම සඳහා නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව තුළ සියයට

5ක මට්ටමක උද්ධමනය පවත්වා ගැනීම අවශ්‍යයයි. ඒ සඳහා අපි කලින් සාකච්ඡා කරන ලද මුදල් ප්‍රතිපත්ති උපකරණ උපයෝගී කරගෙන මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලබනවා. මුදල් ප්‍රතිපත්ති බලපෑම අපිට ආකාර කිහිපයකින් හඳුනාගන්න පුළුවන්. ඒවා තමයි ක්ෂණිකව ඇතිවන බලපෑම. අනෙක් ආකාරය දිගු කාලීනව ආර්ථිකයට ඇතිවන බලපෑම. මහ බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාතිකය වෙනස් කළ විට ඉතාම ඉක්මනින් කෙටි කාලීනව අනෙකුත් මුදල් වෙළඳපොළ සහ ඒ ආශ්‍රිතව ඇති පොලී අනුපාතික වෙනස් වීමක් සිදු වෙනවා. උදාහරණයක් ලෙස ප්‍රතිපත්ති පොලී අනුපාතිකය වෙනස් කළ විගස මුදල් වෙළඳපොළ තිබෙන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය එනම් මෙහෙයුම් දර්ශකය වෙනස් වීමකට ලක්වනවා. එම වෙළඳපොළ අනුපාතිකය අදාළ වන්නේ බැංකු අතර තිබෙන ගනුදෙනු සඳහා. බැංකු අතර ගනුදෙනුවල පිරිවැය වෙනස් වූ විට එම බැංකු විසින් මිලකරණය කරන අනෙකුත් පොලී අනුපාතිකවලට බලපෑම් ඇති කරනු ලබනවා. එය වෙනස් වූ විට බැංකු ඔවුන්ගේ ගනුදෙනුකරුවන්ට ලබාදෙන අනුපාතික, ණය පොලී අනුපාතික ඒ වගේම තැන්පතු පොලී අනුපාතික වැනි දේවල් වෙනස් වනවා. එමෙන්ම මීට සම්බන්ධ තවත් වෙළඳපොළවල් වන භාණ්ඩාගාර බිල්පත්, බැඳුම්කර වෙළඳපොළ, වත්කම් වෙළඳපොළ මේ සියල්ලේම මිල ගණන්වලට යම්කිසි බලපෑමක් කෙටි කාලයක් තුළ දී ඇතිවනවා. මෙම තත්ත්වය මුදල් ප්‍රතිපත්තියේ පොලී අනුපාතික සම්ප්‍රේෂණය වීම ලෙස හඳුන්වනවා. මෙය තමයි අපි පළමුවැනි අදියර ලෙස සලකනු ලබන්නේ.

ඉන්පසු සිදුවන ක්‍රියාවලිය අපිට ආර්ථිකය දෙස බලා එකවර හඳුනා ගැනීමට අපහසුයි. මෙය අපි මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය ලෙස හඳුන්වනවා. මෙය හඳුනාගත නොහැකි කළු පෙට්ටියක් වගේ. ඇත්තටම සිදුවන්නේ කුමක් ද යන්න පෙනෙන්නේ නැහැ. නමුත් ආර්ථිකයේ සියලු ආර්ථික විචල්‍යයන් ප්‍රතිචාර දක්වන බව පැහැදිලියි. උදාහරණයක් ලෙස පොලී අනුපාතික වෙනස් වූ විට වත්කම් වෙළඳපොළ මිල ගණන් වෙනස් වනවා. ණය පොලී අනුපාතික වැනි දේ වෙනස් වීම නිසා ණය ඉල්ලුම් වෙනස් වෙනවා. ඒ අනුව මුදල් ප්‍රතිපත්තිය ණය මාධ්‍ය හරහා සම්ප්‍රේෂණය වනවා. ඒ වගේම පොලී අනුපාතික වෙනස් වූ විට විදේශ විනිමයට බලපෑමක් ඇති වෙනවා. විදේශ විනිමය ගලා ඒම, රටින් පිටතට යාම වගේම ආනයන අපනයන වෙළඳපොළ බලපෑමක් සිදු වීම ආදිය මගින් විනිමය අනුපාතිකය හරහා සම්ප්‍රේෂණයක් සිදු වෙනවා. ආර්ථිකය සම්බන්ධයෙන් තිබෙන දැක්ම, පුරෝකථන, අපේක්ෂා මේ සියල්ල වෙනස්වීම හරහාත් යම්කිසි බලපෑමක් ඇති වනවා. එය අපි හඳුන්වනවා අපේක්ෂණ මුල්කර ගත් මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ මාධ්‍ය ලෙස. මෙම මාධ්‍ය ඍජුව ක්‍රියාකාරී නොවන නමුත් වක්‍රාකාර බලපෑමක් ඇති කරනවා. මෙම හැම මාධ්‍යයක් හරහාම අවසානයේ බලපෑම ඇති වන්නේ ආර්ථිකයේ සමස්ත ඉල්ලුමට නැතිනම් සමාහාර ඉල්ලුමට. ආර්ථිකයේ සමාහාර ඉල්ලුම කොටස් කිහිපයකින් සමන්විත වෙනවා. පරිභෝජනය, ආයෝජනය, රජයේ වියදම්, ශුද්ධ ආනයන, වැනි අංශ තිබෙනවා. මේ එක් එක් අයිතමය බැලූ විට, විවිධ ආකාරයෙන් එනම් පොලී අනුපාතිකවලින්, වත්කම් මිල ගණන්වලින්, විනිමය අනුපාතිකයෙන් යන සියලු ආකාරයෙන් සමාහාර ඉල්ලුමට බලපෑමක් ඇති කරනවා. සමාහාර ඉල්ලුම අධික ලෙස වැඩි වුවහොත් මිල ස්ථායිතාවට යම්කිසි බලපෑමක් ඇති වෙන්න පුළුවන්. ඒ වගේම සමාහාර ඉල්ලුම සැපයුමට සාපේක්ෂව සංකෝචනය වුවහොත් එයින් ද මිල ස්ථායිතාවට බලපෑමක් ඇති විය හැකියි. ඒ නිසා සමාහාර ඉල්ලුම සහ සැපයුම කළමනාකරණය කර ගැනීම තුළින් අධික ඉල්ලුම් තත්ත්ව ඇති නොවන හෝ ඌන ඉල්ලුම් තත්ත්ව ඇති නොවන විදිහට පවත්වා ගැනීමට අපිට අවශ්‍ය වෙනවා. එසේ කළ විට අපිට අවසාන වශයෙන් මිල ස්ථායිතාව ළඟාකර ගත හැකියි. මේ අනුව විවිධ මාධ්‍ය හරහා ආර්ථිකයේ පොලී අනුපාතිකවලට, ඒ වගේම ආර්ථිකයේ ගනුදෙනුකරුවන්ගේ හැසිරීමට බලපෑමක් සිදු කරනු ලබනවා.

මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීමත් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් අවසාන වශයෙන් මිල ස්ථායිතාවත් අතර දීර්ඝ කාල පරාසයක ක්‍රියාවලියක් තිබෙනවා. ඔබ ප්‍රශ්න කළ මත සම්බන්ධයෙන් ගත්තොත් ඇතැම් අවස්ථාවල එවැනි මත ඇති වීමට එය ද හේතුවක් වනවා. උදාහරණ ලෙස මහ බැංකුව පොලී අනුපාතික වෙනස් කළ පසු ආර්ථිකය තුළ පොලී අනුපාතික ඉක්මනින් අඩු වීම හෝ වැඩිවීම සිදු වී නැහැ වගේ මත තියෙන්න පුළුවන්. ණය ඉල්ලුම වෙනස් වෙලා නැහැ වගේ මත අසන්නට ලැබෙනවා. මේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම සඳහා යම්කිසි කාල පමාවක් අවශ්‍යයි. එය එකවර සිදු වන්නේ නැහැ. එය සිදුවන්නේ අදියරයෙන් අදියර. ඇතැම් විට එය අපිට හඳුනාගත නොහැකි ආකාරයෙන් සිදු වෙන්න පුළුවන්. නමුත් අපිට එක දෙයක් ස්ථිර වශයෙන් කිව හැකියි. ආරම්භයේ දී මම ප්‍රකාශ කළ පරිදි මහ බැංකුවේ ප්‍රතිපත්ති උපකරණ ඉතාම බලසම්පන්නයි. මේ ප්‍රතිපත්ති උපකරණයක කිසියම් වෙනස් වීමක්

සිදු කළහොත් එය අනිවාර්යයෙන් ආර්ථිකයේ අපි බලාපොරොත්තු වන විචල්‍යවලට බලපෑමක් ඇති කරනවා. එය සිදුවන්නේ කිසියම් කාල පමාවකින් විය හැකියි. මෑතක දී ඔබ දකින්න ඇති මහ බැංකුව විසින් ආර්ථිකයේ සිදුවන මේ වෙනස්වීම් පිළිබඳව සලකා බලා පොලී අනුපාතික පදනම් අංක සියයකින් වැඩි කළා. එසේ වැඩි කිරීමට හේතු වුණේ ආර්ථිකයේ අස්ථාවර වීම් නිරීක්ෂණය වීම හා උද්ධමනය අපට අවශ්‍ය මට්ටමේ රඳවා ගැනීම සඳහා වූ අධිෂ්ඨානය සහ කැපවීම. එහි ප්‍රතිඵල යම්කිසි වේලාවක දක්නට හැකි වෙනවා. මේ කාලයේ දී එය සිදුවන බවට අපි පුරෝකථනය කරනවා නැත්නම් ඇස්තමේන්තු කරනවා. ඒ සම්බන්ධව ස්ථිර විශ්වාසයක් තිබෙනවා. ඒ අනුව තමයි මේ ප්‍රතිපත්ති උපකරණ ක්‍රියාත්මක කිරීම සිදු කරන්නේ.

**මහ බැංකුවේ ප්‍රතිපත්ති උපකරණ ඉතාම බලසම්පන්නයි. මේ ප්‍රතිපත්ති උපකරණයක කිසියම් වෙනස් වීමක් සිදු කළහොත් එය අනිවාර්යයෙන් ආර්ථිකයේ අපි බලාපොරොත්තු වන විචල්‍යවලට බලපෑමක් ඇති කරනවා. එය සිදුවන්නේ කිසියම් කාල පමාවකින් විය හැකියි.**

ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන් කිහිපයක් සම්බන්ධයෙන් අපි මේ වනවිට සාකච්ඡා කළා. එහිදී අපි සාකච්ඡා කළේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, විවට වෙළඳපොළ කටයුතු වගේ කරුණු සම්බන්ධයෙන්. මෙම දෙපාර්තමේන්තුවේ තවත් වැදගත් මෙහෙයුම් කාර්යභාරයක් පිළිබඳව මෙම වැඩසටහනේ දෙවන කොටසින් සාකච්ඡා කිරීමට අප බලාපොරොත්තු වෙනවා.

**අධ්‍යක්ෂතුමනි, ශ්‍රී ලංකාව තුළ පවතින විනිමය අනුපාතික ප්‍රතිපත්තිය කුමක් ද? ඒ වගේම ශ්‍රී ලංකා මහ බැංකුව ඇත්තටම මේ විනිමය අනුපාතිකය පාලනය කරනවා ද?**

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන මුදල් ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් අපි මීට පෙර සාකච්ඡා කළා. දැන් අපි විනිමය අනුපාතික ප්‍රතිපත්තිය පිළිබඳව අවධානය යොමු කරමු. මෙම ප්‍රතිපත්ති දෙකම ඉතා වැදගත් සාර්ව ආර්ථික ප්‍රතිපත්ති දෙකක්. ලෝකයේ රටවල් ගතහොත් විනිමය අනුපාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් විවිධාකාර ක්‍රමවේද භාවිත කරනවා. ඇතැම් විට රජයේ හෝ මහ බැංකුවේ හෝ මැදිහත් වීමෙන් විනිමය අනුපාතිකය තීරණය කරන්න පුළුවන්. ඇතැම් විට වෙළඳපොළ බලවේග අනුව තීරණය වීමට ඉඩහරින්න පුළුවන්. මේ කරුණු දෙක අතරමැද ස්වරූපයෙන් තීරණය වීමටත් ඉඩ තිබෙනවා. ශ්‍රී ලංකාවේ විනිමය අනුපාතික ප්‍රතිපත්තිය පිළිබඳව අවධානය යොමු කළොත්, අපි විවිධ ආකාරයේ ක්‍රමවේද භාවිත කොට තිබෙනවා. විශේෂයෙන් මුල් කාලයේ දී ශ්‍රී ලංකාව ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමයක් අනුගමනය කළා. පසුකාලීනව එයට යම්කිසි නම්‍යශීලී බවක් ලබා දුන්නා. මේ වනවිට ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියාත්මක කරන්නේ නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තියක්.

ඒ පිළිබඳ තවදුරටත් පැහැදිලි කළොත්, 2023 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ නීතිමය රාමුව වෙනස් වුණා. දැන් බලාත්මක වන්නේ 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතයි. මේ පනත තුළින් අපි දේශීය මිල ස්ථායිතාව පවත්වා ගැනීම සඳහා වන නම්‍යශීලී උද්ධමන ඉලක්කරණ රාමුව හඳුන්වා දීලා තිබෙනවා. ලෝකයේ පිළිගත් සාක්ෂි, සාධක වගේම ප්‍රායෝගික අත්දැකීම් සලකා බැලුවොත් පෙනී යන්නේ එවැනි ප්‍රතිපත්තියක් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට විනිමය අනුපාතිකයට නම්‍යශීලී වීමට ඉඩ ලබා දිය යුතු බවයි. එනම් එය වෙළඳපොළ බලවේග අනුව තීරණය වීමට ඉඩ ලබා දිය යුතුයි. ඒ අනුව නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ සියයට 5ක උද්ධමන ඉලක්කය ළඟාකර ගැනීමට අවශ්‍ය කරන සහාය සැපයීම සඳහා නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කෙරෙනවා.

විනිමය අනුපාතිකය නම්‍යශීලී වන්නේ කෙසේ ද? මෙය තීරණය වන්නේ විනිමය වෙළඳපොළෙහි ඉල්ලුම් සැපයුම් බලවේග මත. විනිමය වෙළඳපොළට විවිධ පාර්ශ්ව විසින් විනිමය සැපයීම සිදු කරනවා. අපනයනකරුවන්, විදේශ ආයෝජකයින්, රජය, සංචාරකයින් වගේම විදේශ ප්‍රේෂණ සපයන්නන් යන සියලුම අංශ වෙළඳපොළට විදේශ විනිමය සපයනවා. ඒ වගේම, ආනයනකරුවන්, ආයෝජකයන්, ණය ගෙවීම සඳහා රජය, සංචාර, අධ්‍යාපනය සහ සෞඛ්‍යයට වියදම් කිරීමට පුද්ගලයින් විසින් විනිමය ඉල්ලුම් කිරීම සිදු කරනවා. මේ ඉල්ලුම් සැපයුම් බලවේග තුලනය වූ විට මිලක් තීරණය වෙනවා. එවිට විදේශ විනිමය වෙළඳපොළෙහි ඉල්ලුම් සැපයුම් බලවේග තුලනය වීමෙන් තීරණය වන විදේශීය මුදල් ඒකකයක දේශීය මුදල් වටිනාකම තමයි අපි විනිමය අනුපාතිකය ලෙස හඳුනාගන්නේ. විදේශ විනිමය වෙළඳපොළ තුළ විනිමය අනුපාතිකය තීරණය වනවිට, එනම්

නිදසුන් ලෙස, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සලකා බැලුවහොත් ඉල්ලුම සහ සැපයුම අතර තිබෙන සමතුලනයෙන් තමයි විදේශ විනිමය අනුපාතිකය තීරණය වන්නේ. නමුත් ඇතැම් අවස්ථාවල මේ ඉල්ලුම් සැපයුම් බලවේග ස්ථාවරව සහ සමතුලිත මට්ටමක නොපවතින තත්ත්ව අපි දකිනවා. ඇතැම් විට අධික ඉල්ලුම් තත්ත්ව වගේම, අධික සැපයුම් තත්ත්ව තිබෙන්න පුළුවන්. එවැනි තත්ත්ව තුළින් ආර්ථිකයේ විදේශ විනිමය අනුපාතිකය අධික ලෙස උච්චාවචනය වෙන්න පුළුවන්. ඒ කියන්නේ අවප්‍රමාණය වගේම අතිප්‍රමාණය වෙන්න පුළුවන්. මේ දෙකම ආර්ථිකයට එතරම් යහපත් නැහැ. ආර්ථිකයේ ඕනෑම උච්චාවචනයක් අපිට දරාගත හැකි මට්ටමේ පවතිනවා නම් එය ගැටලුවක් නැහැ. නමුත් ඇතැම් උච්චාවචන ආර්ථිකයට ඔරොත්තු දෙන්නේ නැහැ. විනිමය අනුපාතිකයත් ඒ වගේ. නිදසුන් ලෙස විනිමය අනුපාතිකය ශීඝ්‍ර ලෙස අවප්‍රමාණය වුවහොත්, ආර්ථිකයේ යම් අසමතුලිතතාවක් ඇති වෙන්න පුළුවන්. එය මිල ගණන්වලට බලපානවා. ආර්ථිකයේ විනිමය ඉල්ලුම අඩු වූ විටත් අස්ථායිතාවක් ඇති වෙන්න පුළුවන්. එවැනි හේතු නිසා යම් යම් අවස්ථාවල නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමය තුළ වුණත්, මහ බැංකුව කිසියම් වූ මැදිහත් වීමක් සිදු කරනවා. එනම් වෙළඳපොළ තුළ අධික උච්චාවචන පවතින විට මහ බැංකුව මැදිහත් වෙනවා. නිදසුන් ලෙස, වෙළඳපොළ තුළ විශාල ඉල්ලුමක් පවතින විට, සැපයුමේ හිඟයක් තිබෙනවා නම් එවැනි අවස්ථාවල දී මහ බැංකුව තමන්ගේ විදේශ සංචිතවලින් විනිමය සපයලා කිසියම් හෝ මැදිහත් වීමක් සිදු කරනවා. ඒ වගේම තමයි, විදේශ විනිමය විශාල වශයෙන් රටට ලැබෙන වේලාවක විනිමය අතිරික්තයක් ඇති වෙන්න පුළුවන්. එවිට විනිමය අනුපාතිකය අතිප්‍රමාණය වෙන්න පුළුවන්. එයත් ආර්ථිකයට හානිකර විය හැකියි. එවැනි අවස්ථාවල දී මහ බැංකුවට විදේශ විනිමය මිල දී ගන්න පුළුවන්. මේ ආකාරයට විනිමය අනුපාතිකය හසුරුවන්න ලොව ඕනෑම මහ බැංකුවක් අවස්ථානුකූලව මැදිහත් වෙනවා.

ඒ වගේම අපි තේරුම්ගත යුතු තවත් වැදගත් කාරණයක් වන්නේ විනිමය අනුපාතිකය බලෙන් පාලනය කළ හැකි එකක් නොවන බවයි. ආර්ථික විද්‍යානුකූලව ගතහොත් විනිමය අනුපාතිකය යනු ආර්ථිකයේ ස්ථායීකාරකයක් (Stabilizer). විනිමය අනුපාතිකය උච්චාවචනය වනවා නම් ආර්ථිකයේ කිසියම් අසමතුලිතතාවක් පවතින බව එයින් පෙන්නුම් කරනවා. ආර්ථිකයේ විදේශීය අංශයේ යම් අසමතුලිතාවක් පවතිනවා නම් එය නිරූපණය වන දර්ශකය විනිමය අනුපාතිකය උච්චාවචනය වීමයි. ජලයේ රබර් බෝලයක් රඳවා තබාගැනීම දුෂ්කරයි වගේ කෙටි කාලයක් පමණයි විනිමය අනුපාතිකය පාලනය කරන්න පුළුවන්. ඉතා ඉක්මනින් ඒ තත්ත්වය වෙනස් වෙනවා. ඒ නිසා තමයි කෙටි කාලීන වශයෙන් සමතුලනය කිරීමට මහ බැංකුව මැදිහත් වෙන්නේ. දිගුකාලීන වශයෙන් ස්ථාවර වෙන්න නම් ආර්ථිකයේ දිගු කාලීන සාධකවල යහපත් බලපෑමක් අවශ්‍යයි. එනම් අපනයන හා විදේශ විනිමය ලැබීම් ඉහළ මට්ටමක පැවතීම, ආනයන යම්කිසි මට්ටමක කළමනාකරණය කිරීම වගේ සාධක යහපත් විය යුතුයි. මේ අනුව, විනිමය අනුපාතිකය ඉතාම වැදගත් විචල්‍යයක්. වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව වශයෙන් අප ඉතාම සමීපව අධීක්ෂණය කොට විනිමය අනුපාතිකයට නිදහසේ හැසිරීමට ඉඩ දී අවශ්‍ය වූ විට මැදිහත් වීම් සිදු කරනවා.

**ඒ වගේම අපි තේරුම්ගත යුතු තවත් වැදගත් කාරණයක් වන්නේ විනිමය අනුපාතිකය බලෙන් පාලනය කළ හැකි එකක් නොවන බවයි. ආර්ථික විද්‍යානුකූලව ගතහොත් විනිමය අනුපාතිකය යනු ආර්ථිකයේ ස්ථායීකාරකයක් (Stabilizer). විනිමය අනුපාතිකය උච්චාවචනය වනවා නම් ආර්ථිකයේ කිසියම් අසමතුලිතතාවක් පවතින බව එයින් පෙන්නුම් කරනවා.**

මෙලෙස මැදිහත් වීමේ තවත් අරමුණක් තිබෙනවා. රටේ විදේශ සංචිත ඒ කියන්නේ අපේ විදේශ වත්කම් ගොඩ නැඟීමට මහ බැංකුවට වගකීම තිබෙනවා. ඒ අනුව වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙළඳපොළ වෙත මැදිහත් වෙලා සංචිත ගොඩනැඟීම සඳහා විනිමය මිලදී ගැනීම් සිදු කරනවා. මේ වනවිට අපේ රටේ ඩොලර් බිලියන 6.5කට අධික සංචිත ප්‍රමාණයක් තිබෙනවා. එය තවදුරටත් ගොඩනැංවීම සඳහා මහ බැංකුව විදේශ විනිමය වෙළඳපොළෙන් විනිමය මිල දී ගැනීම සිදු කරනවා.

**අපි මීළඟට කැමතියි නියෝජ්‍ය අධ්‍යක්ෂතුමියගෙන් දැනගන්න විදේශ විනිමය වෙළඳපොළ තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය කුමක් ද? යන්න පිළිබඳව.**

දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය අංශ කිහිපයකින් සලකා බැලිය හැකියි. පළමුව, නම්‍යශීලී විනිමය අනුපාතික

රාමුව තුළ විදේශ විනිමය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම. දෙවනුව, යෝග්‍ය වෙළඳපොළ තත්ත්ව යටතේ විනිමය මිලදී ගැනීම හරහා දළ නිල සංචිත ගොඩනගා ගැනීම. තුන්වනුව, යම්කිසි අවස්ථාවක විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතාව අඩු නම් අත්‍යවශ්‍ය ආනයන, ණය ගෙවීම් වැනි අත්‍යවශ්‍ය කටයුතු සඳහා අදාළ බැංකුවලට හෝ අදාල පාර්ශ්වකරුවන්ට අවශ්‍ය අවස්ථාවල දී විදේශ විනිමය ද්‍රවශීලතාව සැපයීම සිදු කරනවා. විනිමය අනුපාතිකයේ ඉහළ උච්චාවචන පාලනය කිරීම සඳහා නිසියාකාර නිරීක්ෂණයකින් තොරව ශ්‍රී ලංකා මහ බැංකුවට විදේශ විනිමය වෙළඳපොළට මැදිහත් වෙන්න බැහැ. බලපත්‍රලාභී වාණිජ බැංකු, බලයලත් තැරැව්කරුවන්, ආනයනකරුවන්, අපනයනකරුවන් යන සියලු දෙනා විදේශ විනිමය වෙළඳපොළෙහි කොටස්කරුවන්. ඒ නිසා ශ්‍රී ලංකා මහ බැංකුව අන්තර් බැංකු විදේශ විනිමය වෙළඳපොළ තත්කාලීනව නිරීක්ෂණය කරනවා. ඒ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සතුව "මධ්‍යම ඒකාබද්ධ වෙළඳපොළ නිරීක්ෂකය (Central Integrated Market Monitor - CIMM) ලෙස හඳුන්වන පද්ධතියක් තිබෙනවා. ඒ මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට පුළුවන් අන්තර් බැංකු විදේශ විනිමය ගනුදෙනු තත්කාලීන ව නිරීක්ෂණය කරන්න. මේ නිරීක්ෂණය කිරීම තුළින් විනිමය අනුපාතිකයේ විචලන, වෙළඳපොළ අස්ථාවර වීම්, අසාමාන්‍ය ගනුදෙනු ආදිය තුළින් විදේශ විනිමය වෙළඳපොළෙහි අවදානම් සහගත තත්ත්වයන් තිබෙනවා නම් ඒවා නිරීක්ෂණය කොට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාළ මැදිහත් වීම් සිදුකරනවා.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදිහත් වීම් හා කාර්ය තුළින් විශේෂයෙන් අරමුණු කරන්නේ වෙළඳපොළ විශ්වාසය තහවුරු කිරීමයි. මෙහි දී ශ්‍රී ලංකා මහ බැංකුව ඉතා පුළුල්, ද්‍රවශීලතාව වැඩි, ගැඹුරු, විනිවිදභාවයෙන් යුතු වෙළඳපොළක් දියුණු කිරීමට පාර්ශ්වකරුවන් සමඟ අදාළ පියවර ගන්නවා.

**නිලුපුලි මහත්මිය, කාර්යක්ෂමව ක්‍රියාත්මක වන විදේශ විනිමය වෙළඳපොළක් රටකට වැදගත් වන්නේ ඇයි?**

දේශීය මුදල් විදේශ මුදල්වලට ඉතා පහසුවෙන් හුවමාරු කර ගැනීම සඳහා කාර්යක්ෂමව කටයුතු කරන වෙළඳපොළක් අවශ්‍ය වනවා. දේශීය මුදල් විදේශීය මුදල් බවට ඉතා කාර්යක්ෂමව හුවමාරු කර ගැනීමට අවශ්‍ය වන්නේ ඇයි? ඒ සඳහා කාරණා කිහිපයක් හේතු වනවා. ප්‍රධානම කරුණු තමයි ජාත්‍යන්තර වෙළඳාම පහසු කර ගැනීම. අපනයනකරුවන්ට අපනයන ආදායම ලැබෙන්නේ විදේශීය මුදල්වලින්. එම මුදල් දේශීය මුදල් බවට හුවමාරු කරගන්න වෙළඳපොළක් අවශ්‍යයි. ඒ සමගම ආනයනකරුවන් තමන්ගේ භාණ්ඩ හා සේවා මිලදී ගන්නේ විදේශීය මුදලින්. එහිදීත් විනිමය හුවමාරු කර ගැනීම අවශ්‍යයි. ඒ සඳහා විදේශ විනිමය වෙළඳපොළක් අවශ්‍ය වෙනවා. හොඳින් ක්‍රියාත්මක වන වෙළඳපොළක් නැත්නම් ආනයනකරුවන්ට අපනයනකරුවන්ට මේ කාර්යය ඉටු කර ගැනීමට අපහසු වෙනවා. එවිට ජාත්‍යන්තර වෙළඳ කටයුතු අකාර්යක්ෂම වෙන්න පුළුවන්. ඒ වගේම තමයි විදේශ ආයෝජන. විදේශ ආයෝජකයින් ආයෝජන රැගෙන එනු ලබන්නේ විදේශ මුදල්වලින්. ශ්‍රී ලංකාවේ ආයෝජනය කරන්න ඒවා දේශීය මුදල්වලට හුවමාරු කළ යුතුයි. මීට අමතරව, විදේශ මුදල් අවශ්‍යවන වෙනත් ව්‍යාපාර තිබෙනවා. එමෙන්ම විදේශයන්හි ආයෝජනය කිරීමට, රාජ්‍ය ණය ගෙවීමට වගේම අධ්‍යාපන කටයුතු සහ නොයෙක් අවශ්‍යතා සඳහා විදේශ විනිමය අවශ්‍ය වෙන්න පුළුවන්. ඒ සෑම අවස්ථාවකදීම කාර්යක්ෂම විදේශ විනිමය වෙළඳපොළක් අවශ්‍ය වෙනවා. සමස්තයක් ලෙස, නම්‍යශීලී විනිමය අනුපාතික රාමුව තුළ විනිමය අනුපාතිකය තීරණය කරන්න කාර්යක්ෂම වෙළඳපොළක් අවශ්‍යයයි. කාර්යක්ෂම වෙළඳපොළක් නැත්නම් විනිමය අනුපාතිකය තීරණය කිරීමේ අඩුපාඩු පවතින්න පුළුවන්.

ඒ වගේම, විනිමය අනුපාතිකය විචලනය වීමෙන් අදාළ පාර්ශ්වකරුවන්ට මතුවන අවදානම් අවම කිරීමට කාර්යක්ෂම විදේශ විනිමය වෙළඳපොළක් අවශ්‍ය වෙනවා. ද්‍රවශීලතාවෙන් සහ විනිවිදභාවයෙන් යුතු ගැඹුරු පුළුල් වෙළඳපොළකින් අවදානම් අඩු කරන්න පුළුවන්. විනිමය අනුපාතික විචලන තුළින් වන අවදානම් අඩු කරන්න මූල්‍ය ව්‍යුත්පන්න (derivatives) භාවිත කිරීමට හැකිවන සේ වෙළඳපොළ දියුණු කළ යුතුයි. ද්‍රවශීලතාවෙන් සහ විනිවිදභාවයෙන් යුතු ගැඹුරු පුළුල් වෙළඳපොළක් ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යන්න මහ බැංකුව අදාළ කටයුතු කරනවා. අවසාන වශයෙන් මිල ස්ථායිතාව සාක්ෂාත් කරගෙන ආර්ථික දියුණුව ළඟාකර ගැනීම සඳහා මෙම කාර්යක්ෂම විදේශ විනිමය වෙළඳපොළ ඉතා අත්‍යවශ්‍ය දෙයක් බවට පත්වනවා.

**විදේශ විනිමය වෙළඳපොළ ඉතා ශක්තිමත්ව පැවතිය යුතු බව ඒ සාකච්ඡා කරපු කාරණාවලින් අපිට පැහැදිලි වෙනවා. අධ්‍යක්ෂතුමනි, විදේශ විනිමය වෙළඳපොළෙහි ශක්තිමත්භාවය වෙනුවෙන් හඳුන්වා දුන් නව වැඩපිළිවෙළවල් තිබෙනවා ද?**

මූල්‍ය වෙළඳපොළ පිළිබඳව අවධානය යොමු කළොත්, ඒ තුළ මුදල් වෙළඳපොළ, භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ, බැඳුම්කර වෙළඳපොළ, පෞද්ගලික සුරැකුම්පත් වෙළඳපොළ යනාදි විවිධාකාර උපාංග තිබෙනවා. විදේශ විනිමය වෙළඳපොළ කියන්නෙත් මූල්‍ය වෙළඳපොළ තුළ තිබෙන නිශ්චිත කාර්යභාරයක් ඉටුකරන වෙළඳපොළක්. රටවල් දියුණු වන විට මේ වෙළඳපොළ ද ඒ හා සමානව දියුණු විය යුතුයි. ශ්‍රී ලංකාව පිළිබඳව අවධානය යොමු කළොත් පසුගිය කාලය තුළ විවිධ කම්පනවලට මුහුණ දීලා, අර්බුද කාල පසුකරලා මේ වනවිට ආර්ථිකය බොහෝදුරට ස්ථාවරව පවතිනවා. ඉදිරියේ දී ආර්ථිකය ස්ථාවර වර්ධන මාවතක් තුළ ගමන් කරයි කියලා බලාපොරොත්තු වනවා. එහිදී මූල්‍ය වෙළඳපොළත් දියුණු විය යුතුයි. එවිට මීට පෙර සඳහන් කළ පරිදි, ආර්ථික වර්ධනයට සරිලන ලෙස විදේශීය අංශයේ දියුණුව සඳහා විදේශ විනිමය වෙළඳපොළත් දියුණු විය යුතුයි. දියුණු වීම ලෙස අදහස් කරන්නේ වෙළඳපොළ පුළුල් සහ සක්‍රීය විය යුතු බවයි. එමෙන්ම එය කාර්යක්ෂම විය යුතුයි. ද්‍රවශීල විය යුතුයි. මේ අවශ්‍යතා හඳුනාගෙන මහ බැංකුව විශේෂයෙන් මෑත කාලයේ ක්‍රියාමාර්ග ගණනාවක් අනුගමනය කරලා තිබෙනවා.

විනිමය වෙළඳපොළ ප්‍රධාන වශයෙන් දෙයාකාරයකට වර්ගීකරණය කළ හැකියි. පළමුව පාරිභෝගිකයින් බැංකු සමඟ විදේශ විනිමය ගනුදෙනු සිදු කරනවා. එය අපි සලකන්නේ සිල්ලර වෙළඳපොළක් ලෙස. දෙවනුව, බැංකු බැංකු අතර ඊට වඩා විශාල වෙළඳපොළක් පවතිනවා. සිල්ලර මිල තීරණය වෙන්න කලින් මුලින්ම මිල තීරණය විය යුතු වන්නේ බැංකු බැංකු අතර පවතින වෙළඳපොළ තුළ. එම වෙළඳපොළෙහි මිල සොයාගැනීමේ යාන්ත්‍රණය (Price discovery mechanism) වඩාත් කාර්යක්ෂමව සිදුවිය යුතුයි. ඒ අනුව සිදුකරන නවීකරණයන් මූලික වශයෙන් පදනම් වන්නේ අන්තර් බැංකු වෙළඳපොළ තුළ ගනුදෙනු ශක්තිමත් කිරීම සහ කාර්යක්ෂම කිරීම සඳහා. එහි බලපෑම් පාරිභෝගිකයින් හට අවසාන වශයෙන් ලැබෙනවා. මේ අනුව මෑත කාලීනව ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය යොමු කළ හැකියි. සාම්ප්‍රදායිකව මිල සොයා ගැනීම සිදු කළේ කිසියම් අතරමැදිකරුවෙකුගේ සහාය ඇතිවයි. අතරමැදිකරුවන් හරහා එය සිදුකරන්න පුළුවන්. ඒ වගේම එම කටයුත්ත පොදු වේදිකාවක (Platform) සිදු කළොත් වඩාත් සක්‍රීයව, සාර්ථකව සහ පාරදෘශ්‍ය භාවයෙන් යුතුව මිල සොයාගැනීම සිදුකරන්න පුළුවන්. මෑත කාලීනව ගනු ලැබූ වැදගත්ම ක්‍රියාමාර්ගය තමයි විදේශ විනිමය අන්තර් බැංකු වෙළඳපොළෙහි ගනුදෙනු සඳහා ගැලපුම් වේදිකාවක් හඳුන්වා දී තිබීම. මෙහි දී විදේශ විනිමය සපයන්නන් සහ ඉල්ලුම්කරන්නන් තමන්ගේ ඉල්ලුම් මිල සහ සැපයුම් මිල විවෘතව ඉදිරිපත් කරනවා. එවිට හැමෝටම ඒ අවස්ථාවේ දී අන්තර් බැංකු වෙළඳපොළෙහි වෙනස්වීම් දකින්න පුළුවන්. එවිට කාර්යක්ෂමව ගනුදෙනු කටයුතු සිදු කළ හැකි වෙනවා. එය සක්‍රීය වෙළඳපොළකට අවශ්‍ය කරුණක්. එහිදී පාර්ශ්වකරුවන්ගේ දැනුම්වත්භාවය වැඩිවීම, මිල හඳුනාගත හැකිවීම, ගනුදෙනු පරිමාව වැඩිවීම වැනි හිතකර ප්‍රවණතා දැකගන්න පුළුවන්.

ඒ වගේම ඉදිරියේ දී, ආර්ථිකයට අවශ්‍ය කරන විනිමය අනුපාතිකයේ මඟපෙන්වීම සඳහා පදනම් විනිමය අනුපාතිකයක් (Reference Exchange Rate) හඳුන්වා දෙන්න බලාපොරොත්තු වෙනවා. එහිදී පදනම් විනිමය අනුපාතිකය මුල්කර ගෙන ආර්ථිකයේ විනිමය ගනුදෙනු මිලකරණය මනා විනිවිදභාවයෙන් කාර්යක්ෂමව සහ පුළුල් වෙළඳපොළක් ඇතිවන ආකාරයෙන් සිදුවෙයි කියලා අපේක්ෂා කරනවා.

විනිමය අනුපාතිකය වගේම විනිමය වෙළඳපොළත් නිරන්තරයෙන් වෙනස්වන දෙයක්. ලෝකයේ සිදුවන සෙසු සංවර්ධනයන්, ප්‍රවණතා සලකා බලා විනිමය වෙළඳපොළ පුළුල් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඉදිරියේ අපේක්ෂා කරන වැදගත්ම දෙයක් තමයි වඩා සක්‍රීය මූල්‍ය ව්‍යුත්පන්න වෙළඳපොළක් නිර්මාණය කිරීම. මනා ව්‍යුත්පන්න වෙළඳපොළක් පැවතීම දියුණු වෙළඳපොළක පවතින වැදගත් ලක්ෂණයක්. ගනුදෙනුකරුවන් සහ ආර්ථිකයේ පාර්ශ්වකරුවන්ට විවිධ මූල්‍ය උපකරණ තිබිය යුතුයි.

**මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව විදිහට මේ ක්‍රියාවලිය මහජනතාවට සන්නිවේදනය කිරීම ඉතාමත් වැදගත්. අධ්‍යක්ෂතුමනි, මෙම සන්නිවේදන ක්‍රියාවලිය වැඩි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවා ද?**

මෙම වැඩසටහනෙත් අරමුණ මහජනතාවගේ දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීම. මෙහි දී මහ බැංකුව සන්නිවේදනය ඉතාමත් වැදගත් අංගයක් විදිහට සලකනවා. මුදල් ප්‍රතිපත්තියේ විතරක් නෙවෙයි සමස්ත ප්‍රතිපත්ති ක්‍රියාවලිය තුළම සන්නිවේදනය ඉතා වැදගත්. නිසියාකාරව සන්නිවේදනය නොකළොත් සමාජය තුළ දුර්මත පැතිරෙන්න වගේම අපේක්ෂා කළ දියුණුව සාක්ෂාත් කර ගත නොහැකි වෙන්නත් පුළුවන්.

ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම වගේම ඒවා සන්නිවේදනයත් ඉතාම වැදගත් කියලා මහ බැංකුව හඳුනාගෙන තිබෙනවා. මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී, අපි විශේෂයෙන් සන්නිවේදනය කරන ක්‍රම කිහිපයක් භාවිත කරනවා. එක් මාධ්‍යයක් නම්, වෙළඳපොළ මෙහෙයුම් ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු පුවත්පත් නිවේදන හරහා නිතිපතා මහජනතාව වෙත සන්නිවේදනය කිරීම. මහ බැංකු වෙබ් අඩවියට ඇතුළු වුණොත් ඔබට දකින්න පුළුවන් ඒ තොරුතුරු ප්‍රසිද්ධ කර ඇති ආකාරය. ඒවාට අදාළ දත්ත අපි ප්‍රසිද්ධ කරනවා. ඒ වගේම සාමාන්‍යයෙන් මුදල් ප්‍රතිපත්ති විවරණය නිකුත් වනවිට ඇතැම් දත්ත සහ අනුගමනය කරන වෙළඳපොළ මෙහෙයුම්, උදාහරණ ලෙස විවට වෙළඳපොළ කටයුතු, ඒක්ෂණ මුදල් අනුපාතික, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට අනුව පවත්වා ගැනීම, ඒ වගේම විදේශ විනිමය මිලදී ගැනීම්, සංචිත රැස්කිරීම ඇතුළු සියල්ල පිළිබඳව තොරතුරු යම් ප්‍රමාණයකින් නිවේදනය කරනවා. ඒ වගේම ශ්‍රී ලංකා මහ බැංකුව වසර කිහිපයක සිට විශේෂයෙන් මුදල් වෙළඳපොළ සහ විදේශ විනිමය වෙළඳපොළ මෙහෙයුම් පිළිබඳ විශේෂ වාර්තාවක් එනම් වෙළඳපොළ මෙහෙයුම් වාර්තාවක් (Market Operations Report) එළිදක්වනවා. එය බොහෝ වෙලාවට දියුණු රටවල දකින්න තිබෙන ලක්ෂණයක්. එහිදී වෙළඳපොළ මෙහෙයුම් පිළිබඳව මහජනතාව දැනුම්වත් කරනවා. එහි නවතම වාර්තාව පසුගිය ජූලි 31වනදා නිකුත් කළා. විශේෂයෙන්ම, අපේ රටේ ශිෂ්‍යයන්ට ඔවුන්ගේ දැනුම වැඩිකරගන්න මහ බැංකුවේ වෙළඳපොළ මෙහෙයුම් වාර්තාව පරිශීලනය කරන්න පුළුවන්. භාෂා තුනෙන්ම එය ප්‍රසිද්ධියට පත්කරලා තිබෙනවා.

මෙවර සංවාද සටහන කොටස් දෙක තුළින්ම මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, විවට වෙළඳපොළ කටයුතු, විදේශ විනිමය වෙළඳපොළ ඇතුළු කරුණු රාශියක් පිළිබඳව ඔබ දැනුවත් වුණා. එමගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙළඳපළ මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන් සම්බන්ධයෙන් ඔබ මනා අවබෝධයක් ලබාගන්න ඇතැයි අපි විශ්වාස කරනවා.

**සාකච්ඡා කළේ -** **සමන්තිකා යාපා,**
**සහකාර අධ්‍යක්ෂ**
**සන්නිවේදන දෙපාර්තමේන්තුව**

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පිළිබඳව ඔබට යම් තොරතුරක් අවශ්‍යනම් මෙහි දැක්වෙන දුරකථන හෝ ඊමේල් ලිපින ඔස්සේ සම්බන්ධ වී අවශ්‍ය තොරතුරු ලබා ගන්න.**

**011-24477189**
**dmod@cbsl.lk**

මෙම සාකච්ඡාව නැරඹීමට පහත QR කේතය Scan කරන්න.

YouTube

**1 කොටස**

මෙම සාකච්ඡාව නැරඹීමට පහත QR කේතය Scan කරන්න.

YouTube

**2 කොටස**

# මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය, වෙළඳපොළ පොලී අනුපාතික සහ මහ බැංකුවේ ද්‍රවශීලතා මෙහෙයුම්




**ආර් එන් ඩී ජයසූරිය**
**ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ**
**වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව**

**එම් එම් ඒ සී මාරසිංහ**
**සහකාර අධ්‍යක්ෂ**
**වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව**


## හැඳින්වීම

ලොව පුරා මහ බැංකු බොහොමයක් සිය ප්‍රධාන අරමුණ ලෙස මිල ස්ථායිතාව ළඟා කර ගැනීම සහ පවත්වාගෙන යෑම සඳහා මුදල් ප්‍රතිපත්තිය භාවිත කරයි. ශ්‍රී ලංකා මහ බැංකුව ද (මහ බැංකුව) සිය ප්‍රධාන අරමුණ වන දේශීය මිල ස්ථායිතාව ළඟා කර ගැනීම සහ පවත්වාගෙන යෑම සඳහා මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන අතර එකී මිල ස්ථායිතාව ළඟා කර ගැනීම සඳහා මහ බැංකුව විසින් මුදලේ පිරිවැය (එනම්, පොලී අනුපාතිකය) සහ මුදල් ප්‍රමාණය (එනම්, මුදල් සැපයුම/ද්‍රවශීලතාව) මත බලපෑම් සිදු කරනු ලබන ක්‍රියාවලිය මුදල් ප්‍රතිපත්තිය ලෙස හැඳින්වේ. ශ්‍රී ලංකා මහ බැංකු පනතට අනුව, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූලව මුදල් ප්‍රතිපත්තිය සකස් කිරීම සහ එයට අනුරූප පරිදි නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සිදු කරයි. මෙම නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව හරහා රජය සහ මහ බැංකුව අතර ඇති මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම මගින් තීරණය කර ඇති, ඉලක්කගත මට්ටමේ උද්ධමනය පවත්වා ගෙන යෑම අරමුණු කෙරේ. උද්ධමන ඉලක්කය ළඟා කර ගැනීමේ අරමුණ ඇතිව අපේක්ෂිත දිශානතිය ඔස්සේ කෙටිකාලීන පොලී අනුපාතික මෙහෙයවීම සඳහා මහ බැංකුව සිය ප්‍රතිපත්ති උපකරණ භාවිත කරයි.

මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණය වන එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (Overnight Policy Rate) සහ මහ බැංකුවේ ද්‍රවශීලතාව කළමනාකරණය, ආර්ථිකයේ පවත්නා පොලී අනුපාතික මත බලපෑම් කරනු ලබන අතරම, එය ණයගැතියන් හා ණයහිමියන්ගේ හැසිරීම, ආර්ථික ක්‍රියාකාරකම් සහ අවසාන වශයෙන් උද්ධමන අනුපාතිකය මත බලපෑම් ඇති කරනු ලබයි. මීට අමතරව, විවට වෙළඳපොළ කටයුතු, නිත්‍ය පහසුකම් යන මුදල් ප්‍රතිපත්ති උපකරණ භාවිතයෙන් බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (Average Weighted Call Money Rate) අපේක්ෂිත දිශානතිය කරා මෙහෙයවීමටද මහ බැංකුව කටයුතු කරයි.

ඒ අනුව මෙම ලිපිය මගින් එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය, මහ බැංකුවේ ද්‍රවශීලතා කළමනාකරණය, විවට වෙළඳපොළ කටයුතු සහ නිත්‍ය පහසුකම් අතර පවතින සම්බන්ධතාවය සහ එමගින් මුදල් ප්‍රතිපත්තියේ

බලපෑම වෙළඳපොළ පොලී අනුපාතික සහ සමස්ත ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය වන ආකාරය පැහැදිලි කරයි.

## එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය

ලොව පුරා බොහෝ මහ බැංකු තම මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ක්‍රියාත්මක කිරීම සහ වෙළඳපොළ වෙත එම ස්ථාවරය පිළිබඳ සංඥා ලබා දීම සඳහා ප්‍රතිපත්ති පොලී අනුපාතික භාවිත කරයි. මෙම ප්‍රතිපත්ති අනුපාතිකය වෙනස් කිරීම මගින් මහ බැංකුව ආර්ථිකයේ පවත්නා කෙටිකාලීන පොලී අනුපාතික, ණය හා තැන්පතු අනුපාතික සහ අනෙකුත් මූල්‍ය තත්ත්වයන් කෙරෙහි බලපෑම් ඇති කිරීමට අපේක්ෂා කරයි. නිදසුනක් ලෙස, එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිත බැංකුව ෆෙඩරල් අරමුදල් අනුපාතිකය, එංගලන්ත මහ බැංකුව බැංකු අනුපාතිකය, ඉන්දියානු සංචිත බැංකුව ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය වැනි අනුපාතික සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සන්නිවේදනය කිරීම සහ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා භාවිත කරයි. එසේම, මෙම අනුපාතිකවල වෙනස්කම් මුදල් වෙළඳපොළේ සිට බැංකු පද්ධතිය සහ අනෙකුත් මූල්‍ය වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වී, අවසානයේ පරිභෝජනය, ආයෝජනය, ආර්ථික ක්‍රියාකාරකම් සහ උද්ධමනය කෙරෙහි බලපෑම් ඇති කිරීම අපේක්ෂා කෙරේ.

එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය යනු ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය වෙළඳපොළ වෙත සන්නිවේදනය කරනු ලබන ප්‍රධාන උපකරණය වේ. මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් ගනු ලබන තීරණ අනුව මෙම අනුපාතිකය ඉහළ නැංවීම, අඩු කිරීම හෝ නොවෙනස්ව පවත්වා ගැනීම මගින් මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම හෝ ලිහිල් කිරීම හෝ පවතින මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳ සංඥා වෙළඳපොළ වෙත ලබා දෙනු ලබයි. කෙසේ වෙතත්, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ආර්ථිකයට බලපෑම් ඇති කරනු ලබන්නේ මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණය හරහා සෙසු පොලී අනුපාතික වලට බලපෑම මගිනි. මෙම සම්ප්‍රේෂණ ක්‍රියාවලියෙහි පළමු හා වඩාත් වැදගත් අදියර වන්නේ මහ බැංකුවෙහි මෙහෙයුම් ඉලක්කය වන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ආසන්නයේ පවත්වා ගැනීමයි. ඒ සඳහා මහ බැංකුව විවට වෙළඳපොළ කටයුතු හරහා ද්‍රවශීලතා මෙහෙයුම් සිදු කරනු ලබයි.

## මහ බැංකු ද්‍රවශීලතාව සහ විවට වෙළඳපොළ කටයුතු

සහභාගිත්ව ආයතන[1] විසින් යම් නිශ්චිත දිනක දී මහ බැංකුව සමඟ පවත්වාගෙන යනු ලබන සංචිත, එනම්, සංචිත ගිණුමේ සමස්ත ශේෂය මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගනු ලබන 'මහ බැංකු ද්‍රවශීලතාව' ලෙස හඳුන්වයි. මෙහිදී මහ බැංකු ද්‍රවශීලතාව තීරණය කරන සාධක ප්‍රධාන කාණ්ඩ දෙකකට බෙදා දැක්විය හැකි අතර ඒවා නම් ස්වායත්ත සාධක සහ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ සාධක වේ. මෙහිදී ප්‍රධානම ස්වායත්ත සාධක ලෙස මහ බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් වෙනස්වීම, සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණය සහ මහ බැංකුව රජය සමග පවත්වාගෙන යනු ලබන ගිණුම්වල ශේෂ දැක්විය හැකිය. අනෙකුත් කාණ්ඩය හා සම්බන්ධ සාධක ලෙස විවට වෙළඳපොළ කටයුතු ඇතුළත් මහ බැංකු මුදල් මෙහෙයුම් කටයුතු දැක්විය හැකිය. ඒ අනුව මෙම සාධකවල බලපෑම හේතුවෙන් වෙනස්වන ද්‍රවශීලතාව කළමනාකරණය තුළින් ඒක්ෂණ මුදල් වෙළඳපොළෙහි පොලී අනුපාතිකය වන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව පවත්වා ගැනීමට හැකියාව ලැබේ. නිදසුනක් ලෙස, යම් දිනක අතිරික්ත ද්‍රවශීලතාවක් පවතී නම් ඒක්ෂණ මුදල් වෙළඳපොළෙහි අරමුදල් සඳහා වන ඉල්ලුම පහළ යෑම හේතුවෙන් බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය පහළ යෑම සිදුවන අතර, යම් දිනක ද්‍රවශීලතා හිඟයක් පවතී නම් අරමුදල් සඳහා වන ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ඉහළ යෑම සිදු විය හැකිය.

එබැවින් වෙළඳපොළ දෛනික ද්‍රවශීලතාව ඇස්තමේන්තු කිරීම ඉතා වැදගත් කාර්යභාරයක් වන අතර ඒ තුළින් මහ බැංකුවට වෙළඳපොළ සහභාගීත්ව ආයතන සමග සිදු කළ යුතු විවට වෙළඳපොළ කටයුතු තීරණය කළ හැකිය. මෙසේ මහ බැංකුවෙහි දෛනිකව සිදු කළ යුතු මුදල් මෙහෙයුම් කටයුතු තීරණය කිරීමේ වගකීම වෙළඳපොළ මෙහෙයුම් කමිටුව වෙත පැවරේ. ඒ සඳහා වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ද්‍රවශීලතා ඇස්තමේන්තු මෙන්ම මුදල් වෙළඳපොළෙහි ප්‍රවණතා පිළිබඳවද අවශ්‍ය තොරතුරු වෙළඳපොළ මෙහෙයුම් කමිටුව වෙත ලබා දෙයි. ඒ අනුව ද්‍රවශීලතාව තීරණය කරන සාධකවල වෙනස්වීම,

1 වෙළඳපොළ මෙහෙයුම් සඳහා සහභාගිත්ව ආයතන ලෙස හඳුන්වනු ලබන්නේ බලපත්‍රලාභී වාණිජ බැංකු, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් සහ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව වේ.

## වෙළඳපොළ ද්‍රවශීලතාව වෙනස්වීම සඳහා බලපාන සාධක

ද්‍රවශීලතාව පහළ යෑම

ද්‍රවශීලතාව ඉහළ යෑම

### ස්වායත්ත සාධක

**ද්‍රවශීලතාව පහළ යෑම**

- දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ මහ බැංකුව විදේශ විනිමය විකිණීම
- රජයේ විදේශ විනිමය ණය ආපසු ගෙවීම සඳහා මහ බැංකුව රජය වෙත විදේශ විනිමය විකිණීම
- බලපත්‍රලාභී වාණිජ බැංකු මහ බැංකුවෙන් ව්‍යවහාර මුදල් ආපසු ලබා ගැනීම
- මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් පරිණත වීම/ පරිණත දිනට පෙර කල් පිරීමට සැලැස්වීම
- සහභාගිත්ව ආයතන විසින් මහ බැංකුවෙන් ලබා ගත් ණය සහ අත්තිකාරම් ආපසු ගෙවීම

**ද්‍රවශීලතාව ඉහළ යෑම**

- දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් මහ බැංකුව විදේශ විනිමය මිලට ගැනීම
- රජයේ විදේශ ණය ලැබීම්වල ට අදාළ විදේශ විනිමය මහ බැංකුව විසින් මිලට ගැනීම
- බලපත්‍රලාභී වාණිජ බැංකු, මහ බැංකුවේ ව්‍යවහාර මුදල් තැන්පත් කිරීම
- මහ බැංකුව විසින් රජයේ සුරැකුම්පත් ප්‍රාථමික වෙළඳපොළෙන් මිලට ගැනීම (සුවිශේෂී අවස්ථානුගත තත්ත්වයන් හිදී[2])
- මහ බැංකුවේ ලාභ රජයට පැවරීම
- මහ බැංකුව විසින් රජයට තාවකාලික අත්තිකාරම් ලබාදීම
- මහ බැංකුවෙන් සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත ණය සහ අත්තිකාරම් ලබාදීම

### මුදල් මෙහෙයුම් සම්බන්ධ සාධක

**ද්‍රවශීලතාව පහළ යෑම**

- මහ බැංකුව රජයේ සුරැකුම්පත් ද්විතීයික වෙළඳපොළෙහි විකිණීම (ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි)
- මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් ස්ථාවර පදනම මත විකිණීම
- මහ බැංකුව විසින් මහ බැංකු සුරැකුම්පත් විකිණීම
- මහ බැංකුව විසින් සහභාගිත්ව ආයතන වෙත නිත්‍ය තැන්පතු පහසුකම් සැපයීම

**ද්‍රවශීලතාව ඉහළ යෑම**

- මහ බැංකුව විසින් ද්විතීයික වෙළඳපොළෙන් රජයේ සුරැකුම්පත් මිලට ගැනීම (ප්‍රතිවිකුණුම් වෙන්දේසි)
- මහ බැංකුව විසින් රජයේ සුරැකුම්පත් ස්ථාවර පදනම මත මිලට ගැනීම
- මහ බැංකු සුරැකුම්පත් පරිණත වීම
- මහ බැංකුව විසින් සහභාගිත්ව ආයතන වෙත නිත්‍ය ණය පහසුකම් සැපයීම

---

2 ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 86(5) වගන්තිය අනුව, මහජන ආරක්ෂාව සහ මහජන සාමය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවක් හෝ රජයට වෙළඳපොළ මූල්‍යකරණය වෙත ප්‍රවේශ වීමට සැලකිය යුතු හා දැඩි බාධාවක් ඇති කරන ගෝලීය සෞඛ්‍ය, හදිසි තත්ත්වයක් වැනි අසාමාන්‍ය අවස්ථාවල දී පමණක්, මහ බැංකුවට ප්‍රාථමික වෙළඳපොළෙන් රජයේ සුරැකුම්පත් මිලදී ගැනීමට අවසර ඇත.

බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයෙහි යෝග්‍ය මට්ටම හා දිශානතිය, මුදල් වෙළඳපොළට සැපයිය යුතු සංඥා ආදී කරුණු සැලකිල්ලට ගනිමින් අදාළ දිනයේ දී සිදු කරන විවට වෙළඳපොළ කටයුතු පිළිබඳව තීරණය කරයි.

මහ බැංකුව විසින් විවට වෙළඳපොළ කටයුතු පවත්වාගෙන යනු ලබන්නේ බැංකු පද්ධතියේ ද්‍රවශීලතා තත්ත්වය කළමනාකරණය කරමින්, අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළේ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට අනුකූලව පවත්වා ගැනීම සඳහාය. ඒ අනුව විවට වෙළඳපොළ කටයුතු හරහා වෙළඳපොළ අතිරික්ත ද්‍රවශීලතාවක් පවතී නම් ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීමට හෝ ද්‍රවශීලතා හිඟයක් පවතී නම් ද්‍රවශීලතාව සැපයීම සිදු කරනු ලබයි. රජයේ සුරැකුම්පත් ස්ථාවර හෝ තාවකාලික පදනම මත මිල දී ගැනීමේ/විකිණීමේ වෙන්දේසි හරහා විවට වෙළඳපොළ කටයුතු පවත්වනු ලැබේ. නිදසුනක් ලෙස යම් දිනක දී මහ බැංකු ද්‍රවශීලතා පුරෝකථනයට අනුව අතිරික්ත ද්‍රවශීලතාවක් පවතී නම් ප්‍රති මිලදීගැනුම් (Repurchase) වෙන්දේසි හරහා රජයේ සුරැකුම්පත් සහභාගීත්ව ආයතන වෙත අලෙවි කිරීම මගින් එම අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කරන අතර එකඟ වූ ඉදිරි දිනක දී එම සුරැකුම්පත් ආපසු ලබා ගැනීම සිදු කෙරේ. ඒ අනුව ප්‍රති මිලදීගැනුම් වෙන්දේසි එක්දින පදනමින්, කෙටිකාලීන පදනමින් (දින 07ක් දක්වා) සහ දිගුකාලීන පදනමින් (දින 08 සිට දින 90 දක්වා) පවත්වනු ලැබේ. එසේම යම් දිනක දී මහ බැංකු ද්‍රවශීලතා පුරෝකථනයට අනුව ද්‍රවශීලතා හිඟයක් පවතී නම් ප්‍රති විකුණුම් (Reverse Repurchase) වෙන්දේසි හරහා සහභාගීත්ව ආයතන වෙතින් රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම මගින් වෙළඳපොළට ද්‍රවශීලතාව සපයනු ලබන අතර, එකඟ වූ ඉදිරි දිනක දී එම සුරැකුම්පත් ආපසු ලබා දීම සිදු කෙරේ. ඒ අනුව ප්‍රති විකුණුම් වෙන්දේසි ද එක්දින පදනමින්, කෙටිකාලීන පදනමින් (දින 07ක් දක්වා) සහ දිගුකාලීන පදනමින් (දින 08 සිට දින 90 දක්වා) පවත්වනු ලැබේ. මෙහි දී මහ බැංකුවේ අරමුණ වන්නේ ද්‍රවශීලතාවයෙහි වෙනස්වීම් හේතුවෙන් මුදල් වෙළඳපොළ පොලී අනුපාතිකවල අනවශ්‍ය උච්චාවචනයන් ඇතිවීම වැළැක්වීම, මුදල් ප්‍රතිපත්ති තීරණ කාර්යක්ෂමව ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය කිරීම සහ අවසානයේ මිල ස්ථායිතාව පවත්වා ගැනීමයි.

මීට අමතරව, මහ බැංකුව විසින් ස්ථිර පදනම මත වන වෙන්දේසි ද පවත්වනු ලබන අතර, ද්‍රවශීලතාව ස්ථිර පදනමින් සැපයීම සඳහා ද්විතීයික වෙළඳපොළෙන් භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගන්නා අතර, ද්‍රවශීලතාව ස්ථිර පදනමින් අවශෝෂණය කිරීම සඳහා ද්විතීයික වෙළඳපොළෙහි භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර අලෙවි කිරීම ද සිදු කරයි.

## විවට වෙළඳපොළ කටයුතු



මීට අමතරව, දේශීය මුදල් වෙළඳපොළ සුමටව ක්‍රියාත්මක වීම සහ ද්‍රවශීලතා හිඟයක් පවතින අවස්ථාවල දී මුදල් වෙළඳපොළ පොලී අනුපාතික මත ඇති විය හැකි අනවශ්‍ය පීඩනය ඉවත් කිරීම සඳහා මහ බැංකුව විසින් බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් හට ද්‍රවශීලතා ආධාරක පහසුකම ලබාදීම ද විවට වෙළඳපොළ කටයුතු යටතේ සිදු කෙරේ.

විවට වෙළඳපොළ කටයුතු මුදල් වෙළඳපොළේ දෛනික අරමුදල් අවශ්‍යතා සපුරාලීමට පමණක් සීමා නොවී, මුදල් වෙළඳපොළේ ස්ථාවරත්වය පවත්වා ගැනීම, කෙටි කාලීන පොලී අනුපාතිකවල අනවශ්‍ය උච්චාවචනයන් අවම කිරීම සහ මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ද දායක වේ.

අධික විචලනයන් අවම කරනු ලබයි. නිදසුනක් ලෙස, විවට වෙළඳපොළ මෙන්දේසි කටයුතු හරහා හෝ මුදල් වෙළඳපොළ තුළ ගනුදෙනු කිරීමෙන් පසුව තවදුරටත් සහභාගිත්ව ආයතනයක් සතුව අතිරික්ත අරමුදල් පවතී නම් එම අරමුදල් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය යටතේ දිනය අවසානයේ නිත්‍ය තැන්පතු පහසුකම යටතේ තැන්පත් කිරීමටත්, අරමුදල් හිඟයක් පවතින අවස්ථාවක සහභාගිත්ව ආයතනයකට ද්‍රවශීලතාව අවශ්‍ය නම්, නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යටතේ දිනය අවසානයේ නිත්‍ය ණය පහසුකම හරහා අරමුදල් ණයට ලබා ගැනීමටත් හැකියාව පවතී. එබැවින්, මෙම නිත්‍ය පහසුකම් මුදල් වෙළඳපොළේ පොලී අනුපාතිකයන් සඳහා ස්වභාවික සීමාවක් නිර්මාණය කරමින් මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති සංඥාව කාර්යක්ෂමව වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීමට සහාය වේ.

## ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් කටයුතු

| ක්‍රමවේදය | අරමුණ | උපකරණ |
|---|---|---|
| 01 විවට වෙළෙඳපොළ කටයුතු | වෙළෙඳපොළ ද්‍රවශීලතාව කළමනාකරණය කරමින් ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ පොලී අනුපාතිකය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව පවත්වා ගැනීම | • ප්‍රතිමිලදී ගැනුම් (Repo) වෙන්දේසි<br>• ප්‍රතිවිකුණුම් (Reverse Repo) වෙන්දේසි<br>• ස්ථිර පදනම මත රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම<br>• ස්ථිර පදනම මත රජයේ සුරැකුම්පත් විකිණීම<br>• ප්‍රාථමික වෙළඳුන් සඳහා ද්‍රවශීලතා ආධාරක පහසුකම |
| 02 නිත්‍ය පහසුකම් | දෛනික ගනුදෙනු සහ අනපේක්ෂිත අරමුදල් අවශ්‍යතා හේතුවෙන් ඇතිවන තාවකාලික ද්‍රවශීලතා අතිරික්ත හෝ හිඟ තත්ත්වයන් සඳහා පහසුකම් සැපයීම තුළින් වෙළෙඳපොළ පොලී අනුපාතිකවල අධික විචලනයන් වැළැක්වීම | • නිත්‍ය තැන්පතු පහසුකම<br>• නිත්‍ය ණය පහසුකම |
| 03 විශේෂ ද්‍රවශීලතා පහසුකම් | සුවිශේෂී අවස්ථානුගත තත්ත්වයන්හිදී මුදල් වෙළෙඳපොළේ සුමට ක්‍රියාකාරිත්වයට සහාය වීම සඳහා විශේෂ ද්‍රවශීලතා පහසුකම් සැපයීම | • සුවිශේෂී අවස්ථා වලදී සපයනු ලබන ණය සහ අත්තිකාරම් (Emergency Loans and Advances)<br>• අනෙකුත් ණය පහසුකම් |

විවට වෙළඳපොළ කටයුතු මගින් බැංකු පද්ධතියේ සමස්ත ද්‍රවශීලතා තත්ත්වය කළමනාකරණය කළ ද, දෛනික ගනුදෙනු සහ අනපේක්ෂිත අරමුදල් අවශ්‍යතා හේතුවෙන් ඇතැම් සහභාගීත්ව ආයතනවලට තාවකාලික ද්‍රවශීලතා හිඟයන් හෝ අතිරික්තයන් ඇතිවිය හැකිය. සහභාගීත්ව ආයතනවල මෙම දෛනික ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීම සඳහා නිත්‍ය පහසුකම් (Standing Facilities) භාවිත කරන අතර, එමගින් මුදල් වෙළඳපොළේ පොලී අනුපාතිකවල

## ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණය: ක්‍රියාකාරිත්වය, වැදගත්කම සහ ආර්ථිකයට ඇති බලපෑම

මහ බැංකුවක් ඊට අදාළ, ප්‍රතිපත්ති පොලී අනුපාතිකය වෙනස් කිරීම පමණක්ම ප්‍රමාණවත් නොවන අතර, එම තීරණ මුදල් වෙළඳපොළ, බැංකු පද්ධතිය, ව්‍යාපාරික අංශය සහ සාමාන්‍ය ජනතාව වෙත සම්ප්‍රේෂණය වී අවසානයේ, ආර්ථික වර්ධනය, පරිභෝජනය, ආයෝජනය සහ උද්ධමනය මත බලපෑම් ඇති කළ

යුතුය. මෙම සම්පූර්ණ ක්‍රියාවලිය මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණය ලෙස හැඳින්වේ. සරලව පැවසුවහොත්, මහ බැංකුව ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ ආර්ථිකයේ විවිධ අංශ හරහා ගලා ගොස්, අවසානයේ මහ බැංකුවේ ප්‍රධාන අරමුණ වන දේශීය මිල ස්ථායිතාව ඇතිකරගැනීමේ සමස්ත ක්‍රියාවලිය මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණය ලෙස හැඳින්වේ. මෙම ක්‍රියාවලිය නිසි ලෙස ක්‍රියාත්මක වන්නේ නම්, මහ බැංකුවේ ප්‍රතිපත්ති තීරණ කාර්යක්ෂමව මුදල් වෙළඳපොළට සහ ආර්ථිකයට සම්ප්‍රේෂණය වන අතර, එමගින් අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කරගත හැකිය.

මහ බැංකුවක මෙම ප්‍රතිපත්ති තීරණ වෙළඳපොළට හා සාමාන්‍ය ජනතාවට බලපාන ආකාරය ප්‍රධාන පියවර දෙකක් යටතේ සලකා බැලිය හැක. මුල් අදියරේ දී මහ බැංකුව තම එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය වෙනස් කරන අතර ඒ අනුව, තම විවට වෙළඳපොළ කටයුතු හරහා බැංකු පද්ධතියේ පවත්නා ද්‍රවශීලතාව කළමනාකරණය කරනු ලැබේ. එනම්, ප්‍රතිමිලදී ගැනුම් හෝ ප්‍රතිවිකුණුම් වෙන්දේසි හරහා අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය හෝ හිඟ ද්‍රවශීලතාව සැපයීම සිදු කරනු ලබන අතර එය බැංකු අතර මුදල් හුවමාරු ගනුදෙනු සිදුවන ඒක්ෂණ මුදල් වෙළඳපොළ තුල බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයට බලපෑම් ඇති කිරීම අපේක්ෂා කෙරේ. ඉන් අනතුරුව, එහි බලපෑම කෙටි හා දිගු කාලීන පොලී අනුපාතිකයන් වෙත සම්ප්‍රේෂණය වන අතර, භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරවල පොලී අනුපාතික මෙන්ම බැංකු තැන්පතු හා ණය පොලී අනුපාතික ද ක්‍රමිකව ගැලපීම සිදුවේ.

## මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණය

දෙවන අදියර හරහා මෙම පොලී අනුපාතික වෙනස්වීම ආර්ථිකයේ ආයෝජන, පරිභෝජන, ඉතිරි කිරීම සහ ණය ඉල්ලුම ආදී විවිධ ආර්ථික පාර්ශ්වකරුවන්ගේ ආයෝජන හා වියදම් පිළිබඳ තීරණ මත බලපෑම් ඇති කිරීම අපේක්ෂා කෙරේ. අවසානයේ දී මෙය ආර්ථික වර්ධනය හා උද්ධමනය මත බලපෑම් ඇති කරමින් අපේක්ෂිත දේශීය මිල ස්ථායිතාව කරා ළඟා වීම අපේක්ෂා කරනු ලබයි. මෙහි දී මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය විවිධ ප්‍රවේශ ඔස්සේ සිදුවන අතර එය ප්‍රධාන වශයෙන්ම පොලී අනුපාතික ප්‍රවේශය, ණය ප්‍රවේශය, වත්කම් මිල ප්‍රවේශය සහ විදේශ විනිමය අනුපාතික ප්‍රවේශය හරහා සිදු වේ. උදාහරණයක් ලෙස මහ බැංකුව පොලී අනුපාතික ඉහළ දමන අවස්ථාවක් සැලකූ විට (එනම්, උද්ධමනය ඉහළ යන අවස්ථාවක්) එහි ප්‍රධාන අරමුණ වන්නේ පොලී අනුපාතික ඉහළ නැංවීම මගින් ණය ගැනීම හා මුදල් සැපයුම සීමා කර, එමගින් අධික පරිභෝජනය සහ සමස්ත ඉල්ලුම පාලනය කිරීමයි. මේ අවස්ථාවේ විවට වෙළඳපොළ කටයුතු සලකා බැලීමේ දී වෙළඳපොළ ද්‍රවශීලතා



අතිරික්තයක් පවතී නම් මහ බැංකුව අතිරික්ත මුදල් අවශෝෂණය කරනු ලැබේ. එවිට එය බැංකු අතර කෙටි කාලීන අරමුදල් හුවමාරු වන ඒක්ෂණ මුදල් වෙළඳපොළ පොලී අනුපාතික මත බලපෑම් ඇති කරනු ලබන අතර, එය ආර්ථිකයේ අනෙකුත් පොලී අනුපාතික මත බලපෑම් ඇතිවී අවසාන වශයෙන් ආර්ථිකයේ උද්ධමනය අපේක්ෂිත මට්ටම ළඟා කරගැනීමට මහ බැංකුව අපේක්ෂා කරයි.

කාර්යක්ෂම මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණයක් පැවතීම මගින් මහ බැංකුවේ ප්‍රතිපත්ති තීරණ වෙළඳපොළට වේගයෙන් සහ නිවැරදිව සම්ප්‍රේෂණය වන අතර, එය මිල ස්ථායිතාව පවත්වාගෙන යමින්, තිරසර ආර්ථික වර්ධනයට සහාය දීමට සහ ජනතාවගේ ආර්ථික යහපැවැත්ම වැඩිදියුණු කිරීමට එය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණය සාර්ථක වීම සඳහා අවශ්‍ය මූලික අවශ්‍යතා කිහිපයක් පවතී. ඒ අතර, විශ්වසනීය මුදල් ප්‍රතිපත්ති ක්‍රියාවලියක් පැවතීම, කාර්යක්ෂම මුදල් වෙළඳපොළක් පැවතීම, ශක්තිමත් බැංකු පද්ධතියක් පැවතීම, ප්‍රමාණවත් ද්‍රවශීලතා කළමනාකරණ මෙහෙයුම් පැවතිය යුතු වීම, ප්‍රතිපත්ති පාරදෘශ්‍ය බව යනා දී කරුණු පැවතීම අත්‍යවශ්‍ය වේ. නිසි මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණයක් නොමැති අවස්ථාවක දී, මහ බැංකුව විසින් ප්‍රතිපත්ති පොලී අනුපාතික වෙනස් කළ ද එම වෙනස්කම් වෙළඳපොළ පොලී අනුපාතික වෙත කාර්යක්ෂමව සම්ප්‍රේෂණය නොවීම හෝ එයට දීර්ඝ කාලයක් ගත වීම හේතුවෙන්, මුදල් ප්‍රතිපත්තියෙන් අපේක්ෂිත මිල ස්ථාවරත්ව අරමුණු සාක්ෂාත් කර ගැනීම අභියෝගාත්මක විය හැකිය.

එවැනි නිසි මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණයට අභියෝග ඇතිවන අවස්ථාවන් ද දක්නට ලැබේ. බැංකු අතර පවත්නා ද්‍රවශීලතාවයේ අසමාන ව්‍යාප්තිය, රාජ්‍ය මූල්‍ය තත්ත්වයන්, රජයේ ණය ගැනීම්, බාහිර අංශයේ පීඩන, මූල්‍ය වෙළෙඳපොළේ වර්ධන මට්ටම, ගෝලීය ආර්ථික අවිනිශ්චිතතා සහ ස්වාභාවික ආපදා හෝ වසංගත තත්ත්වයන් වැනි සාධක මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණයේ ඵලදායීතාවයට බාධා ඇති කළ හැකිය. එබැවින්, නිසි ලෙස ක්‍රියාත්මක වන මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණයක් මිල ස්ථාවරත්වය පවත්වාගෙන යාම සහ මුදල් ප්‍රතිපත්ති අරමුණු කාර්යක්ෂමව සාක්ෂාත් කර ගැනීම සඳහා වැදගත් වේ.

**සමෝධානය**

සමස්තයක් ලෙස ගත්කළ, මහ බැංකුව සිය ප්‍රධාන අරමුණ වන දේශීය මිල ස්ථායිතාව පවත්වාගෙන යාම සඳහා මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන අතර එහිදී වෙළඳපොළ පොලී අනුපාතික හා මුදල් සැපයුම පාලනය කිරීමට විවිධ උපකරණ භාවිත කරනු ලබයි. ඒ අතර එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය, විවට වෙළඳපොළ කටයුතු හා නිත්‍ය පහසුකම ප්‍රධාන තැනක් ගනී. එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මගින් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳ සංඥා ලබා දෙන අතර, විවට වෙළඳපොළ කටයුතු හරහා ද්‍රවශීලතා කළමනාකරණය මගින් ඒක්ෂණ මුදල් වෙළඳපොළ පොලී අනුපාතිකය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව පවත්වා ගැනීමට සහාය වේ. එම බලපෑම අනෙකුත් වෙළඳපොළ පොලී අනුපාතික වෙත සම්ප්‍රේෂණය වීම තුළින් පරිභෝජනය, ආයෝජනය, ඉතිරිකිරීම් සහ ණය ඉල්ලුම වැනි ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් ඇති කරමින් අවසානයේ උද්ධමනය මත බලපෑමක් ඇති කරනු ලබයි. ස්ථාවර හා කාර්යක්ෂම මුදල් වෙළඳපොළක් මෙන්ම ඵලදායී ද්‍රවශීලතා කළමනාකරණයක් පැවතීම මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය සඵලදායීව ක්‍රියාත්මක වීමට වැදගත් වන අතර, එමගින් දේශීය මිල ස්ථායිතා අරමුණ පවත්වා ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති තීරණ කාර්යක්ෂමව ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය කිරීමට හැකියාව ලැබේ.

**මූලාශ්‍ර**

Amarasekara, C. (2008). The impact of monetary policy on economic growth and inflation in Sri Lanka. Central Bank of Sri Lanka Staff Studies, No. 38.

Central Bank of Sri Lanka. (2023). Monetary policy implementation in Sri Lanka. https://www.cbsl.gov.lk/

Central Bank of Sri Lanka. (2022). Annual Report - 2022. https://www.cbsl.gov.lk/

Perera, A. (2013). Monetary transmission mechanism in Sri Lanka: A comprehensive assessment with new evidence. Central Bank of Sri Lanka Staff Studies, No. 43.



# ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා රාමුවේ විකාසනය සහ එහි කාර්යභාරය


**එස්. එච්. එස්. දිල්රුක්ෂි**
**ජ්‍යේෂ්ඨ සහකාර අධ්‍යක්ෂ**
**වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව**


## හැඳින්වීම

බොහෝ මහ බැංකු, වාණිජ බැංකුවල තැන්පතු වගකීම්වලින් නිශ්චිත ප්‍රතිශතයක් ව්‍යවස්ථාපිත සංචිත ලෙස මහ බැංකුවේ පවත්වාගෙන යෑම නියම කරයි. මහ බැංකුවේ සංචිත පවත්වා ගැනීම වාණිජ බැංකුවල ණය මැවීමේ හැකියාවට හා මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව කෙරෙහි මෙන්ම, වෙළඳපොළ පොලී අනුපාතික කෙරෙහි ද බලපායි.

ඒ අනුව, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව (Statutory Reserve Requirement - SRR) යනු මහ බැංකු විසින් දීර්ඝ කාලයක් තිස්සේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වයට සහාය වීම සඳහා භාවිත කරනු ලබන වැදගත් මෙහෙයුම් උපකරණයක් වේ. කෙසේ නමුත්, ගෙවීම් පද්ධති සහ මුදල් ප්‍රතිපත්ති රාමු සහ මූල්‍ය වෙළඳපොළ කාලයත් සමග විකාසනය වී ඇති බැවින්, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවේ අරමුණු සහ භාවිතය ද ඒ අනුව සැලකිය යුතු ලෙස වෙනස් වී තිබේ.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සලකා බැලීමේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවීමේ සිටම, එනම් 1950 වසරේ දී පටන්ම බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ක්‍රියාත්මක වී ඇත. මෑත වසරවල දී ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳපොළ, ගෙවීම් හා පියවීම් පද්ධති, බැංකුවල ද්‍රවශීලතා කළමනාකරණ ක්‍රමවේද සහ මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් රාමුව සැලකිය යුතු ලෙස දියුණු වී ඇති පසුබිමක ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා රාමුව වර්තමාන මෙහෙයුම් අවශ්‍යතාවන්ට සහ ජාත්‍යන්තර මනා පරිචයන්ට ගැළපෙන පරිදි තවදුරටත් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව මතු වී ඇත.

මෙම ලිපියේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා රාමුව, එහි විකාසනය සහ වර්තමාන ක්‍රියාකාරීත්වය, එය ශක්තිමත් කිරීම සඳහා මෑතක දී ක්‍රියාත්මක කරන ලද නවීකරණ සහ එමගින් මුදල් ප්‍රතිපත්තිය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහ බැංකු පද්ධතියේ ද්‍රවශීලතා කළමනාකරණය තවදුරටත් වැඩිදියුණු වන ආකාරය පැහැදිලි කිරීමයි.

## ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව සහ එහි අරමුණු

ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව යනු, බැංකු විසින් සිය තැන්පතු වගකීම්වලින් නිශ්චිත ප්‍රතිශතයක් මහ බැංකුවේ සංචිත ගිණුමේ (Reserve Account) පවත්වාගෙන යා යුතු බවට පනවා ඇති නෛතික අවශ්‍යතාවයකි. අතීතයේ දී ව්‍යවස්ථාපිත සංචිත

අවශ්‍යතාව ප්‍රධාන වශයෙන් මුදල් ප්‍රතිපත්ති අරමුණු සාක්ෂාත් කර ගැනීම, ණය වර්ධනයට බලපෑම් කිරීම සහ ඇතැම් රටවල ප්‍රාග්ධන ප්‍රවාහවල බලපෑම් කළමනාකරණය කිරීම සඳහා ද භාවිත කර ඇත (Montoro and Moreno, 2011). එමෙන්ම, ක්ෂුද්‍ර විචක්ෂණ නියාමන අරමුණු සඳහා භාවිත කරන ලද අතර, බැංකුවල ද්‍රවශීලතා කළමනාකරණය සඳහා ආරක්ෂක ක්‍රමවේදයක් ලෙස ද යොදාගෙන ඇත (Gray, 2011). තවද, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ව්‍යුහාත්මක ද්‍රවශීලතා කළමනාකරණය සඳහා ද භාවිත වන අතර, ඒ මගින් මහ බැංකුවට උද්ධමනය, විනිමය අනුපාතික සහ පොලී අනුපාතික මත පීඩනය අවම කිරීම සඳහා බැංකු පද්ධතියේ ද්‍රවශීලතාවට බලපෑම් කිරීමට අවස්ථාව සැලසේ. මහ බැංකුවල මුදල් ප්‍රතිපත්ති අරමුණු සහ මූල්‍ය පද්ධතිවල විවිධත්වය අනුව, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය, අතිරික්ත සංචිත සඳහා ගෙවනු ලබන පොලිය, සංචිත අවශ්‍යතාවට යටත් වන වගකීම් සහ සංචිත අවශ්‍යතාව සඳහා සලකා බලනු ලබන මුදල් ප්‍රමාණය වැනි මෙහෙයුම් විධිවිධාන රටින් රටට වෙනස් වේ (Lepers, 2018).

### ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව (SRR) ද්‍රවශීලතා කළමනාකරණයට සහ ගෙවීම් හා පියවීම් පද්ධතිවල සුමට ක්‍රියාකාරිත්වයට දායක වන ආකාරය

බැංකු පද්ධතියේ ද්‍රවශීලතාව (Liquidity) යනු බැංකු විසින් තම දෛනික ගෙවීම් සහ මූල්‍ය වගකීම් නියමිත වේලාවට ඉටු කිරීම සඳහා පවතින අරමුදල්වල ප්‍රමාණය සහ ඒවා භාවිතයට ගත හැකි පහසුවයි. ද්‍රවශීලතාව ප්‍රමාණවත් නොවන්නේ නම්, බැංකු අතර මුදල් වෙළෙඳපොළේ පොලී අනුපාතිකවල අස්ථාවරත්වයක් ඇති විය හැකි අතර, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති තීරණ මූල්‍ය පද්ධතිය වෙත සම්ප්‍රේෂණය වීම ද දුර්වල විය හැකිය. එබැවින්, බැංකු පද්ධතියේ ද්‍රවශීලතාව කාර්යක්ෂමව කළමනාකරණය කිරීම මහ බැංකුවේ ප්‍රධාන මෙහෙයුම් වගකීමක් වේ.

පවත්නා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය යටතේ මුදල් වෙළඳපොළ පොලී අනුපාතික හැසිරවීමේ දී මහ බැංකුව මෙහෙයුම් ඉලක්කය ලෙස බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් වෙළඳපොළ අනුපාතිකය භාවිත කරනු ලබයි. ඒ අනුව, පොලී අනුපාතිකයේ හැසිරවීම සඳහා අවශ්‍ය සංඥා ලබාදීම සඳහා ඒක්ෂණ මුදල් වෙළඳපොළ පොලී අනුපාතිකය අපේක්ෂිත මට්ටමේ පවත්වා ගැනීම අරමුණු කර ගනිමින් වෙළඳපොළ ද්‍රවශීලතාව සඳහා බලපෑම් සිදු කරයි. පොලී අනුපාතය අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ දැමීමට අවශ්‍ය අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කළ යුතු වේ. එසේ අවශෝෂණය කිරීම ස්ථිර පදනමින් හෝ දිගුකාලීන පදනමින් සිදුකිරීමට අවශ්‍ය නම්, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ඉහළ දැමීම හරහා ද, එසේ ම ද්‍රවශීලතාව දිගුකාලීන පදනමින් වෙළඳපොළට ලබා දීමට අවශ්‍යතාවක් ඇති විට ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පහළ දැමීම හරහා ද අතිරික්ත ද්‍රවශීලතාවක් වෙළඳපොළ වෙත මුදා හැරීමට ද මහ බැංකුවට හැකිවේ. බැංකුවලට ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව සපුරාලීම සඳහා ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් නොමැති අවස්ථාවකදී, එම අවශ්‍යතාව සපුරාලීම සඳහා බැංකු අතර මුදල් වෙළෙඳපොළෙන් අරමුදල් ලබා ගැනීමට සිදුවිය හැකි අතර, එමගින් කෙටිකාලීන පොලී අනුපාතිකවල උච්චාවචනයන් ඇති විය හැකිය. ඒ අනුව, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව මගින් බැංකු පද්ධතියේ සංචිත පදනම සහ ද්‍රවශීලතා තත්ත්වය විධිමත්ව පවත්වාගෙන යාමටත්, මුදල් වෙළෙඳපොළේ ද්‍රවශීලතා තත්ත්වය ස්ථාවරව පවත්වා ගැනීමටත්, මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමටත් සහාය වේ.

ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් පවත්වාගෙන යාම ගෙවීම් හා පියවීම් පද්ධතිවල සුමට හා අඛණ්ඩ ක්‍රියාකාරිත්වය සඳහා ද අත්‍යවශ්‍ය වේ. බැංකු අතර මෙන්ම බැංකු හා අනෙකුත් පාර්ශ්ව අතර සිදු වන ගෙවීම් නියමිත වේලාවට පියවීම සඳහා ප්‍රමාණවත් සංචිත සහ ද්‍රවශීලතාවක් පැවතීම වැදගත් වන අතර, එවැනි ද්‍රවශීලතා පදනමක් පවත්වාගෙන යාමට ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව දායක වේ. එමගින් බැංකු පද්ධතිය තුළ ද්‍රවශීලතා හිඟයන් හේතුවෙන් ගෙවීම් හා පියවීම් කටයුතුවල ඇති විය හැකි ප්‍රමාද හෝ බාධා අවම කිරීමට සහ සමස්ත මූල්‍ය පද්ධතියේ ගෙවීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට සහාය වේ.

### ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සහ සංචිත අවශ්‍යතා රාමුවේ විකාසනය

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 32, 33 සහ 34 වගන්ති මගින් ශ්‍රී ලංකාවේ සංචිත අවශ්‍යතා සඳහා නීතිමය පදනම සපයා ඇති අතර, සංචිත අනුපාතය සහ මෙහෙයුම් විධිවිධාන මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් නියම කරනු ලැබේ. මෙසේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය තීරණය කරන ලද අනුපාතයට

අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුව තුළ සංචිත පවත්වා ගත යුතුවේ. මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය එම අනුපාතය තීරණය කිරීමේ දී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයෙහි දිශානතිය හා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී සලකා බලනු ලබන මුදල් වෙළඳපොළ ප්‍රවණතාවයන්, ද්‍රවශීලතා තත්ත්වය ඇතුළු විවිධ සාධක සැලකිල්ලට ගනු ලබයි.

ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය, ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවීමත් සමඟ 1950 වසරේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා හඳුන්වා දෙන ලදී. එතැන් සිට, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ බැංකු පද්ධතියේ ද්‍රවශීලතාව කළමනාකරණය සඳහා මෙම උපකරණය භාවිත කර ඇති අතර, කාලයත් සමඟ මුදල් වෙළෙඳපොළ සහ මුදල් ප්‍රතිපත්ති රාමුවේ වෙනස්කම් අනුව එහි අනුපාතය සහ මෙහෙයුම් විධිවිධාන වරින් වර සංශෝධනය කර ඇත. විශේෂයෙන්, ද්‍රවශීලතා තත්ත්වයන්හි වෙනස්කම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා සංචිත අනුපාතය විටින් විට වෙනස් කරමින් බැංකු පද්ධතියේ ද්‍රවශීලතාව කෙරෙහි බලපෑම් කිරීමට මෙම උපකරණය භාවිත කර ඇත.

## 1950 -1980

මෙම කාලපරිච්ඡේදයේ දී, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී භාවිත වූ ප්‍රධාන ප්‍රමාණාත්මක උපකරණයක් වූ අතර, එය සියයට 14 සිට සියයට 10 දක්වාත් පසුව සියයට 12 දක්වාත් වෙනස් විය. මෙම කාලය තුළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය මගින් බැංකු පද්ධතියේ ද්‍රවශීලතාව, ණය ප්‍රසාරණය සහ මුදල් සැපයුම කෙරෙහි සැලකිය යුතු ලෙස බලපෑම් කරන ලදී.

## 1981-2000

මෙම කාලපරිච්ඡේදයේ දී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයෙහි සැලකිය යුතු උච්චාවචනයන් සිදු වූ අතර, එය සියයට 18 දක්වා වැඩි වී පසුව සියයට 10 15 අතර මට්ටම්වල වෙනස් විය. මූල්‍ය වෙළඳපොළ සංවර්ධනයත් සමඟ 1990 දශකයේ අගභාගයේ දී මුදල් ප්‍රතිපත්ති රාමුව ක්‍රමයෙන් වෙළඳපොළ පදනම් කරගත් උපකරණ වෙත වැඩි වශයෙන් යොමු වූ අතර ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයෙහි මෙහෙයුම් භාවිතය ක්‍රමයෙන් වෙනස් විය.

## 2001-2019

මෙම කාලපරිච්ඡේදයේ දී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ක්‍රමයෙන් අඩු කිරීමේ ප්‍රවණතාවක් දක්නට ලැබුණු අතර, මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී වෙළඳපොළ පදනම් කරගත් උපකරණවල වැදගත්කම තවදුරටත් වැඩි විය. විවෘත වෙළඳපොළ කටයුතුවල භූමිකාව වැඩිවීමත් සමඟ, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය නිරන්තර මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් උපකරණයක් ලෙස භාවිත කිරීම කෙරෙහි පැවති අවධානය ක්‍රමයෙන් අඩු වූ අතර, මුදල් වෙළඳපොළේ ද්‍රවශීලතාවයට සහ ණය වර්ධනයට බලපෑම් කිරීම සඳහා අවස්ථානුකූලව භාවිත කරන ලදී.

**රූප සටහන් අංක 01**




**පවතින සංචිත අනුපාතය (Reserve Ratio) සියයට 2ක් ක් නම්,**
**එම වාණිජ බැංකුව පවත්වා ගත යුතු සංචිත ප්‍රමාණය ගණනය කිරීම.**

| අයිතමය | තැන්පතු ප්‍රමාණය (රු. බිලියන) | අදාළ වන සංචිත අනුපාතය | අවශ්‍ය සංචිත ප්‍රමාණය (රු. බිලියන) |
|---|---|---|---|
| කාලීන හා ඉතුරුම් තැන්පතු | 13,386 | 2% | 268 |
| ඉල්ලුම් තැන්පතු | 927 | 2% | 19 |
| අනෙකුත් තැන්පතු | 63 | 2% | 1 |
| මුළු තැන්පතු වගකීම | 14,376 | 2% | 288 |

## 2020-2026

වර්තමානයේ දී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රධාන වශයෙන් බැංකු පද්ධතියේ දිගුකාලීනව පවත්නා ද්‍රවශීලතා ගැටලු කළමනාකරණය කිරීමේ උපකරණයක් ලෙස භාවිත කරයි. වර්තමානයේ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවල ශ්‍රී ලංකා රුපියල්වලින් පවතින ඉල්ලුම් තැන්පතු, කාලීන තැන්පතු, ඉතුරුම් තැන්පතු සහ වෙනත් අදාළ තැන්පතු සඳහා ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව අදාළ වන අතර, වර්තමාන සංචිත අනුපාතය සියයට 2ක් පමණ වේ.

මුදල් වෙළඳපොළෙහි දිගුකාලීනව පවත්නා ද්‍රවශීලතා ගැටලු විසඳීම සඳහා අවශ්‍යතාව අනුව ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය මෑත කාලයේ භාවිත කර ඇති ආකාරය රූප සටහන් අංක 02 මගින් පෙන්නුම් කරයි.

එමෙන්ම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී සහ සංචිත පවත්වා ගැනීම සම්බන්ධයෙන් කලින් කලට හඳුන්වා දෙනු ලබන වැඩිදියුණු කිරීම් හා මුදල් වෙළඳපොළ වෙනස් වීම් සැලකිල්ලට ගනිමින් ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය මෙන්ම සංචිත අවශ්‍යතා රාමුවෙහි අංගයන් ද වරින් වර සංශෝධනය කර ඇත.

## ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා රාමුව

ශ්‍රී ලංකාවේ මෙතෙක් ක්‍රියාත්මක වූ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා රාමුවේ ප්‍රධාන ලක්ෂණ කිහිපයක් පහත දක්වා ඇත.

(අ) **සංචිත පවත්වාගෙන යෑමේ කාල පරිච්ඡේදය (Reserve Maintenance period)**

සංචිත පවත්වාගෙන යෑමේ කාල පරිච්ඡේදය 2013 වසරේ මැයි මාසයේ 01 වන දින සිට සති 02ක් ලෙස දීර්ඝ කරන ලදී.[1] ඒ අනුව, පළමු කාලපරිච්ඡේදය, සෑම මසකම 01 වැනි දා සිට 15 වැනි දා දක්වාත්, දෙවන කාල පරිච්ඡේදය සෑම මසකම 16 වැනි දින සිට මාසය අවසන් දිනය දක්වාත් පවත්වා ගත යුතු විය. ඒ අනුව, යම් ලිත් මාසයක පළමු සංචිත කාලපරිච්ඡේදයේ දී (මාසයේ 01 වන දින සිට 15 වන දින දක්වා) සෑම වාණිජ බැංකුවක් විසින්ම සිය බැංකුවේ තිබූ මුළු රුපියල් තැන්පතු වගකීම් අනුව අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත ප්‍රමාණය, එළඹෙන ඊළඟ මාසයේ පළමු කාලපරිච්ඡේදයේ දී මහ බැංකුවේ පවත්වාගත යුතුය. එසේම එම වාණිජ බැංකුව, යම් ලිත් මාසයක දෙවන කාල පරිච්ඡේදයෙහි පැවැති මුළු තැන්පතු වගකීම් අනුව එළඹෙන ඊළඟ මාසයේ දෙවන කාලපරිච්ඡේදයේ දී

රූප සටහන් අංක 02 - ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයෙහි වෙනස්වීම් (2012 - 2026 අගෝස්තු)




1. 2013 මැයි මාසයට පෙර වාණිජ බැංකු සඳහා සංචිත පවත්වා ගෙන යෑමේ කාලපරිච්ඡේදය සෑම සතියකම සිකුරාදා දිනෙන් ආරම්භ වී ඊළඟට සතියේ බ්‍රහස්පතින්දා දිනෙන් අවසන් වන දින හතක චක්‍රයක් ලෙස පවත්වා ගැනුණි.

ඊට අනුරූප වන පරිදි මහ බැංකුවේ සංචිත පවත්වා ගත යුතුය. එමගින් බැංකුවලට කෙටි කාලීන ද්‍රවශීලතා වෙනස්වීම් වඩාත් නම්‍යශීලීව කළමනාකරණය කරමින්, කාලපරිච්ඡේදය තුළ සංචිත මට්ටම් සකස් කිරීමට හැකියාව ලැබුණි.

**(ආ) ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව සහ කාසි හා නෝට්ටු/ කැට මුදල් (vault cash) ගැලපුම**

වාණිජ බැංකුවක් විසින් මහ බැංකුවේ සංචිත ගිණුමෙහි පවත්වා ගත යුතු සංචිත ප්‍රමාණය ගණනය කිරීමේදී, වාණිජ බැංකුවක් විසින් එදිනෙදා ගනුදෙනු අවශ්‍යතා සඳහා බැංකුවෙහි තබාගන්නා කාසි හා නෝට්ටු/ කැට මුදල් (Till Cash) සැලකිල්ලට ගනිමින් ඒ සඳහා යම් ගැලපීමක් සිදුකිරීමට වාණිජ බැංකු වෙත අවස්ථාව ලබා දී ඇති අතර විටින් විට එය වෙනස්කම්වලට භාජනය වී ඇත.

ඒ අනුව, 2020 ජුනි 16 දින සිට බලපැවැත්වෙන පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකුවලට, සංචිත ගණනය කිරීම සඳහා ස්වකීය සංචිතවල පවත්වාගත හැකි මුදල් නෝට්ටු හා කාසි ප්‍රමාණය තැන්පතු වගකීම්වලින් සියයට දෙක ඉක්මවා ඇති මුදල් නෝට්ටු හා කාසි ප්‍රමාණයෙන්, සියයට එකක් පමණක් ලෙස සලකා බලන ලදී.[2] එනම්, උපරිම වශයෙන් සියයට එකක කාසි හා නෝට්ටු වටිනාකම, සංචිත ගණනයේ දී ව්‍යවස්ථාපිත සංචිත අගයෙන් අඩු කර අවශ්‍ය සංචිත ලෙස පවත්වා ගැනීමට වාණිජ බැංකු සඳහා අවකාශය ලබා දෙන ලදී.

**(ඇ) දෛනික අවම සංචිත අවශ්‍යතාවය (Daily Minimum Reserve Requirement)**

ව්‍යවස්ථාපිත සංචිත පවත්වා ගැනීමේ දී, සංචිත පවත්වා ගන්නා කාලපරිච්ඡේදයේ දී දෛනිකව වාණිජ බැංකු විසින් අවම වශයෙන් පවත්වා ගත යුතු සංචිත අනුපාතිකය වෙළඳපොළ මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් සෑම ව්‍යාපාරික දිනයක් අවසානයේ දී ම පරීක්ෂා කරනු ලබයි. එසේ වුවද, සමස්ත සංචිත කාලපරිච්ඡේදය සම්පූර්ණ වන දිනය අවසානයේ දී, අදාළ කාලපරිච්ඡේදය සඳහා ගණනය කර ඇති සංචිත ප්‍රමාණයෙහි සාමාන්‍යය, සියයට සියයක් (100%ක්) ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සපුරාලිය යුතුවේ.

කොවිඩ්19 වසංගතය හේතුවෙන් ඇති වූ දැඩි ද්‍රවශීලතා තත්ත්වයන්ට ප්‍රතිචාර වශයෙන්, 2020 අප්‍රේල් 16 දින සිට දෛනික අවම සංචිත අවශ්‍යතාව සියයට 90 සිට සියයට 20 දක්වා අඩු කරන ලදී. එමගින් බැංකුවලට දෛනික ද්‍රවශීලතා කළමනාකරණයේ දී වැඩි නම්‍යශීලීභාවයක් ලැබුණු අතර, කාලපරිච්ඡේදය අවසානයේ සාමාන්‍ය සංචිත අවශ්‍යතාව සම්පූර්ණ කිරීමේ වගකීම පවත්වා ගන්නා ලදී.

**(ඈ) ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා උල්ලංඝනය කිරීම් සඳහා දඩ පොලී පැනවීම**

සංචිත කාලපරිච්ඡේදය අවසන් වන දිනයේ දී, යම් හෙයකින් පවත්වාගත් සංචිත ප්‍රමාණය, පවත්වාගත යුතු සංචිත ප්‍රමාණයට වඩා අඩු වුවහොත්, එනම් පවත්වාගත් සංචිතවල ඌණතාවක් ඇති වුවහොත්, එම ප්‍රමාණය මත දිනකට සියයට එකෙන් දහයෙන් පංගුවක (0.1%) ප්‍රමාණයක පොලියක් වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවිය යුතු විය.

**ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා රාමුව ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව**

බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ පරිණාමය, ගෙවීම් හා පියවීම් පද්ධතිවල දියුණුව, බැංකුවල ද්‍රවශීලතා කළමනාකරණයේ වෙනස්කම් සහ වෙළඳපොළ සහ ආර්ථිකයේ වෙනස්වීම් තුළින් ලද අත්දැකීම් හේතුවෙන් ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා රාමුව පුළුල් ලෙස සමාලෝචනය කිරීමේ අවශ්‍යතාව මතු විය.

විශේෂයෙන්, වර්තමාන මුදල් ප්‍රතිපත්ති රාමුව තුළ විවෘත වෙළඳපොළ මෙහෙයුම් ප්‍රධාන භූමිකාවක් ඉටු කරන බැවින්, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා රාමුව, එම මෙහෙයුම් සමග වඩාත් සමීපව සම්බන්ධ කිරීම මගින් ද්‍රවශීලතා පුරෝකථනය සහ කළමනාකරණය වැඩිදියුණු කළ හැකිය. එමෙන්ම, කෙටිකාලීන පොලී අනුපාතිකවල අනවශ්‍ය උච්චාවචන අවම කිරීම, බැංකුවල සංචිත කළමනාකරණ විනය වැඩිදියුණු කිරීම සහ මුදල් ප්‍රතිපත්ති සංඥා වඩාත් කාර්යක්ෂමව

2. 1992 ජනවාරි 24 වන දින සිට 2020 ජුනි 16 දින වනතුරු, මෙම කැට මුදල් සහනය උපරිම වශයෙන් සියයට 2ක මට්ටමේ පැවතුණි.

සම්ප්‍රේෂණය කිරීම සඳහා රාමුව නවීකරණය කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඇත.

ඒ අනුව, 2024/2025 වසරවල දී සිදු කරන ලද සමාලෝචනය මගින් ප්‍රධාන ප්‍රතිසංස්කරණ ක්ෂේත්‍ර හඳුනාගෙන ඇති අතර, ඒවා ක්‍රියාත්මක කිරීමෙන් ද්‍රවශීලතා කළමනාකරණය, කෙටිකාලීන පොලී අනුපාතික ස්ථාවරතාව සහ මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ.

### ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා රාමුව ශක්තිමත් කිරීම යටතේ 2026 වසර තුළ ක්‍රියාත්මක කළ නවීකරණ[3]

2026 වසරේ දී ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍රවලට අදාළව සංශෝධන කිහිපයක් හඳුන්වා දෙන ලදී. ඒවායේ ප්‍රධාන අරමුණ වූයේ බැංකු පද්ධතියේ ද්‍රවශීලතා කළමනාකරණය වැඩිදියුණු කිරීම, කෙටිකාලීන පොලී අනුපාතික උච්චාවචන අවම කිරීම සහ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමයි.

**(අ) සංචිත පවත්වාගෙන යෑමේ කාලපරිච්ඡේදය සංශෝධනය කිරීම**

2026 වසරේ දී සංචිත පවත්වාගෙන යෑමේ කාලපරිච්ඡේදය සතියේ මැද දී ආරම්භ වන පරිදි, බදාදා සිට අඟහරුවාදා දක්වා සති දෙකක කාලපරිච්ඡේදයක් ලෙස සංශෝධනය කර ඇති අතර, සංචිත පවත්වාගෙන යෑමේ කාල සටහන කල්තියා ප්‍රකාශයට පත් කරනු ලැබේ. මෙම වෙනස මගින් කාලපරිච්ඡේද අවසානයේ, විශේෂයෙන් ලිත් මාසය අවසානයේ දී හෝ ඇතැම් විට සති අන්තවල දී සිදුවන රජයේ වැටුප් ගෙවීම් මෙන්ම බදු ගෙවීම් සහ ව්‍යවහාර මුදල් සංසරණය ඉහළ යෑම ආදී හේතූන් පදනම්ව ඇති විය හැකි ද්‍රවශීලතා පීඩන සහ ඒ තුළින් ඇති විය හැකි කෙටිකාලීන පොලී අනුපාතිකවල උච්චාවචන අවම කිරීමට අපේක්ෂා කෙරේ.මෙම නව කාලසටහන, විවෘත වෙළඳපොළ මෙහෙයුම් සමඟ වඩාත් හොඳින් සම්බන්ධ කිරීම මගින් ද්‍රවශීලතාව පුරෝකථනය හා කළමනාකරණය වැඩිදියුණු කිරීමට සහාය වේ. මෙවැනි සති දෙකක සංචිත පවත්වාගෙන යෑමේ කාලපරිච්ඡේදයක් ජාත්‍යන්තර වශයෙන් ද භාවිත වන අතර, උදාහරණයක් ලෙස තායිලන්ත මහ බැංකුව වාණිජ බැංකු සඳහා බදාදා දිනකින් ආරම්භ වී දෙවන අඟහරුවාදා දිනෙන් අවසන් වන සති දෙකක කාලපරිච්ඡේදයක් තුළ සාමාන්‍ය පදනම මත සංචිත අවශ්‍යතාව පවත්වාගෙන යාමට නියම කර ඇත.

**(ආ) කැට මුදල් සංචිත අවශ්‍යතාව සඳහා සලකා බැලීම ක්‍රමයෙන් ඉවත් කිරීම**

බැංකුවල මුදල් කළමනාකරණය සහ ද්‍රවශීලතා නිරීක්ෂණය සඳහා පවතින තාක්ෂණික පහසුකම් වැඩිදියුණු වීමත් සමඟ, සංචිත අවශ්‍යතාව සපුරාලීම සඳහා බැංකු ශාඛාවල සහ මුදල් ගබඩාවල පවත්වාගෙන යනු ලබන කැට මුදල් සලකා බැලීමේ අවශ්‍යතාව ක්‍රමයෙන් අඩු වී ඇත.

තවද, ජාත්‍යන්තර අත්දැකීම් අනුව, ඇතැම් මහ බැංකු විසින් සංචිත අවශ්‍යතා සපුරාලීම සඳහා සුදුසුකම් ලබන වත්කම් ලෙස කැට මුදල් ඇතුළත් නොකර, මහ බැංකුව සමඟ පවත්වාගෙන යනු ලබන සංචිත ශේෂය මත අවධානය යොමු කරනු ලබයි. මෙම ජාත්‍යන්තර ප්‍රවණතාව සහ දේශීය බැංකු පද්ධතියේ වර්ධනයන් සැලකිල්ලට ගනිමින්, 2026 වසරේ දී බැංකු ශාඛාවල සහ මුදල් ගබඩාවල පවත්වාගෙන යනු ලබන කැට මුදල් සංචිත අවශ්‍යතාව සපුරාලීම සඳහා සලකා බැලීම අදියර වශයෙන් ඉවත් කිරීමට තීරණය කර ඇත.

ඒ අනුව, සංචිත අවශ්‍යතාව මහ බැංකුවේ සංචිත ගිණුමේ පවත්වාගෙන යනු ලබන ශේෂය මත පදනම් වන අතර, එමගින් බැංකු පද්ධතියේ ද්‍රවශීලතා තත්ත්වය වඩාත් පැහැදිලිව නිරීක්ෂණය කිරීමටත්, සංචිත අවශ්‍යතාව ගණනය කිරීම වඩාත් සරල හා විනිවිදභාවයෙන් යුතුව සිදු කිරීමටත් හැකි වේ.

**(ඇ) දෛනික අවම සංචිත අවශ්‍යතාව සංශෝධනය**

දෛනික අවම සංචිත අවශ්‍යතාව කොවිඩ්19 වසංගත කාල සමයට පෙර පැවති මට්ටමට,

3. අංක 2481/09 දරන ගැසට් (අති විශේෂ) නිවේදනය තුළින් ප්‍රකාශයට පත් කරන ලද 2026 අංක 01 දරන සංචිත අවශ්‍යතා පිළිබඳ රීති සහ 2026 අංක 01 දරන සංචිත අවශ්‍යතාවය සඳහා වූ මෙහෙයුම් උපදෙස්.

රූප සටහන් අංක 03




එනම් සියයට 90ක් දක්වා ක්‍රමානුකූලව ප්‍රතිස්ථාපනය කිරීම මගින් සංචිත පවත්වා ගත යුතු කාලපරිච්ඡේදය පුරා වඩාත් විධිමත් හා අඛණ්ඩ සංචිත කළමනාකරණයක් පවත්වාගෙන යාම අපේක්ෂා කෙරේ. එමගින් ද්‍රවශීලතා කළමනාකරණයේ නම්‍යශීලීභාවය සහ සංචිත කළමනාකරණ විනය අතර වඩාත් යෝග්‍ය සමතුලිතතාවක් ඇති කිරීමට හැකි වේ.

මෙම සංශෝධනය මගින් දෛනික ද්‍රවශීලතා තත්ත්වය වඩාත් කාර්යක්ෂමව නිරීක්ෂණය කිරීමට සහ අවශ්‍ය අවස්ථාවල දී විවෘත වෙළඳපොළ මෙහෙයුම් සැලසුම් කිරීමට සහාය වේ.

(ඈ) දඩ පොලී පැනවීමේ ව්‍යුහය (Penalty Framework) සංශෝධනය

සංචිත අවශ්‍යතාව සපුරාලීමට අපොහොසත් වන අවස්ථාවල දී අදාළ වන දඩ පොලී ක්‍රමවේදය 2026 වසරේ දී මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සමඟ සම්බන්ධ වන පරිදි සංශෝධනය කර ඇත. මෙමගින් සංචිත අවශ්‍යතා පිළිපැදීම සඳහා බැංකු වෙත පැහැදිලි දිරිගැන්වීමක් ලබා දීමට අපේක්ෂා කෙරේ. එසේම, ජාත්‍යන්තර අත්දැකීම් අනුව ද, සංචිත ඌණතා සඳහා අය කරන දඩ පොලී අනුපාතික ප්‍රතිපත්ති පොලී අනුපාතික සමඟ සම්බන්ධ කිරීමේ ප්‍රවණතාවක් පවතින අතර, එමගින් දඩ පොලී අනුපාතික පවතින මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව පවත්වා ගැනීමට හැකි වේ.

සමස්තයක් ලෙස, 2026 වසරේ දී සිදු කරන ලද මෙම සංශෝධන මගින් ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා රාමුව ජාත්‍යන්තර මනා පරිචයන් සමඟ වඩාත් ගැළපෙන පරිදි නවීකරණය කිරීමට දායක වන අතර, සංචිත කළමනාකරණයේ කාර්යක්ෂමතාව, ද්‍රවශීලතා පුරෝකථනය සහ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ සඵලදායිතාව තවදුරටත් ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ.

## සමෝධානය

සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක්ම අදාළ නිශ්චිත කාල සීමාව තුළ දී සිය සමස්ත රුපියල් තැන්පතු වගකීම්වලට අනුපාතිකව නියම කර ඇති සංචිත ප්‍රමාණය ශ්‍රී ලංකා මහ බැංකුවේ තම සංචිත ගිණුමේ පවත්වා ගත යුතු වේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී, සංචිත පවත්වා ගැනීම සම්බන්ධයෙන් කලින් කලට හඳුන්වා දෙනු ලබන වැඩි දියුණු කිරීම් සහ මුදල් වෙළෙඳපොළ ප්‍රවණතාවයන් සැලකිල්ලට ගනිමින් ව්‍යවස්ථාපිත සංචිත ගනුදෙනු මෙන්ම සංචිත ඇස්තමේන්තු කිරීමේ ක්‍රමවේදය ද වරින් වර සංශෝධනය කර ඇත.

ප්‍රමාණාත්මක වෙළෙඳපොළ උපකරණයක් වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය හරහා, වෙළෙඳපොළ තුළ අඛණ්ඩව පවත්නා ද්‍රවශීලතාව පාලනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා (SRR) රාමුව ශක්තිමත් කිරීමේ මෙම නවීකරණ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් රාමුව වර්තමාන මූල්‍ය පද්ධතියේ අවශ්‍යතාවන්ට සහ ජාත්‍යන්තර හොඳම භාවිතයන්ට අනුකූල වන පරිදි තවදුරටත් නවීකරණය කිරීමේ වැදගත් පියවරකි. මෙම ප්‍රතිසංස්කරණ මගින් එම රාමුව වඩාත් කාර්යක්ෂම කිරීම අපේක්ෂා කෙරේ.

මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට බැංකු පද්ධතියේ ද්‍රවශීලතා තත්ත්වය වඩාත් නිවැරදිව පුරෝකථනය කිරීමටත්, විවෘත වෙළඳපොළ මෙහෙයුම් වඩාත් කාර්යක්ෂමව සැලසුම් කිරීමටත් හැකි වනු ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, මුදල් වෙළෙඳපොළේ කෙටිකාලීන පොලී අනුපාතික ප්‍රතිපත්ති පොලී අනුපාතිකය වටා වඩාත් ස්ථාවරව පවත්වා ගැනීමට සහ මුදල් ප්‍රතිපත්ති තීරණ මූල්‍ය පද්ධතිය වෙත කාර්යක්ෂමව සම්ප්‍රේෂණය කිරීමට ද සහාය වනු ඇත.

### මූලාශ්‍ර:


Central Bank of Sri Lanka, (2025), Study Report on Reviewing the Current Statutory Reserve Requirement Framework in Sri Lanka, Unpublished.

Churiy, O. and Vollan, B., (2024), Sri Lanka Liquidity Monitoring and Monetary Operations, https://www.imf.org/-/media/files/publications/tar/2024/english/tarea2024078-print-pdf.pdf.

Della Valle, G., King, D. and Veyrune, R., (2022), Reserve Requirements. MCM Technical Assistance Handbook.

Gray, M.S., (2011), Central Bank Balances and Reserve Requirements. International Monetary Fund.

Hein, S.E. and Stewart, J.D., (2002), Reserve Requirements: A modern perspective. Economic Review-Federal Reserve Bank of Atlanta, 87(4), pp.41-52.

Lepers, E. (2018), Reserve Requirements: Current Use, Motivations and Practical Considerations, OECD3.

Montoro, C. and Moreno, R. (2013), The use of reserve requirements as a policy instrument in

Latin America, BIS Quarterly Review, March 2011

අංක 2481/09 දරන ගැසට් (අති විශේෂ) නිවේදනය තුලින් ප්‍රකාශයට පත් කරන ලද 2026 අංක 01 දරන සංචිත අවශ්‍යතා පිළිබඳ රීති සහ 2026 අංක 01 දරන සංචිත අවශ්‍යතාවය සඳහා වූ මෙහෙයුම් උපදෙස්

# දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි කාර්යභාරය සහ එහි වත්මන් ක්‍රියාකාරීත්වය




**අචිනි දිසානායක**

**සහකාර අධ්‍යක්ෂ**

**වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව**

**නිසංකා තිලකරත්න**

**සහකාර අධ්‍යක්ෂ**

**වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව**


**හැඳින්වීම**

දේශීය විදේශ විනිමය වෙළඳපොළ යනු රටක විදේශීය අංශයේ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය සඳහා අත්‍යවශ්‍ය මූල්‍ය වෙළඳපොළකි. ජාත්‍යන්තර වෙළඳාම, විදේශ ආයෝජන, ප්‍රාග්ධන ගනුදෙනු, සේවා අපනයන සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ වැනි කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය විදේශ විනිමය මෙම වෙළඳපොළ හරහා සංසරණය වේ. එබැවින් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ක්‍රියාකාරීත්වය රටක සාර්ව ආර්ථික ස්ථාවරත්වය, ජාත්‍යන්තර තරගකාරීත්වය සහ විදේශීය අංශයේ ශක්තිමත්භාවය සමඟ සෘජුවම සම්බන්ධ වේ.

ශ්‍රී ලංකාවේ දේශීය විදේශ විනිමය වෙළඳපොළ දශක ගණනාවක් පුරා ආර්ථික ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර මූල්‍ය පද්ධතියේ සිදු වූ වෙනස්වීම්වලට අනුකූලව ක්‍රමානුකූලව විකාසනය වී ඇත. ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමයක සිට පාලිත පාවෙන ක්‍රමයක් හරහා වර්තමාන නම්‍යශීලී විනිමය අනුපාතික රාමුව දක්වා සිදු වූ මෙම විකාසනය ශ්‍රී ලංකාවේ ආර්ථික පරිවර්තනයේ වැදගත් අංගයකි. වර්තමානයේ දී මෙම වෙළඳපොළ ක්‍රියාත්මක වන්නේ වෙළඳපොළ බලවේග මත පදනම් වූ රාමුවක් තුළ වන අතර, එහි ස්ථාවර හා විධිමත් ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම සඳහා මහ බැංකුව වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

ශ්‍රී ලංකාවේ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි වැදගත්කම, එහි විකාසනය සහ වත්මන් ක්‍රියාකාරීත්වය පිළිබඳ සවිස්තරාත්මක අවබෝධයක් ලබාදීම මෙම ලිපියෙහි ප්‍රධාන අරමුණ වේ. ඒ යටතේ විනිමය අනුපාතික ක්‍රමයේ සිදු වූ ප්‍රතිපත්තිමය වෙනස්කම්, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ව්‍යුහය, මහ බැංකුවේ වෙළඳපොළ මැදිහත්වීම් සහ මෑතකාලීන වෙළඳපොළ ප්‍රවණතා විග්‍රහ කරනු ලැබේ. එමෙන්ම, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ස්ථාවරත්වය, කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය වර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක කර ඇති ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සහ ඉදිරි දිශානතිය පිළිබඳව ද පාඨකයා දැනුවත් කිරීමට අපේක්ෂා කෙරේ.

**විනිමය අනුපාතිකය සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි වැදගත්කම**

විනිමය අනුපාතිකය යනු එක් මුදල් ඒකකයක අගය තවත් මුදල් ඒකකයකට සාපේක්ෂව දක්වන මිනුමකි. එය ප්‍රධාන වශයෙන් විදේශ විනිමය සඳහා පවතින ඉල්ලුම සහ සැපයුම මත තීරණය වේ. විදේශ මුදල් සඳහා ඉල්ලුම ඉහළ යෑම දේශීය මුදලේ අවප්‍රමාණයට හේතු විය හැකි අතර, අපනයන ආදායම්, විදේශ ප්‍රේෂණ සහ ප්‍රාග්ධන ගලාඒම් ඉහළ යෑම තුළින් විදේශ

විනිමය සැපයුම වැඩිවී දේශීය මුදලේ අගය ශක්තිමත් විය හැකිය.

විනිමය අනුපාතිකයේ වෙනස්වීම්, ආනයන මිල ගණන්, අපනයන ආදායම්, ජාත්‍යන්තර තරගකාරීත්වය, විදේශ අධ්‍යාපන පිරිවැය, සංචාරක වියදම් සහ ආයෝජන තීරණ ඇතුළු බොහෝ ආර්ථික ක්‍රියාකාරකම්වලට බලපායි. එබැවින් විනිමය අනුපාතිකය කෙරෙහි බලපාන සාධක පිළිබඳ අවබෝධය, ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේ දී ඉතා වැදගත් වේ. විනිමය අනුපාතිකයේ හැසිරීම ජංගම ගිණුමේ ශේෂය, පොලී අනුපාතික, රාජ්‍ය ණය මට්ටම්, වෙළඳපොළ විශ්වාසය සහ අනාගත අපේක්ෂාවන් ඇතුළු බොහෝ සාධක මත රඳා පවතී.

ශ්‍රී ලංකාවේ දේශීය විදේශ විනිමය වෙළඳපොළ ශ්‍රී ලංකා මහ බැංකුව, බලපත්‍රලාභී වාණිජ බැංකු, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, බලයලත් මුදල් තැරැව්කරුවන්, ආනයනකරුවන්, අපනයනකරුවන් සහ අනෙකුත් ගනුදෙනුකරුවන්ගෙන් සමන්විත වේ. මෙම වෙළඳපොළ හරහා විදේශ විනිමය අවශ්‍යතා සපුරාලීම පමණක් නොව, ජාත්‍යන්තර ගෙවීම් සහ පියවීම් කටයුතු ද සිදු කෙරේ. ඒ අනුව, මෙය රටේ ජාත්‍යන්තර ආර්ථික සබඳතා පවත්වාගෙන යෑමේ ප්‍රධාන යාන්ත්‍රණයක් ලෙස සැලකිය හැකිය.

## ශ්‍රී ලංකාවේ දේශීය විදේශ විනිමය අනුපාතික ප්‍රතිපත්තියෙහි විකාශනය

1950 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව ස්ථාපිත කරන ලද අවස්ථාවේ ශ්‍රී ලංකාවේ විනිමය අනුපාතික ක්‍රමය බ්‍රෙට්න් වුඩ්ස් ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය (Bretton Woods Fixed Exchange Rate System) යටතේ ක්‍රියාත්මක විය. එම රාමුව තුළ ශ්‍රී ලංකා රුපියලේ වටිනාකම ප්‍රථමයෙන් බ්‍රිතාන්‍ය පවුමට සම්බන්ධ කර තිබූ අතර, පසුව රත්‍රන් සමඟ ඍජුව සම්බන්ධ කොට පවත්වාගෙන යනු ලැබීය. මෙම ක්‍රමය යටතේ විනිමය අනුපාතික ප්‍රතිපත්තියේ මූලික අරමුණ වූයේ ජාත්‍යන්තර ගනුදෙනු සඳහා ශ්‍රී ලංකා රුපියලේ වටිනාකම ස්ථාවර ලෙස පවත්වා ගැනීමයි. ස්ථාවර විනිමය අනුපාතිකය ජාත්‍යන්තර ගනුදෙනුවල අවිනිශ්චිතතාව අවම කිරීමට ද උපකාරී වුවද, ඒ තුළින් කාලයත් සමඟ ශ්‍රී ලංකාවට දිගුකාලීන ගෙවුම් ශේෂ හිඟයන්ට මුහුණ දීමට සිදුවිය. මෙම තත්ත්වයට විසඳුමක් ලෙස 1968 වසරේදී විදේශ විනිමය හිමිකම් සහතික ක්‍රමය (Foreign Exchange Entitlement Certificates - FEECS) හඳුන්වා දෙන ලදී. මෙම ක්‍රමය යටතේ ආනයන සීමා කිරීම සහ අපනයන ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ද්විත්ව විනිමය අනුපාතික ව්‍යුහයක් ස්ථාපිත කෙරිණි. ඒ අනුව, අත්‍යවශ්‍ය භාණ්ඩ




*රූප සටහන 1 : දේශීය විදේශ විනිමය වෙළඳපොළ සහභාගිවන්නන්*

ආනයන සඳහා නිල විනිමය අනුපාතිකය භාවිත කළ අතර, වෙනත් ගනුදෙනු සඳහා සාපේක්ෂව වැඩි අවප්‍රමාණයකින් යුත් විනිමය අනුපාතිකයක් භාවිත කරන ලදී. මෙය එම කාලයේ විදේශ විනිමය හිඟය කළමනාකරණය කිරීම සඳහා යොදාගත් ප්‍රතිපත්තිමය උපකරණයක් විය (Gunaratne, 2011; Weerasinghe, 2017).

1977 වසරේ දී ශ්‍රී ලංකාව විවෘත ආර්ථික ප්‍රතිපත්තියක් වෙත යොමු වීමත් සමඟ විනිමය අනුපාතික ප්‍රතිපත්තියෙහි සැලකිය යුතු වෙනසක් ඇති විය. ඒ අනුව, වෙළඳපොළ මූලධර්මවලට වැඩි අවකාශයක් ලබාදෙමින් පාලිත පාවෙන විනිමය අනුපාතික ක්‍රමය (Managed Floating Exchange Rate Regime) හඳුන්වා දෙන ලදී. මෙම රාමුව යටතේ ශ්‍රී ලංකා රුපියල විදේශ මුදල් පැසකට සම්බන්ධ කර පවත්වාගෙන යනු ලැබීය. මෙම ක්‍රමය යටතේ මහ බැංකුව ක්‍රමානුකූලව වෙනස්වන විනිමය අනුපාතික පරාසයක් (Crawling Band) තුළ දෛනික මිලදී ගැනුම් හා විකිණුම් විනිමය අනුපාතික ප්‍රකාශයට පත් කළේය. කෙසේ වෙතත්, ඉහළ යමින් පැවති ඛනිජ තෙල් මිල, ආරක්ෂක වියදම් ඉහළ යෑම සහ විදේශ විනිමය සංචිත පහළ යෑම හේතුවෙන් මෙම ක්‍රමය දීර්ඝකාලීනව පවත්වාගෙන යෑම අභියෝගාත්මක විය. මෙම පසුබිම තුළ 2001 ජනවාරි මාසයේ දී පාවෙන විනිමය අනුපාතික ක්‍රමය (Floating E·change Rate) අනුගමනය කිරීමට ශ්‍රී ලංකාව කටයුතු කළේය. එතැන් සිට විනිමය අනුපාතිකය වෙළඳපොළ බලවේග මත වැඩි වශයෙන් තීරණය වීමට ඉඩ ලබා දෙන ලදී. ඉන් අනතුරුව ගත වූ දශක දෙකක පමණ කාලය තුළ විනිමය අනුපාතික ප්‍රතිපත්තියේ ප්‍රධාන අවධානය යොමු වූයේ කෙටි කාලීන අධික විනිමය අනුපාතික උච්චාවචන පාලනය කිරීම සහ රටේ විදේශීය ස්වාරක්ෂක තවදුරටත් ශක්තිමත් කිරීම කෙරෙහි ය (International Monetary Fund, 2001; Weerasinghe, 2017).

2020 සිට 2025 දක්වා කාලය ශ්‍රී ලංකාවේ විදේශීය අංශයට සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළට විශේෂ අවධානය යොමු වූ කාල පරිච්ඡේදයකි. කොවිඩ්19 වසංගතයේ බලපෑම, සංචාරක ආදායම් පහත වැටීම, සහ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහත දැමීම හේතුවෙන් විදේශීය අංශය මත විශාල පීඩනයක් එල්ල විය. ඉන්පසු කාලය තුළ පරිපාලනමය ක්‍රියාමාර්ග මගින් විනිමය අනුපාතික ස්ථාවරත්වය පවත්වා ගැනීමට උත්සාහ කළ ද, 2022 මාර්තු මාසයේ දී විනිමය අනුපාතිකය වෙළඳපොළ තත්ත්වයන්ට

**රූප සටහන 2 : වසර අවසාන එ.ජ.ඩොලර්/ ශ්‍රී ලංකා රුපියල් නිරූපිත විනිමය අනුපාතිකය (1950-2026)**




මූලය : වෙළඳපොළ මෙහෙයුම් වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව, 2026 ජූනි

අනුව සකස් වීමට ඉඩ ලබාදෙන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය විය. වෙළඳපොළ තත්ත්වයන් යළි සකස් කර ක්‍රමවත්භාවය ඇති කිරීමේ අරමුණින්, 2022 මැයි සිට 2023 මාර්තු දක්වා කාලය තුළ මහ බැංකුව දෛනික වෙළඳපොළ මාර්ගෝපදේශන රාමුවක් හඳුන්වා දෙන ලදී. ඒ සමගම, විදේශ විනිමය සංචිත ගොඩනැගීම සහ සාර්ව ආර්ථික ස්ථාවරත්වය ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනකට ඇතුළත් විය (International Monetary Fund, 2023).

2023 මාර්තු මාසයේ දී නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමය නෛතික වශයෙන් හඳුන්වාදීමත් සමග විනිමය අනුපාතිකයට ස්වයංක්‍රීය ස්ථායීකාරකයක් සහ විදේශීය කම්පන අවශෝෂකයක් ලෙස ක්‍රියාකිරීමේ හැකියාව තවදුරටත් වර්ධනය විය. එමෙන්ම 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක කිරීම මගින් නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමය (Flexible Exchange Rate Regime) නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවේ (Flexible Inflation Targeting Framework) ප්‍රධාන සංරචකයක් ලෙස නිල වශයෙන් ස්ථාපිත කරන ලදී. මෙම රාමුව යටතේ මහ බැංකුව නිශ්චිත විනිමය අනුපාතික මට්ටමක් ඉලක්ක නොකරන අතර, විනිමය අනුපාතිකයේ අධික උච්චාවචන අවම කිරීම සහ විදේශ විනිමය සංචිත ශක්තිමත් කිරීම සඳහා පමණක් අවස්ථානුකූලව වෙළඳපොළට මැදිහත් වීම සිදු කරයි. එවැනි මෙහෙයුම් මගින් රටේ දළ නිල සංචිත ක්‍රමයෙන් වර්ධනය කිරීමට ද දායක වී ඇත.

### දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ මහ බැංකුවේ කාර්යභාරය

දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි මෙහෙයුම් කටයුතු මහ බැංකුවේ වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන දේශීය විදේශ විනිමය වෙළඳපොළ අංශය මගින් සිදුකරනු ලබයි. මෙම අංශය විනිමය අනුපාතික, විදේශ විනිමය වෙළඳපොළ ක්‍රියාකාරීත්වය සහ ඒ ආශ්‍රිත මෙහෙයුම් කටයුතු පිළිබඳව වගකීම දරයි. විනිමය අනුපාතිකයේ අධික උච්චාවචන පාලනය කිරීම, විදේශ විනිමය සංචිත ගොඩනැගීම සහ වෙළඳපොළ තුළ ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් පවත්වාගෙන යෑම මහ බැංකුවේ ප්‍රධාන කාර්යයක් වන අතර, මහ බැංකුව අවශ්‍ය හෝ හිතකර අවස්ථාවන්හි දී පමණක් වෙළඳපොළට මැදිහත්වීම් සිදු කරයි. මේ සඳහා මිල ගණන් කැඳවීමේ ඉල්ලීම් (Request for Quotes), සෘජු ද්විපාර්ශ්වික මැදිහත්වීම් (Direct Interventions) සහ ශිෂ්ට ප්‍රයෝග (Moral Suasion) යන ක්‍රමවේද භාවිත කෙරේ.

මෙයට අමතරව, මහ බැංකුව විදේශ විනිමය හුවමාරු (Foreign Exchange Swap) ගිවිසුම් ද ක්‍රියාත්මක කරයි. මෙම ගිවිසුම් හරහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමග එ.ජ. ඩොලර් සහ ශ්‍රී ලංකා රුපියල් තාවකාලිකව හුවමාරු කෙරේ. මෙම විදේශ විනිමය හුවමාරු ගිවිසුම්, ගැනුම් විකුණුම් සහ විකුණුම් ගැනුම් වශයෙන් දෙ ආකාර වන අතර එමගින් බැංකු පද්ධතියේ කෙටිකාලීන ද්‍රවශීලතා අවශ්‍යතා සහ විනිමය අනුපාතික ආශ්‍රිත අවදානම් කළමනාකරණ

රූප සටහන 3 : ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය විදේශ විනිමය වෙළඳපොළ මෙහෙයුම් කටයුතු



**රූප සටහන 4 : විදේශ විනිමය වෙළඳපොළෙහි මහ බැංකුවේ ශුද්ධ මැදිහත්වීම සහ දළ නිල සංචිත (2025 ජනවාරි - 2026 අගෝස්තු)**




අවශ්‍යතා සපුරාලීම සඳහා සහාය ලබා දේ. එමෙන්ම, මෙම ගනුදෙනු රටේ නිල විදේශ විනිමය සංචිත මට්ටම සහ රුපියල් ද්‍රවශීලතාව කළමනාකරණයට බලපෑම් ඇති කරන වැදගත් මෙහෙයුම් උපකරණයක් ලෙස ක්‍රියා කරයි.

මහ බැංකුව, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ක්‍රියාකාරීත්වය අඛණ්ඩව නිරීක්ෂණය කිරීම සිදු කරයි. ඒ සඳහා 'මධ්‍යම ඒකාබද්ධ වෙළඳපොළ මෙහෙයුම් පද්ධතිය' (Central Integrated Market Monitor - CIMM) මගින් අන්තර් බැංකු විදේශ විනිමය ගනුදෙනු අඛණ්ඩව නිරීක්ෂණය කරමින් විනිමය අනුපාතිකයේ චලනයන්, වෙළඳපොළ සහභාගිවන්නන්ගේ හැසිරීම් රටා, වෙළඳපොළ ක්ෂණික හා දිගුකාලීන විදේශ විනිමය අවශ්‍යතා මෙන්ම බැංකුවල ශුද්ධ විදේශ විනිමය අනාවරණ තත්ත්වය (Net Open Positions) පිළිබඳ තොරතුරු සොයා බැලීමට මහ බැංකුවට හැකියාව ඇත. එමෙන්ම 'විදේශ විනිමය ගනුදෙනු ගැලපුම් පද්ධතිය' (FX Matching Platform) හරහා තත්කාලීනව විනිමය අනුපාතිකයේ චලනයන් සහ වෙළඳපොළ ද්‍රවශීලතාව නිරීක්ෂණය කළ හැකි අතර, එමගින් මිල අනාවරණය, විනිවිදභාවය සහ වෙළඳපොළ කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට හැකියාව ලැබේ. බැංකුවල ශුද්ධ විදේශ විනිමය විවෘත තත්ත්වය නිරීක්ෂණය කිරීම මගින් විදේශ විනිමය අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා මහ බැංකුව කටයුතු කරයි. මේ සඳහා බලපත්‍රලාභී බැංකු සිය විදේශ විනිමය වත්කම් සහ වගකීම් පිළිබඳ තොරතුරු දෛනිකව වාර්තා කරන අතර, මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය තහවුරු කිරීම සඳහා මෙම තොරතුරු භාවිත කෙරේ.

### මෑත කාලීන ප්‍රවණතා සහ ඉදිරිමග

මෑත කාලීන වශයෙන්, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි තත්ත්වයන් සැලකිය යුතු ලෙස වැඩිදියුණු විය. විශේෂයෙන් 2024 වසර තුළ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, සංචාරක ඉපැයීම් සහ අපනයන ආදායම්වල වර්ධනය හේතුවෙන් විදේශ විනිමය සැපයුම් තත්ත්වයන් ශක්තිමත් වූ අතර, වෙළඳපොළ ක්‍රියාකාරීත්වය සහ මිල අනාවරණය ද වඩාත් ක්‍රමවත් විය. 2025 වසර තුළ මෝටර් රථ ආනයන ඉහළ යාම, භූ දේශපාලනික නොසන්සුන්තා සහ දිට්වා සුළි කුණාටුවේ බලපෑම් ඇතුළු විවිධ අභියෝග හේතුවෙන් විදේශ විනිමය වෙළඳපොළ මත පීඩනයක් ඇති විය. කෙසේ වෙතත්, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල වර්ධනය සහ අපනයන ආදායම් රුපියල් බවට පරිවර්තනය කිරීම ඉහළ යාම මගින් එම පීඩනයන් සැලකිය යුතු ලෙස සමනය කිරීමට හැකි වූ අතර, ශ්‍රී ලංකා රුපියලේ අවප්‍රමාණය මධ්‍යස්ථ මට්ටමක පවත්වා ගැනීමට දායක විය. 2026 වසරේ පළමු භාගය තුළ මැද පෙරදිග කලාපයේ උග්‍ර වූ භූ දේශපාලනික නොසන්සුන්තා, ආනයන ආශ්‍රිත විදේශ විනිමය ඉල්ලුම ඉහළ යාම සහ ප්‍රාග්ධන හා ලාභාංශ පිටතට ගලායාම් හේතුවෙන් ශ්‍රී ලංකා රුපියලේ අගය එ.ජ. ඩොලරයට සාපේක්ෂව

අවප්‍රමාණය වුව ද මහ බැංකුව හිතකර අවස්ථාවල දී විදේශ විනිමය වෙළඳපොළට කාලෝචිත මැදිහත්වීම් සිදුකර විදේශ විනිමය මිලදී ගනිමින් දළ නිල සංචිත ගොඩනැගීම සඳහා දායක විය.

වෙළඳපොළ තත්ත්වයන් ක්‍රමයෙන් වැඩිදියුණු වී ඇතත්, දේශීය විදේශ විනිමය වෙළඳපොළ තවදුරටත් අභියෝග කිහිපයකට මුහුණ දීමට සිදු වී තිබේ. ද්‍රවශීලතාව ඛණ්ඩනය වී පැවතීම, සීමිත වෙළඳපොළ වර්ධනය සහ ඇතැම් කාල පරිච්ඡේදවල විනිමය අනුපාතිකය අවප්‍රමාණය හෝ අතිප්‍රමාණය වීමේ ප්‍රවණතාව මත එක් වරක දී විදේශ විනිමය මිලදී ගැනීමට පමණක් හෝ විදේශ විනිමය විකිණීමට පමණක් සාමූහිකව නැඹුරු වෙමින් එක් දිශාවකට පමණක් සංකේන්ද්‍රණය වූ ගනුදෙනු සිදු කිරීම වැනි කරුණු ඒ අතර ප්‍රධාන වේ. එමෙන්ම, වෙළඳපොළ සහභාගිවන්නන් අතර පවතින තොරතුරු අසමමිතිය හේතුවෙන් කාර්යක්ෂම මිලකරණය සහ වෙළඳපොළ විනිවිදභාවය ද ඇතැම් අවස්ථාවල දුර්වල විය හැකිය. ගනුදෙනු පරිමාවන් තාවකාලිකව පහළ යෑම හෝ වෙළඳපොළ අසමතුලිතතා මතුවීම වැනි අවස්ථාවල දී, ක්‍රමවත් වෙළඳපොළ තත්ත්ව පවත්වා ගැනීම සඳහා මහ බැංකුවේ මැදිහත්වීම අවශ්‍ය වේ.

මේ අනුව, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි කාර්යක්ෂමතාව හා ස්ථායිතාව ශක්තිමත් කිරීම සඳහා පසුගිය වසර කිහිපය තුළ ප්‍රතිසංස්කරණ රැසක් ක්‍රියාත්මක කර ඇත. එහි වැදගත් පියවරක් ලෙස 2024 වසරේදී 'විදේශ විනිමය පිළිබඳ ගෝලීය ප්‍රශස්ත භාවිත සංග්‍රහය' (FX Global Code) දේශීය වෙළඳපොළට හඳුන්වා දෙන ලදී. එමගින් සාධාරණ, විනිවිදභාවයෙන් යුත් සහ විශ්වාසනීය විදේශ විනිමය වෙළඳපොළක් ප්‍රවර්ධනය කරමින් කාර්යක්ෂම ගනුදෙනු සහ තරගකාරී මිල ගණන් සඳහා පහසුකම් සැලසීම අරමුණු කරන ලදී.

එසේම මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයට තවත් වැදගත් අංගයක් එක් කරමින්, 2025 වසරේ දී 'විදේශ විනිමය ගනුදෙනු ගැලපුම් පද්ධතියක්' හඳුන්වා දෙන ලදී. මෙමගින් ගනුදෙනු තීරණ ගැනීමේ හැකියාව වැඩිදියුණු වන අතර, මිල අනාවරණය, වෙළඳපොළ විනිවිදභාවය සහ කාර්යක්ෂමතාව තවදුරටත් ඉහළ නැංවීම අරමුණ විය.

ඉදිරි කාලසීමාව තුළ, අන්තර්බැංකු විදේශ විනිමය වෙළඳපොළෙහි පවත්නා තත්ත්වයන් වඩාත් නිවැරදි ලෙස නිරූපණය කිරීම සඳහා, ජාත්‍යන්තරව පිළිගත් මාර්ගෝපදේශවලට අනුකූලව සකස් කරන ලද පදනම් විනිමය අනුපාතිකයක් (Reference Exchange Rate) හඳුන්වා දීමට මහ බැංකුව සැලසුම් කර ඇත. එමගින් මිල අනාවරණය සඳහා විශ්වාසනීය මූලාශ්‍රයක් සපයනු ඇති අතර, වෙළඳපොළ තුළ පවතින තොරතුරු අසමතුලිතතා අවම කිරීමට, අවදානම් කළමනාකරණය සහ විදේශ විනිමය ව්‍යුත්පන්න උපකරණ (FX derivatives) සංවර්ධනයට සහාය වීමට ද අපේක්ෂා කෙරේ.

## සමෝධානය

දේශීය විදේශ විනිමය වෙළඳපොළ තත්ත්වයන්, ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳාම, ආයෝජන, විදේශ ප්‍රේෂණ සහ බාහිර මූල්‍ය ගනුදෙනු සඳහා අත්‍යවශ්‍ය අංගයකි. වර්තමානයේ දී ශ්‍රී ලංකාවේ විනිමය අනුපාතිකය ප්‍රධාන වශයෙන් වෙළඳපොළ බලවේග මගින් තීරණය වන අතර, එම වෙළඳපොළෙහි විධිමත්බව, විනිවිදභාවය සහ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම සඳහා මහ බැංකුව අඛණ්ඩ නිරීක්ෂණය, නියාමන අධීක්ෂණය, වෙළඳපොළ මැදිහත්වීම් සහ ද්‍රවශීලතා කළමනාකරණ මෙහෙයුම් සිදු කරයි. ඒ අනුව, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ස්ථාවරත්වය සහ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම මගින් ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ තිරසාර ආර්ථික වර්ධනය සඳහා දායක වීමට මහ බැංකුව කටයුතු කරමින් සිටී.

## ප්‍රධාන මූලාශ්‍ර

Gunaratne, S. (2011), Determining the exchange rate – Exchange rate regimes in Sri Lanka, 60th Anniversary Commemorative Volume (pp. 69-78). Central Bank of Sri Lanka.

International Monetary Fund. (2001, April 20), Press release: IMF approves US$253 million stand-by arrangement for Sri Lanka, International Monetary Fund.

International Monetary Fund. (2023, March 20), Press release: IMF Executive Board approves US$3 billion under the new Extended Fund Facility (EFF) arrangement for Sri Lanka, International Monetary Fund.

Weerasinghe, P.N. (2018), Evolution of monetary and exchange rate policy in Sri Lanka and the way forward, Retrieved from https://www.bis.org/review/r180123d.htm.



# සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් සහ මුදල් ප්‍රතිපත්තිය

**ෂමෝදා ප්‍රේමරත්න**
**සහකාර අධ්‍යක්ෂ**
**වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව**

## හැඳින්වීම

වර්තමානයේ ඩිජිටල් ගෙවීම් ක්‍රමවේද ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වී තිබුණ ද, මහජනතාව සතුව පවතින මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්, මුදල් සහ මූල්‍ය පද්ධතියේ වඩාත් වැදගත් සංරචකයක් ලෙස තවදුරටත් පවතී. මුදල් ප්‍රතිපත්තිමය කෝණයෙන් සලකා බැලීමේ දී, සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණයෙහි උච්චාවචන, බැංකු පද්ධතියේ ද්‍රවශීලතාව, මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සහ මුදල් ප්‍රතිපත්ති තීරණ පුළුල් ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය වීම කෙරෙහි සෘජුවම බලපායි. එබැවින්, සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණය අධීක්ෂණය කිරීම සහ නිවැරදිව පුරෝකථනය කිරීම මහ බැංකුවල අත්‍යවශ්‍ය මෙහෙයුම් අවශ්‍යතාවක් බවට පත්ව ඇත. සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම කෙරෙහි බලපාන විශාලතම ස්වායත්ත ද්‍රවශීලතා සාධකවලින් එකක් ලෙස සැලකේ.

මෙම ලිපිය තුළින් සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්, මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාව කෙරෙහි ඇති කරන බලපෑම සහ එමගින් ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම කෙරෙහි ඇතිවන බලපෑම් විමසා බැලීම සහ ආර්ථිකයට නව මුදල් නිකුත් කිරීම සහ "මුදල් මුද්‍රණය" (Money Printing) යන සංකල්ප සම්බන්ධයෙන් පවතින දුර්මත පැහැදිලි කිරීම අරමුණු කරයි.

## සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් යනු කුමක්ද?

සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් යනු මහ බැංකුවක් විසින් ආර්ථිකයෙහි භාවිතය සඳහා නිකුත් කර ඇති මුදල් නෝට්ටු සහ කාසිවල සමස්ත වටිනාකමයි. කෙසේ වෙතත්, මහ බැංකුවේ සුරක්ෂිතාගාරවල පවතින මුදල් නෝට්ටු සහ කාසි මෙන්ම, වාණිජ බැංකු විසින් නැවත මහ බැංකුව වෙත භාර දෙන ලද මුදල් නෝට්ටු සහ කාසි, සංසරණයෙහි පවතින මුදල්වල කොටසක් ලෙස නොසැලකේ.

සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්, ආර්ථිකයේ මුදල් පදනමෙහි (Monetary Base) ප්‍රධාන සංරචකයක් වන අතර, ගනුදෙනු සඳහා සහ හදිසි අවස්ථාවන්ට සූදානම් වීම සඳහා භාවිත කරන වඩාත්ම ද්‍රවශීලී මුදල් ස්වරූපය වේ. එමෙන්ම, විශේෂයෙන් පොලී අනුපාතික පහළ මට්ටමක පවතින අවස්ථාවල දී සහ ආර්ථික අවිනිශ්චිතතා සහිත කාලවල දී මහජනතාව වැඩි මුදල් ප්‍රමාණයක් සිය සන්තකයේ තබා ගැනීමට ප්‍රවණතාවක් දක්වන බැවින්, වටිනාකම රඳවා තබා ගැනීමේ මාධ්‍යයක් ලෙස ද එය ක්‍රියා කරයි. ආර්ථික වර්ධනය හේතුවෙන් ආදායම් මට්ටම්, පරිභෝජන රටා

සහ ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළ යෑම සාමාන්‍යයෙන් මුදල් සඳහා වන ඉල්ලුම ඉහළ නංවයි.

පොලී ආදායම් උපයන මූල්‍ය උපකරණවල ඉතිරි කිරීම් ඉහළ යයි. ඊට ප්‍රතිවිරුද්ධව, පොලී අනුපාතික පහළ

රූප සටහන 01: සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් (රු. බිලියන) 2022 සිට 2026 දක්වා




ඊට හේතුව වන්නේ මුදල් සඳහා වන ඉල්ලුම ප්‍රධාන වශයෙන් ගනුදෙනු අවශ්‍යතා මගින් තීරණය වීමයි. ඒ අනුව, ආර්ථික ප්‍රසාරණයක් පවතින කාලවල දී, ඒ හේතුවෙන් ආදායම් ඉහළ යෑම සාමාන්‍යයෙන් ගනුදෙනු පරිමාව ඉහළ නැංවීමට හේතු වන අතර, එමගින් කුටුම්බ සහ ව්‍යාපාර විසින් මුදල් සඳහා කරනු ලබන ඉල්ලුම ද ඉහළ යයි. එහි ප්‍රතිඵලයක් ලෙස, ආර්ථික ගනුදෙනු සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය මුදල් ප්‍රමාණය ඉහළ යෑම පිළිබිඹු කරමින්, සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්වල වර්ධනය සාමාන්‍යයෙන් ආර්ථික ප්‍රසාරණයේ වේගයට අනුකූලව සිදු වේ.

ඉහළ උද්ධමනයක් පවතින විට එදිනෙදා ගනුදෙනු සිදු කිරීම සඳහා වැඩි මුදල් ප්‍රමාණයක් අවශ්‍ය වන බැවින්, මුදල් සඳහා වන ඉල්ලුම ඉහළ යයි. එමෙන්ම, භෞතික මුදල් මගින් කිසිදු ප්‍රතිලාභයක් නොලැබෙන බැවින්, මුදල් සිය සන්තකයේ තබා ගැනීම එය දරන්නාට පිරිවැයක් ඇති කරයි. අදාළ මුදල් බැංකුවක තැන්පත් කිරීමෙන් උපයාගත හැකිව තිබූ, එහෙත් අහිමි වන ප්‍රතිලාභය, මුදල් තබා ගැනීමේ ආවස්ථික පිරිවැය නියෝජනය කරයි. ඒ අනුව, පොලී අනුපාතික ඉහළ යන විට ආවස්ථික පිරිවැය ඉහළ යන බැවින් මුදල් තබා ගැනීමට පවතින දිරිගැන්වීම් අඩු වන අතර, යන විට මුදල් තබා ගැනීමේ ආවස්ථික පිරිවැය අඩු වන බැවින්, එය සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණය ප්‍රසාරණය වීමට හේතු වේ.

ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල්වල හැසිරීමද මෙම සාධක වල බලපෑම නිරූපණය කරයි. එමෙන්ම උත්සව සමය සහ සංස්කෘතික ඉසව් ආදිය හේතුවෙන් ද මුදල් සඳහා වන ඉල්ලුම ඉහළ යයි. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සලකා බලන විට, විශේෂයෙන් අප්‍රේල් සහ දෙසැම්බර් මාස ආශ්‍රිත උත්සව සමයන්හි මෙන්ම, සාමාන්‍යයෙන් වියදම් ඉහළ යන මැතිවරණ කාලසීමා වැනි විශේෂ අවස්ථාවල දී ද මුදල් සඳහා වන ඉල්ලුම ඉහළ යෑමේ ප්‍රවණතාවක් පවතී.

## සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් සහ බැංකු ද්‍රවශීලතාව

සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්, බැංකු පද්ධතියේ ද්‍රවශීලතා තත්ත්වය තීරණය කරන ප්‍රධාන ස්වායත්ත සාධකවලින් එකකි. කුටුම්බ සහ ව්‍යාපාර විසින් වාණිජ බැංකුවලින් මුදල් ඉල්ලුම් කරන අවස්ථාවන්හි දී වාණිජ බැංකු මහ බැංකුවෙන් මුදල් ආපසු ලබා ගන්නා සෑම අවස්ථාවක දී ම, බැංකු විසින් මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන ව්‍යවස්ථාපිත සංචිත ඊට

සමාන ප්‍රමාණයකින් අඩු වේ. ඊට ප්‍රතිවිරුද්ධව, තැන්පතු මගින් මුදල් නැවත බැංකු පද්ධතිය වෙත අවශෝෂණය වන විට, ව්‍යවස්ථාපිත සංචිත ස්වයංක්‍රීයව ඉහළ යයි.

විවට වෙළඳපොළ කටයුතු හේතුවෙන් ඇති වන ද්‍රවශීලතා වෙනස්වීම් මෙන් නොව, සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්වල වෙනස්වීම් කුටුම්බ සහ ව්‍යාපාරවල හැසිරීම මත පදනම් වේ. ඒ අනුව, සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්වල දෛනික වෙනස්වීම් මගින් අඛණ්ඩව ස්වායත්ත ද්‍රවශීලතා කම්පන ඇති කරන අතර, ඒවා මුදල් මෙහෙයුම් කටයුතු මගින් ප්‍රතිතුලනය කිරීමට මහ බැංකුවකට කටයුතු කිරීමට සිදුවිය හැකිය. සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් සහ බැංකු පද්ධතියේ ද්‍රවශීලතාව අතර පවතින ප්‍රතිලෝම සම්බන්ධතාව හේතුවෙන්, මහ බැංකු විසින් භාවිත කරනු ලබන ද්‍රවශීලතා පුරෝකථන රාමුවෙහි වඩාත් වැදගත් සංරචකයක් ලෙස සංසරණයෙහි පවතින මුදල් පුරෝකථනය සැලකේ.

### සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් සහ ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්තිය

උද්ධමන අරමුණු ළඟා කර ගැනීම සඳහා සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව කෙටිකාලීන වෙළඳපොළ පොලී අනුපාතික හැසිරවීම උදෙසා මහ බැංකු විසින් විවට වෙළඳපොළ කටයුතු මගින් දේශීය මුදල් වෙළඳපොළේ ද්‍රවශීලතාව සක්‍රීයව කළමනාකරණය කෙරේ.

මුදල් සඳහා වන ඉල්ලුමෙහි වෙනස්වීම් හේතුවෙන් මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන වාණිජ බැංකුවල ව්‍යවස්ථාපිත සංචිත ශේෂයන් ස්වයංක්‍රීයව වෙනස් වන බැවින්, සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්වල උච්චාවචන මුදල් වෙළඳපොළේ ද්‍රවශීලතා තත්ත්ව කෙරෙහි අඛණ්ඩව බලපායි. මෙම ද්‍රවශීලතා වෙනස්වීම් කෙටිකාලීන වෙළඳපොළ පොලී අනුපාතික කෙරෙහි බලපාන අතර, එබැවින් අපේක්ෂිත මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පවත්වා ගැනීම සඳහා කාලෝචිත ප්‍රතිපත්තිමය ප්‍රතිචාර අවශ්‍ය වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කරනු ලබන නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ, මුදල් ප්‍රතිපත්තිය සඵලදායී ලෙස සම්ප්‍රේෂණය වීම සඳහා ප්‍රධානතම කෙටිකාලීන පොලී අනුපාතිකය වන බරිත සාමානය ඒක්ෂණ මුදල් අනුපාතිකය (Average Weighted Call Money Rate – AWCMR) මහ බැංකුවේ මෙහෙයුම් ඉලක්කය ලෙස ක්‍රියා කරන අතර කෙටිකාලීන මුදල් වෙළඳපොළ පොලී අනුපාතික එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට (Overnight Policy Rate - OPR) අනුරූපව පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්වල වෙනස්වීම්, ද්‍රවශීලතා උච්චාවචන ඇති කරන ස්වායත්ත මූලාශ්‍රයක් වන බැවින්, මුදල් සඳහා වන ඉල්ලුම නිවැරදිව පුරෝකථනය කිරීම තුළින් ද්‍රවශීලතා හිඟයන් හෝ අතිරික්තයන් කල්තබා හඳුනාගෙන, සිය මුදල් මෙහෙයුම් කටයුතු නිසි පරිදි සිදු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකි වේ. මෙම ද්‍රවශීලතා තත්ත්ව සඵලදායී ලෙස කළමනාකරණය කිරීම මගින් මහ බැංකුවේ මෙහෙයුම් ඉලක්කය ලෙස ක්‍රියා කරන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (Average Weighted Call Money Rate – AWCMR) එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට (Overnight Policy Rate – OPR) අනුරූපව පවත්වා ගැනීමට මහ බැංකුවට හැකි වන අතර, එමගින්, මූල්‍ය වෙළඳපොළ වෙත සහ අවසානයේ උද්ධමනය හා ආර්ථික ක්‍රියාකාරකම් වෙත මුදල් ප්‍රතිපත්තිය සම්ප්‍රේෂණය වීමට සහාය සැලසෙයි.

### ආර්ථිකයට නව මුදල් නිකුත් කිරීම සහ "මුදල් මුද්‍රණය"

ආර්ථිකයේ සුමට ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය ප්‍රමාණවත් මුදල් සැපයුමක් පවත්වාගෙන යෑම ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන වගකීමකි. ආර්ථික විද්‍යාත්මක අර්ථයෙන්, නව මුදල් නිකුත් කිරීම යනු සංචිත මුදල් (Reserve Money) ප්‍රමාණය ඉහළ යෑමයි. සංචිත මුදල් යනු ප්‍රධාන වශයෙන් සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්, සහ වාණිජ බැංකු මහ බැංකුවේ පවත්වාගෙන යන සංචිත ශේෂවල එකතුවයි. සංචිත මුදල් ප්‍රමාණය ඉහළ යෑම, මහජනතාවගේ මුදල් අවශ්‍යතාව සපුරාලීම සඳහා නව මුදල් නෝට්ටු හා කාසි නිකුත් කිරීමෙන් හෝ මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිමය මෙහෙයුම් හේතුවෙන් වාණිජ බැංකු සංචිත ශේෂවල සිදුවන වෙනස්වීම් මගින් හෝ එම ක්‍රියාවන් දෙකෙන්ම සිදුවිය හැකිය.

ඒ අනුව, නව මුදල් නිකුත් කිරීම යනු භෞතික වශයෙන් මුදල් නෝට්ටු හා කාසි මුද්‍රණය කර සංසරණයට නිකුත් කිරීම පමණක් ලෙස සැලකිය නොහැකි අතර, පොදුවේ භාවිත වන "මුදල් මුද්‍රණය" (Money Printing) යන යෙදුම සමග ද සමාන කළ නොහැකිය. ආර්ථිකයේ වර්ධනයත් සමග ගනුදෙනු ප්‍රමාණය ඉහළ යන බැවින් මුදල් සඳහා ඇති ඉල්ලුම

ද වර්ධනය වේ. එබැවින්, එම අවශ්‍යතාවයට සරිලන පරිදි සංචිත මුදල් ප්‍රමාණයද වර්ධනය වීම ආර්ථිකයක් තුළ සාමාන්‍ය ක්‍රියාවලියකි. සංචිත මුදල් ප්‍රමාණය ඉහළ යෑම පමණක් හුදෙක් උද්ධමනයක් ඇති නොකරයි. උද්ධමන පීඩන ඇති වන්නේ ආර්ථිකයේ නිෂ්පාදන ධාරිතාව හරහා ඇතිවන මුදල් ඉල්ලුම ඉක්මවා අඛණ්ඩව මුදල් නිර්මාණය කරන විටය.

එමෙන්ම, මහ බැංකුවක් විසින් සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ට අනුව විවට වෙළඳපොළ මෙහෙයුම් සිදු කරන්නේ ආර්ථිකයේ මුදල් සැපයුම ස්ථිරව ඉහළ නැංවීම සඳහා නොව, බැංකු පද්ධතියේ කෙටි කාලීන ද්‍රවශීලතා තත්ත්වයන් කළමනාකරණය කිරීම සඳහාය. දෛනික ද්‍රවශීලතා පුරෝකථන මත පදනම්ව හඳුනාගනු ලබන තාවකාලික ද්‍රවශීලතා අසමතුලිතතා සමනය කිරීම සඳහා තාවකාලික පදනම මත මහ බැංකුව ප්‍රතිවිකුණුම් (Reverse Repurchase) ගනුදෙනු යටතේ රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම සහ ප්‍රතිමිලදී ගැනුම් (Repurchase) ගනුදෙනු යටතේ රජයේ සුරැකුම්පත් විකිණීම සිදු කරයි. ප්‍රතිවිකුණුම් (Reverse Repurchase) ගනුදෙනු යටතේ සුරැකුම්පත් මිලදී ගන්නා විට වාණිජ බැංකු සංචිත ශේෂ ඉහළ යාම මගින් බැංකු පද්ධතියට ද්‍රවශීලතාව එක් කෙරෙන අතර, ප්‍රතිමිලදී ගැනුම් (Repurchase) ගනුදෙනු යටතේ සුරැකුම්පත් විකිණීමේ දී වාණිජ බැංකු සංචිත ශේෂ අඩුවීම මගින් අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කරනු ලැබේ. ඒ අනුව, විවට වෙළඳපොළ මෙහෙයුම් මගින් සිදු වන්නේ පොලී අනුපාතික ස්ථායිතාව සඳහා බැංකු පද්ධතියේ සංචිත ශේෂ කෙටිකාලීනව කළමනාකරණය කිරීම වන අතර, එය හුදෙක් පටු අර්ථයෙන් "මුදල් මුද්‍රණය"ලෙස අර්ථ දැක්වීම නිවැරදි නොවේ.

මෙවැනි තවත් අදහසක් වන්නේ, මහ බැංකුව විසින් රජයේ අයවැය හිඟය මූල්‍යකරණය කිරීම සඳහා ප්‍රාථමික වෙළඳපොළෙන් රජයේ සුරැකුම්පත් මිලදී ගනිමින් තවදුරටත් මුදල් මූල්‍යකරණය (Monetary Financing) සිදු කරන බව, එනම්, රජයේ මුදල් අවශ්‍යතා සඳහා ව්‍යවහාර මුදල් නිකුත් කරන බවයි. කෙසේ වුවද, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 86 වැනි වගන්තිය අනුව රජයේ වියදම් මූල්‍යකරණය කිරීම සඳහා ප්‍රාථමික වෙළඳපොළෙන් රජයේ සුරැකුම්පත් මිලදී ගැනීමට මහ බැංකුවට හැකියාවක් නැත. එය කළ හැකි වන්නේ විශේෂිත සහ සීමිත තත්ත්වවල දී පමණි. එබැවින්, වර්තමානයේ මහ බැංකුව මගින් නව මුදල් නිර්මාණය කරමින් රජයේ අයවැය හිඟය මූල්‍යකරණය සිදු නොකෙරේ.

**සමෝධානය**

සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් යනු සංචිත මුදල්වල සංරචකයක් හෝ හුවමාරු මාධ්‍යයක් පමණක් නොවේ. එය බැංකු පද්ධතියේ ද්‍රවශීලතාව තීරණය කරන වඩාත් වැදගත් ස්වායත්ත සාධකවලින් එකක් වන අතර, ඒ අනුව මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී තීරණාත්මක සාධකයක් ද වේ. සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්වල වෙනස්වීම් මගින් වාණිජ බැංකුවල සංචිත ශේෂ වෙනස් වන අතර, එය මුදල් වෙළඳපොළේ ද්‍රවශීලතා තත්ත්වයන්ට සහ සමස්ත මූල්‍ය පද්ධතිය හරහා මුදල් ප්‍රතිපත්ති තීරණ සම්ප්‍රේෂණය වීමට බලපෑම් ඇති කරයි. ඒ අනුව, සඵලදායී ද්‍රවශීලතා කළමනාකරණයට සහ කෙටිකාලීන වෙළඳපොළ පොලී අනුපාතික අපේක්ෂිත මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව පවත්වා ගැනීමට බලපෑමක් ඇති බැවින්, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ විශ්වසනීයත්වය, කාර්යක්ෂමතාව සහ සඵලදායීතාව උදෙසා ව්‍යවහාරයෙහි පවතින සංචිත මුදල් වැදගත් බලපෑමක් සිදු කරයි.

**මූලාශ්‍ර**

International Monetary Fund (2016), Monetary and financial statistics manual and compilation guide, International Monetary Fund.

Bank for International Settlements (2018), 'Payments are a-changing but cash still rules', BIS Quarterly Review, March 2018.

International Monetary Fund (2023), Currency in circulation and cash paradox data, International Financial Statistics, International Monetary Fund.



# ගෙවීම් හා පියවීම් පද්ධතිය තුළ බැංකුකරුවෙකු ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය

**වෙනුර වන්නිආරච්චි**
**ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ**
**වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව**

## හැඳින්වීම

ආර්ථිකයක ගෙවීම් පද්ධතියක් යනු පුද්ගලයන්, ව්‍යාපාර, මූල්‍ය ආයතන සහ රජය අතර මුදල් හුවමාරු කිරීමට පහසුකම් සලසන ආයතන, ගෙවීම් උපකරණ ක්‍රියා පටිපාටි, නීති සහ තාක්ෂණික මෙවලම්වලින් සමන්විත ජාලයක් වන අතර එය මූල්‍ය යටිතල පහසුකම්වල ප්‍රධාන අංගයක් වේ. ආර්ථිකයක ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීම උදෙසා, ආරක්ෂිත හා කාලෝචිත පියවීම් සහතික කිරීම, මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවයට සහාය වීම, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සහාය වීම හා මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම ගෙවීම් පද්ධතියක ප්‍රධාන කාර්යභාරය වේ. ආර්ථිකයක් තුළ මූල්‍ය සම්පත් ගෘහස්ථ ඒකක, ව්‍යාපාර, බැංකු සහ රජය අතර ආරක්ෂිතව, කඩිනමින් සහ කාර්යක්ෂමව සංසරණය විය යුතු අතර එම කාර්යය සිදු කරනු ලබන්නේ ගෙවීම් පද්ධතිය මගිනි. ශ්‍රී ලංකාවේ මෙම කාර්යයේ ප්‍රධාන වගකීම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇති අතර, ශ්‍රී ලංකා මහ බැංකුව බැංකු පද්ධතියේ අවසාන පියවීම් ආයතනය ලෙසත්, ප්‍රධාන බැංකුකරු ලෙසත් ක්‍රියා කරයි. මෙහි දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙවීම, නිෂ්කාශනය හා පියවීම් යන ක්‍රියාවලීන් තුනෙහිම කටයුතු සිදු කරනු ලබයි.

මෙම ලිපියේ අරමුණ වන්නේ බැංකුවල බැංකුකරු ලෙස සහ රජයේ බැංකුකරු ලෙස ගෙවීම් හා පියවීම් පද්ධතිය තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ භූමිකාව, එහි මෑතකාලීන ප්‍රවණතා, ජාත්‍යන්තර අත්දැකීම් සහ ඉදිරි ගමන්මග පිළිබඳ පැහැදිලි කිරීමයි.

## "බැංකුවල බැංකුකරු" ලෙස මහ බැංකුවේ භූමිකාව

මහ බැංකුව, "බැංකුවල බැංකුකරු" ලෙස බැංකු පද්ධතිය කාර්යක්ෂමව ක්‍රියාත්මක වීමට අවශ්‍ය මූලික පහසුකම් සැපයීමේ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙම වගකීම යටතේ, බලපත්‍රලාභී වාණිජ බැංකුවල සංචිත සහ පියවීම් ගිණුම් පවත්වාගෙන යෑම, අන්තර් බැංකු ගනුදෙනු සුරක්ෂිතව හා කාර්යක්ෂමව පියැවීමේ පහසුකම් සැලසීම, අවශ්‍ය අවස්ථාවල දී ද්‍රවශීලතා පහසුකම් සැපයීම සහ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සහාය වීම මහ බැංකුව විසින් සිදු කරනු ලැබේ. මෙම කාර්යයන් මගින් බැංකු ගෙවීම් සහ පියවීම් පද්ධතිවල කාර්යක්ෂමතාව, ස්ථායිතාව සහ විශ්වසනීයත්වය තහවුරු කිරීමට මහ බැංකුව දායක වේ.

(අ) මූල්‍යායතනවල ගිණුම් පවත්වාගෙන යෑම

තත්කාලීන දළ පියවීම් පද්ධතියේ සහභාගීත්ව ආයතන වන බැංකු සහ මූල්‍ය ආයතනවල ගිණුම් පවත්වාගෙන යෑම මහ බැංකුව විසින් සිදු කරයි. ඉහළ වටිනාකම්වලින් යුත් කාල සංවේදී ගනුදෙනු පියවීම් සඳහා මෙම ගිණුම් මූලික පදනම සකසන අතර, මෙම පද්ධතිය යටතේ සිදුවන සෑම ගෙවීමක්ම මහ බැංකුවේ පවත්වාගෙන යන පියවීම් ගිණුම් හරහා සිදුවන බැවින් මූල්‍ය ආයතන අතර ඇතිවිය හැකි ණය, ද්‍රවශීලතා සහ පියවීම් අවදානම් අවම කරයි. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සැලකූ විට, මහ බැංකුවේ වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් අදාළ පොදු ලෙජර් ගිණුම් පවත්වාගෙන යනු ලබන අතර, එමගින් තත්කාලීන දළ පියවීම් පද්ධතිය හරහා ක්‍රියාත්මක කරන ඉහළ වටිනාකමින් යුතු අන්තර් බැංකු ගෙවීම්, පියවීම්, අන්තර් බැංකු මුදල් වෙළඳපොළ ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම, මහ බැංකුව විසින් සිදු කරන මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් පියවීම් සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවල ව්‍යවස්ථාපිත සංචිත පවත්වාගෙන යෑම යන කටයුතු සිදු කෙරේ.

(ආ) අන්තර් බැංකු ගෙවීම් සඳහා පහසුකම් සැලසීම

සහභාගී පාර්ශ්වයන් අතර සිදුවන අරමුදල් හුවමාරු කිරීම, මුදල් වෙළඳපොළ ගනුදෙනු, දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ සිදුවන ගනුදෙනු හා සුරැකුම්පත් ගනුදෙනු වැනි ගනුදෙනු හේතු කොටගෙන ගෙවීම් වගකීම් ඇති වන අතර, මහ බැංකුව විසින් පවත්වාගෙන යන ගිණුම් මගින් මෙම වගකීම් සුරක්ෂිතව හා කාර්යක්ෂමව පියවීමට හැකියාව ලැබේ. යම් ආයතනයක් විසින් ඉහළ වටිනාකමින් යුතු ගෙවීමක් පියවීම් ප්‍රමාද කිරීම හෝ පියවීමට අපොහොසත්වීම මූල්‍ය ආයතන කිහිපයකට හෝ සමස්ත මූල්‍ය පද්ධතියම අස්ථාවර වීමට හේතු විය හැක. නමුත්, මහ බැංකුවේ පවත්වා ගනු ලබන අදාළ පියවීම් ගිණුම් තුළ ප්‍රමාණවත් අරමුදල් හෝ ද්‍රවශීලතාව පවතින විට ගනුදෙනු වෙන් වෙන්ව සහ ක්ෂණිකව තත්කාලීන දළ පියවීම් පද්ධතිය හරහා පියවීම් මගින් මෙම අවදානම අවම කරයි.

(ඇ) අන්තර් බැංකු මුදල් වෙළඳපොළට සහාය වීම

දේශීය අන්තර් බැංකු මුදල් වෙළඳපොළ තුළ කටයුතු කරන ආයතනයක තාවකාලික ද්‍රවශීලතා හිඟයක් ඇතිවූ විට ද්‍රවශීලතා අතිරික්තයක් සහිත පාර්ශ්වයන්ගෙන් ණය ලබා ගැනීමේ හැකියාව පවතී. එම ගනුදෙනු පියවීම් සිදුකරන්නේ ද මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන පොදු ලෙජර ගිණුම් හරහාය. මෙමගින් අන්තර් බැංකු මූල්‍ය වෙළඳපොළේ පවතින අතිරික්ත ද්‍රවශීලතාව කාර්යක්ෂමව හුවමාරු කිරීමට හැකියාව ලැබේ. මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති වෙනස්වීම් එක්දින අන්තර් බැංකු පොලී අනුපාතික සඳහාත්, ඉන් අනතුරුව ආර්ථිකයේ අනෙකුත් පොලී අනුපාතික සඳහාත් බලපාන බැවින් එය මුදල් ප්‍රතිපත්තිය සම්ප්‍රේෂණය කිරීමට ද දායක වේ. තව ද, මහ බැංකුව විසින් මෙම ගිණුම් ශේෂ හා මුදල් වෙළඳපොළ තත්ත්වයන් අධීක්ෂණය කරමින් සමස්ත බැංකු පද්ධතියේම ද්‍රවශීලතාව තක්සේරු කිරීම සිදු කරන අතර, අවශ්‍ය අවස්ථාවල දී මුදල් ප්‍රතිපත්තියට අනුකූලව කෙටිකාලීන පොලී අනුපාතික හැසිරවීම සඳහා විවට වෙළඳපොළ කටයුතු සහ නිත්‍ය පහසුකම් මගින් ද්‍රවශීලතාව සැපයීම හෝ අවශෝෂණය කිරීම ද සිදු කරයි.

(ඈ) ව්‍යවස්ථාපිත සංචිත පවත්වාගෙන යෑම

මහ බැංකුව මුදල් ප්‍රතිපත්ති උපකරණයක් ලෙස බැංකු මත ව්‍යවස්ථාපිත සංචිත අනුපාත පනවා, පවත්වාගෙන යනු ලබයි. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කළ, සියලුම වාණිජ බැංකු දේශීය ව්‍යවහාර මුදලින් පවත්වාගෙන යන තැන්පතු වගකීම්වලින් මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අනුපාතයට අනුකූල මුදලක් සංචිත වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යා යුතුය. මෙම සංචිත පවත්වාගෙන යෑම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මහ බැංකුවේ තිබෙන පොදු ලෙජර් ගිණුම් භාවිත කරනු ලබයි. ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවයේ සිදුවන වෙනස් වීම් වාණිජ බැංකුවල ණය ලබාදීම සහ ආයෝජනය සඳහා පවතින අරමුදල් ප්‍රමාණයට සෘජුවම බලපාන අතර, නියාමනය පහසු කිරීම සහ මුදල් ප්‍රතිපත්තිය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ගිණුම් පවත්වාගෙන යෑම සහ අධීක්ෂණය කිරීම වැදගත් වේ.

(ඉ) කුඩා පරිමාණ ගෙවීම් පද්ධතිවල පියවීම්

චෙක්පත් මාධ්‍යයෙහි වන ගෙවීම්, අන්තර් බැංකු විද්‍යුත් මුදල් හුවමාරු, කාඩ්පත් සහ ක්ෂණික ගෙවීම් පද්ධති (Payment Apps) හරහා සිදුකරන ගනුදෙනු මුලින්ම නිෂ්කාශන පද්ධති මගින් නිෂ්කාශනය කරනු

ලැබේ. ඒවායින් බැංකු අතර ඇතිවන ශුද්ධ ශේෂයන් අවසානයේ තත්කාලීන දළ පියවීම් පද්ධතිය හරහා මහ බැංකුව විසින් පියවනු ලබයි. ඒ අනුව, සෑම කුඩා පරිමාණ ගෙවීමක් සඳහාම මහ බැංකුව සෘජුව මැදිහත්වීමක් නොවුව ද, එම ගෙවීම් තුළින් පැන නගින බැංකු අතර අවසාන වගකීම් පියැවීමේ මධ්‍යස්ථානය ලෙස මහ බැංකුව කටයුතු කරයි.

**(ඊ) දිනය තුළ ද්‍රවශීලතා පහසුකම් සැපයීම (Intra-day Liquidity Facility)**

තත්කාලීන දළ පියවුම් පද්ධතියේ පාර්ශ්වයන්ට දිනය තුළදී ඇතිවිය හැකි ද්‍රවශීලතා හිඟයන් මග හරවා ගැනීමට සුදුසු සුරැකුම්පත් ඇපයට තබාගෙන අරමුදල් ලබාදීම තුළින් ඇතිවිය හැකි ගෙවීම් ප්‍රමාද වීම සහ පියවීම් අවහිර වීම වැළැක්වීමට මහ බැංකුව කටයුතු කරයි. මෙමගින් බැංකුවලට ලැබෙන සහ බැංකුවලින් පිටතට ගෙවනු ලබන මුදල් ප්‍රවාහයන් අතර වන කාල පරාසයන් හේතුවෙන් ඇතිවන තාවකාලික ද්‍රවශීලතා හිඟයන් පියවා ගැනීමට පහසුකම් සැලසෙන අතර, එමගින් කෙටිකාලීන පොලී අනුපාතික මත ඇතිවන පීඩන අවම කිරීමට උපකාරී වේ.

**"රජයේ බැංකුකරු" ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ භූමිකාව**

2023 අංක 16 දරන මහ බැංකු පනත ප්‍රකාරව, ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ මූල්‍ය කටයුතු සඳහා සහාය දැක්වීමේ දී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව රටේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, නිල විදේශ විනිමය සංචිත කළමනාකරණය කිරීම, ව්‍යවහාර මුදල් නිකුත් කිරීම හා කළමනාකරණය, මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය ආරක්ෂා කිරීම මෙන්ම විශේෂයෙන් රජයේ බැංකුකරු ලෙස ද ක්‍රියා කරයි.

ඒ අනුව, මහ බැංකු පනතේ අංක 81 හා 82 දරන වගන්ති ප්‍රකාරව රජයේ මූල්‍ය උපදේශක, රජය මූල්‍ය නියෝජිත හා රජයේ බැංකුකරු ලෙස කටයුතු කිරීමට නීතිමය ප්‍රතිපාදන සපයා දී තිබේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණ වන මිල ස්ථායිතාව පවත්වාගෙන යාමේ අරමුණට හෝ මහ බැංකුවේ ස්වාධීනත්වයට බලපෑමක් නොවන අයුරින් මෙම කාර්යභාරය ඉටුකළ යුතුය. මේ යටතේ මහ බැංකුව පහත සඳහන් කාර්යයන් ඉටු කරයි.

**(අ) රජයේ ගිණුම් පවත්වාගෙන යාම**

රජයේ බැංකුකරු ලෙස මහ බැංකුව රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය ආයතන සහ ඇතැම් ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා ගිණුම් පවත්වාගෙන යයි. එම ගිණුම්වලට අදාළව බදු ආදායම් ලැබීම්, රාජ්‍ය ගාස්තු සහ අනෙකුත් ලැබීම් රජයේ ගිණුම්වලට බැර කිරීමත් වැටුප් ගෙවීම්, විශ්‍රාම වැටුප්, සුභසාධන හා ණය සේවා ගෙවීම් සහ අනෙකුත් රාජ්‍ය වියදම් සඳහා අරමුදල් ගෙවීමත් ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සිදු කරයි.

**(ආ) රජයේ ගෙවීම් හා පියවීම් සිදුකිරීම**

රජය විසින් නිකුත් කරනු ලබන ගෙවීම් උපදෙස් බැංකු පද්ධතිය වෙත යොමු කර එම ගෙවීම් තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ කුඩා පරිමාණ ගනුදෙනු සිදුකරන ගෙවීම් පද්ධති හරහා පියවීමට මහ බැංකුව පහසුකම් සපයයි. මේ අනුව ඉහළ වටිනාකම් සහිත රජයේ ගෙවීම් සහ විශාල සංඛ්‍යාවකින් යුත් කුඩා පරිමාණ ගනුදෙනු ආරක්ෂිතව පියවීමට මෙමගින් පහසුකම් සලසා ඇත. ඒ අනුව, රජයේ ආදායම් හුවමාරු කිරීම, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතන වෙත සිදුකරන ගෙවීම්, වැටුප්, විශ්‍රාම වැටුප් සහ සමාජ සුභසාධන ගෙවීම්, රජයේ සැපයුම්කරුවන්ට කොන්ත්‍රාත්කරුවන්ට සිදු කරන ගෙවීම්, ප්‍රධාන හා සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළ හුවමාරු කිරීම්, ජාත්‍යන්තර සංවිධාන වලට ගෙවිය යුතු ගෙවීම් සහ විදේශීය ණය ලැබීම් සහ ණය ගෙවීම් වැනි ගනුදෙනු සඳහා මහ බැංකුව රජය වෙනුවෙන් පහසුකම් සලසා දෙනු ලබයි.

**(ඇ) රාජ්‍ය මුදල් ප්‍රවාහ කළමනාකරණයට සහාය වීම**

රජයේ දෛනික ආදායම් හා වියදම් පිළිබඳව තොරතුරු බැංකු පද්ධතියේ ද්‍රවශීලතාව ඇස්තමේන්තු කිරීම සඳහා මහ බැංකුවට උපකාරී වේ. රජය විසින් ඉහළ වටිනාකමක් සහිත ගෙවීමක් සිදුකළ විට බැංකු පද්ධතියේ ද්‍රවශීලතාව පහළ යා හැකිය. එබැවින් රජයේ මුදල් ප්‍රවාහ කළමනාකරණය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාවය සහ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සමග සමීපව සම්බන්ධ වන බැවින් මහ බැංකුව ඒ සම්බන්ධව සමීපව අධීක්ෂණය කොට පහසුකම් සපයයි.

### (ඈ) රජය වෙත තාවකාලික අත්තිකාරම් ලබාදීම

තාවකාලික අත්තිකාරම් (Provisional Advances) යනු මූල්‍ය වර්ෂයක් ආරම්භයේ දී රජයට ඇතිවන තාවකාලික මුදල් ප්‍රවාහ අවශ්‍යතා පියවා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජයට සෘජුවම ලබාදෙන කෙටිකාලීන ණය පහසුකමකි. ඒ අනුව, මහ බැංකු පනතේ 127 වැනි වගන්ති යටතේ වන ප්‍රතිපාදනවලට අනුකූලව, ශ්‍රී ලංකා මහ බැංකුවට රජය වෙත තාවකාලිකව අත්තිකාරම් ලබාදීමට හැකිය. ඒ අනුව මුදල් වර්ෂයේ පළමු මාසය ඇතුළත ඒකාබද්ධ අරමුදලින් දරනු ලැබීමට බලයලත් වියදම් මූල්‍යනය කිරීම සඳහා තාවකාලික අත්තිකාරම් රජය වෙත ලබා දෙනු ලැබේ. එසේ වුවද සෑම අලුත් අත්තිකාරමක්ම මාස 6කට නොවැඩි කාල සීමාවක් තුළ ආපසු ගෙවිය යුතු අතර, ගෙවීමට පවතින මුළු අත්තිකාරම් මුදල 2003 අංක 03 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත යටතේ අමාත්‍යාංශය විසින් පළ කරන ලද අර්ධ වාර්ෂික වාර්තාවේ සඳහන් කරන ලද පූර්ව මුදල් වර්ෂයේ පළමු මාස හතරෙහි ආදායමෙන් සියයට දහයක් නොඉක්මවිය යුතුය.

### "රජයේ බැංකුකරු" ලෙස භූමිකාව

මහ බැංකුවේ අභ්‍යන්තර දෙපාර්තමේන්තු වෙත බැංකු සේවා සැපයීම මගින් ආයතනයේ මූල්‍ය හා පරිපාලන කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් පහසුකම් සැලසේ. දෙපාර්තමේන්තු ගිණුම් පවත්වාගෙන යාම, ලැබීම් හා ගෙවීම් ගිණුම්ගත කිරීම, අභ්‍යන්තර අරමුදල් ආයෝජනය සඳහා පහසුකම් සැලසීම, කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම්, ණය ගෙවීම්, සැපයුම්කරුවන්ට අදාළ ගෙවීම් සිදුකිරීම, ගිණුම් ප්‍රකාශ නිකුත් කිරීම, වාර්තාකරණ කටයුතු සඳහා කාලෝචිත මූල්‍ය තොරතුරු සැපයීම වැනි කාර්යයන් වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් සිදු කරයි. මෙම කාර්යයන් නිවැරදිව, ආරක්ෂිතව සහ නියමිත කාලසීමාවන් තුළ සැපයීම මගින් අභ්‍යන්තර මූල්‍ය පාලනය ශක්තිමත් කිරීම, වගවීම ඉහළ නැංවීම සහ මහ බැංකුවේ සමස්ත මෙහෙයුම් සුමටව පවත්වාගෙන යාම සඳහා සහාය සැලසේ.

ඒ අනුව ඉහත සඳහන් එක් එක් කාර්යභාරයන් ඉටු කිරීම සඳහා මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම් පිළිබඳ සාරාංශයක් පහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

### ප්‍රධාන බැංකුකරු ලෙස ඉටු කරන කාර්යභාරයේ මෑතකාලීන ප්‍රවණතා

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් "රජයේ බැංකුකරු" සහ "බැංකුවල බැංකුකරු" ලෙස ඉටු කරනු ලබන කාර්යභාරය වඩාත් තාක්ෂණික, විනිවිදභාවයෙන් යුතු සහ කාර්යක්ෂමව සිදු කිරීම සඳහා මෑත කාලීන වශයෙන් පියවර ගණනාවක් ගෙන ඇත.

සංඛ්‍යා සටහන 1

**2026 වසරේ දී වෙළඳපොළ මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලැබූ ගිණුම් පිළිබඳ තොරතුරු**

| ගිණුම් වර්ගය | ගිණුම් සංඛ්‍යාව |
|---|---|
| බලපත්‍රලාභී වාණිජ බැංකු | 24 |
| බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් | 08 |
| රජයේ දෙපාර්තමේන්තු | 31 |
| රජයේ ආයතන සහ නියෝජිත ආයතන | 12 |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තුවල ගිණුම් | 38 |
| විදේශීය නියෝජිත ආයතන (වෙළඳපොළ මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව හරහා ක්‍රියාත්මක වන) | 07 |
| **එකතුව** | **120** |

බැංකුවල බැංකුකරු ලෙස ඉටු කරන කාර්යභාරයේ නව ප්‍රවණතා ලෙස ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා රාමුව වැඩිදියුණු කිරීමට මහ බැංකුව කටයුතු කිරීම ප්‍රධාන කරුණක් ලෙස සැලකිය හැකිය. ගෝලීය ප්‍රවණතා සැලකිල්ලට ගෙන ප්‍රධාන ප්‍රතිසංස්කරණ කිහිපයක් සමග නව සංචිත අවශ්‍යතා රාමුව ක්‍රියාත්මක කොට ඇත. ඒ අනුව, අවශ්‍ය සංචිත වඩාත් නිවැරදිව ගණනය කිරීම, දෛනික සංචිත ශේෂ සමීපව අධීක්ෂණය කිරීම සහ සංචිත පවත්වාගෙන යාම සහ මුදල් මෙහෙයුම් අතර සම්බන්ධතාවය ශක්තිමත් කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මීට අමතරව තත්කාලීන දළ පියවුම් පද්ධතිය සහ ලංකා සෙට්ල් (Lanka Settle) පද්ධතිය නවීකරණය කිරීම, ISO 20022 පණිවුඩකරණ ප්‍රමිතිය භාවිතයට ගැනීම, දිනය ඇතුළත ද්‍රවශීලතා කළමනාකරණය සහ සයිබර් ආරක්ෂාව පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම සැලකිය හැක.

රජයේ බැංකුකරු ලෙස ඉටුකරන කාර්යභාරයේ ප්‍රධාන මෑතකාලීන ප්‍රවණතා කිහිපයක් දැකිය හැක. 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් මහ බැංකුවේ ස්වාධීනත්වය ශක්තිමත් කිරීමට කටයුතු කර ඇති අතර ඒ අනුව, රාජ්‍ය මූල්‍යකරණ කටයුතු සඳහා ඍජුව මූල්‍ය පහසුකම් සැපයීම කෙරෙහි දැඩි සීමා පනවා ඇත. ඒ අනුව, එම පනතේ 127 වන වගන්තිය අනුව තාවකාලික අත්තිකාරම් සැපයීම මූල්‍ය වර්ෂයේ පළමු මාසය තුළ ඇතිවන කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා සඳහා පමණක් සීමා කර ඇත. මෑත කාලීනව සිදු වූ තවත් ප්‍රධානතම ආයතනික වෙනස්වීමක් වන්නේ 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය (Public Debt Management Office) පිහිටුවීමයි. තව ද, රජයේ ලැබීම් ඩිජිටල්කරණය කිරීම කෙරෙහි ද මෑතකාලීනව වැඩි අවධානයක් යොමු කොට ඇති අතර Govpay ක්‍රමය ඒ සඳහා හඳුන්වා දෙනු ලැබීය. රාජ්‍ය ගනුදෙනු ක්‍රමයෙන් ආරම්භයේ සිට අවසානය දක්වාම විද්‍යුත් හා ස්වයංක්‍රීයව සැකසෙන ක්‍රියාවලියක් වෙත යොමුවෙමින් පවතින අතර එමගින් ප්‍රධාන අරමුණ වන්නේ රාජ්‍ය ගිණුම්කරණ පද්ධති, භාණ්ඩාගාර පද්ධති, මහ බැංකු ගිණුම් සහ ජාතික ගෙවීම් පද්ධතිය එකිනෙකට ඒකාබද්ධ කිරීමයි. මීට අමතරව රජයේ මුදල් ප්‍රවාහ කළමනාකරණය ශක්තිමත් කිරීම අරමුණු කර ගනිමින් මහ බැංකුව, මහා භාණ්ඩාගාරය, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය සහ අනෙකුත් රාජ්‍ය ආයතන සමග සමීප මෙහෙයුම් සම්බන්ධතාවයක් පවත්වාගෙන යෑම සිදු කරයි. තවද, 2025 වසරේදී, ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වෙමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි ආදායම් පරිපාලන කළමණාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) යටතේ, ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (SLIPS) හා තත්කාලීන දළ පියවුම් පද්ධතිය (RTGS) හරහා එකතු කළ අගය මත බදු (VAT) ආපසු ගෙවීම් සිදු කිරීම සඳහා පහසුකම් සලසන ලදී.

**බැංකුවල බැංකුකරු සහ රජයේ බැංකුකරු ලෙස ඉටුකරන කාර්යභාරයේ ජාත්‍යන්තර අත්දැකීම් සහ ඉදිරි මග**

වර්තමානයේ බොහෝ රටවල මහ බැංකු සාම්ප්‍රදායික මහ බැංකුකරණය ක්‍රියාවලියෙන් ඔබ්බට ගොස් ඩිජිටල් පියවීම් සේවා සපයන්නන් සහ අත්‍යවශ්‍ය මූල්‍ය යටිතල පහසුකම් සපයන්නන් බවට පත් වෙමින් ඇත. උදාහරණ ලෙස ඉන්දියානු සංචිත බැංකුව රජයේ බැංකුකරු ලෙස මධ්‍යම රජයේ හා ප්‍රාන්ත රජයන්ගේ ගිණුම් පවත්වාගෙන යමින් රජයේ ලැබීම් සහ ගෙවීම් සිදු කරයි. මීට අමතරව බැංකුවල බැංකුකරු ලෙස ඉන්දියාවේ ගෙවීම් පද්ධතිය පැය 24 පුරා වසරේ දින 365හිම ක්‍රියාත්මක කරයි. තවද, සිංගප්පූරු මූල්‍ය අධිකාරිය ද මහ බැංකුව රජයේ මූල්‍ය ක්‍රියාකාරිකයා සහ ගෙවීම් පද්ධති මෙහෙයුම්කරු වශයෙන් ඒකාබද්ධව කටයුතු කරන අතර, ඉහත දැක්වූ කාර්යයන්ට අමතරව ස්වයංක්‍රීය ඇපකර කළමනාකරණය, ඩිජිටල් මුදල් කළමනාකරණය හා දේශසීමා හරහා සිදු කරන පියවීම්වල ද නිරත වෙයි. එංගලන්ත මහ බැංකුව ද එරටෙහි ගෙවීම් පද්ධති මෙහෙයුම්කරු ලෙස කටයුතු කරන සාමාන්‍ය පියවීම් පද්ධතියෙන් ඔබ්බට ගොස් සමූහ ගිණුම් හෙවත් Omnibus Accounts හඳුන්වා දී ඇත. මෙමගින් අනුමත ගෙවීම් පද්ධති මෙහෙයුම්කරුවෙකුට තම පද්ධතිය හරහා සිදුකරන ගනුදෙනු සඳහා සහාය වීමට තත්කාලීන දළ පියවුම් පද්ධතියේ සහභාගීවන්නන්ගේ ඒකාබද්ධ අරමුදල් භාවිත කළ හැකිය. ඒ අනුව, රජයේ බැංකුකරුගේ කාර්යභාරය තුළ නව ජාත්‍යන්තර ප්‍රවණතා ලෙස රාජ්‍ය ණය කළමනාකරණය මුදල් ප්‍රතිපත්තියෙන් වෙන් කිරීම, මහ බැංකු ගිණුම් භාණ්ඩාගාර පද්ධති සමග ඒකාබද්ධ කිරීම, රජයේ මුදල් තත්කාලීනව අධීක්ෂණය කිරීම, ස්වයංක්‍රීය ගිණුම් සැසඳීම, රජයේ ගෙවීම් ආරම්භයේ සිට අවසානය දක්වාම ස්වයංක්‍රීයව සැකසීම, රජයේ

මුදල් ප්‍රවාහ පුරෝකථනය ශක්තිමත් කිරීම සහ වගවීම හා විනිවිදභාවය ඇති කිරීම හඳුනාගත හැකිය. තව ද, බැංකුවල බැංකුකරුගේ කාර්ය සැලකීමේ දී දිනකට පැය 24 පුරා හෝ දීර්ඝ වේලාවක් පියවීම් සිදු කිරීම, ස්වයංක්‍රීය ද්‍රවශීලතා පහසුකම් හඳුන්වා දීම, සයිබර් ආරක්ෂාව තහවුරු කිරීම, මුදල් සුරැකුම්පත් සහ ඇපකර කළමනාකරණය ඒකාබද්ධ කිරීම සහ මහ බැංකු ඩිජිටල් මුදල් හඳුන්වා දීම මෑතකාලීන ප්‍රවණතා ලෙස හඳුන්වා දිය හැකිය.

ශ්‍රී ලංකා මහ බැංකුව ද සිය බැංකුකරු කාර්යභාරය ඉටු කිරීමේ දී ජාත්‍යන්තර අත්දැකීම් අධ්‍යයනය කරමින් ඒවා භාවිතයට ගැනීම අරමුණු කරයි. කෙසේ වුවද, මෙම නවෝත්පාදනවල වේගවත් ව්‍යාප්තිය සාම්ප්‍රදායික නියාමන හා අධීක්ෂණ රාමු සඳහා සැලකිය යුතු අභියෝග රැසක් මතු කරන බැවින් නව තාක්ෂණික සේවා සහ විවිධ ගෙවීම් පද්ධති හඳුන්වා දීම ක්‍රමානුකූලව සිදු කිරීමට මහ බැංකුව කටයුතු කරයි.

රජයේ මූල්‍ය තොරතුරු විවිධ ආයතන හා බැංකු අතර විසිරී පැවතීම හේතුවෙන් සමස්ත මූල්‍ය තත්ත්වය තත්කාලීනව තක්සේරු කිරීම සහ මුදල් ප්‍රවාහ කළමනාකරණය කිරීම අභියෝගාත්මක වී ඇත. එබැවින්, භාණ්ඩාගාර ඒකීය ගිණුම් (TSA) ආකෘතිය ශක්තිමත් කර අදාළ සියලු ආයතන සම්බන්ධ කරන ඒකාබද්ධ රාජ්‍ය බැංකුකරණ හා මුදල් කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම වැදගත් වේ. තත්කාලීන දත්ත පුවරු, ස්වයංක්‍රීය ගිණුම් සැසඳීම් සහ ඒකාබද්ධ ඇපකර කළමනාකරණ පද්ධති හඳුන්වාදීම මගින් ද්‍රවශීලතා කළමනාකරණය, විනිවිදභාවය, වගවීම සහ රාජ්‍ය සම්පත් භාවිතයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කළ හැකිය.

**සමෝධානය**

ශ්‍රී ලංකා මහ බැංකුව බැංකුවල බැංකුකරු සහ රජයේ බැංකුකරු ලෙස ඉටු කරන කාර්යභාරය, රටේ ගෙවීම් හා පියවීම් පද්ධතියේ ආරක්ෂාව, කාර්යක්ෂමතාව සහ විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා අත්‍යවශ්‍ය වන අතර මූල්‍ය හා සාර්ව ආර්ථික ස්ථායිතාවට සුවිශේෂී දායකත්වයක් සපයයි.

කෙසේ වෙතත්, ඩිජිටල් ගෙවීම්, නව මූල්‍ය තාක්ෂණයන් සහ සයිබර් අවදානම් වේගයෙන් වර්ධනය වන පසුබිමක, මෙම කාර්යභාරය අඛණ්ඩව නවීකරණය කිරීම අවශ්‍ය වේ. ඒ සඳහා ගෙවීම් හා පියවීම් යටිතල පහසුකම් නවීකරණය කිරීම, අදාළ නියාමන රාමු ශක්තිමත් කිරීම, පද්ධති නවීකරණය වැනි වැඩිදියුණු කිරීම් වැදගත් වේ. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව, මහා භාණ්ඩාගාරය, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය, අනෙකුත් රාජ්‍ය ආයතන සහ වාණිජ බැංකු අතර ශක්තිමත් සම්බන්ධීකරණයක් ඇති කිරීම මගින් වඩාත් ආරක්ෂිත, කාර්යක්ෂම, විනිවිදභාවයෙන් යුතු සහ අනාගතයට ගැලපෙන ජාතික ගෙවීම් හා පියවීම් පද්ධතියක් ගොඩනැගිය හැකි වනු ඇත.

**මූලාශ්‍ර**


Central Bank of Sri Lanka (2023), Central Bank of Sri Lanka Act No. 16 of 2023, Central Bank of Sri Lanka.

Parliament of the Democratic Socialist Republic of Sri Lanka (2005), Payment and Settlement Systems Act No. 28 of 2005, Government of Sri Lanka.

Central Bank of Sri Lanka (2025), Annual Economic Review 2024, Central Bank of Sri Lanka.

Central Bank of Sri Lanka (2026), Statutory Reserve Requirements Rules and Operating Instructions, Central Bank of Sri Lanka.

Reserve Bank of India (n.d.), RBI as Banker to Government, Reserve Bank of India.

Monetary Authority of Singapore (n.d.), MAS Electronic Payment System, Monetary Authority of Singapore.

Government of Sri Lanka (2025), GovPay: Digital Payment Platform for Government Services.




# රුපියලේ වංශකථාව

**ශ්‍රී ලංකාවේ භාවිත ව්‍යවහාර මුදලේ ආරම්භයේ සිට වර්තමානය දක්වා ඉතිහාසය පිළිබඳ මූලික හැඳින්වීමක් ලබාදීම මෙම කෘතියේ අරමුණයි.**

විෂය කරුණු වඩාත් පහසුවෙන් අවබෝධ කර ගැනීම සඳහා ඓතිහාසික සිද්ධි හා තෝරාගත් කාසි හා මුදල් නෝට්ටුවල වර්ණ ඡායාරූප සමූහයක් මෙම කෘතියට ඇතුළත් කර ඇත.

රු. 2200.00



**whatsapp මගින් ද ඇණවුම් කළ හැකිය.**

**077 583 2793**

**කර්තෘ** ආර්. ඩී. අරුණ ශාන්ත,
කෞතුකාගාර පාලක,
ශ්‍රී ලංකා ආර්ථික ඉතිහාස කෞතුකාගාරය,
ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA